ශ්‍රී ලංකා
මහජන උපයෝගිතා කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව 2015

අන්තර්ගතය

කොමිෂන් සභාව	1
සංස්ථානික තොරතුරු	2
කොමිෂන් සභාවේ සාමාජිකයින්	3
සභාපතිතුමාගේ ප්‍රකාශය	4
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය	5
අපගේ ඉදිරි ගමන; කොමිෂන් සභාවේ උපායමාර්ගික දිශාව	6
අපගේ දැක්ම	6
අපගේ මෙහෙවර	6
කාර්යයන්	7
පරමාර්ථ	8
අපගේ මූලික සාරධර්ම	9
දිගු කාලීන ඉලක්ක සපුරාලීමේ ක්‍රියාකාරකම්	10
විදුලිබල පාරිභෝගිකයා	13
මහජන උපදේශන	18
විදුලිබල ආරක්ෂාව	21
රෙගුලාසි/රීති/ක්‍රියාපටිපාටීන්/සංග්‍රහ/ ක්‍රමවේද/ මාර්ගෝපදේශ	24
අයක්‍රම, සේවා ගාස්තු සහ ආර්ථික කටයුතු	27
විදුලිබලය, සැපයුම සහ සේවා ගුණාත්මකභාවය	31
බලපත්‍රලබා ගැනීම	33
වෙනත් ක්‍රියාකාරකම්	36
ඛණිජ තෙල් කර්මාන්තය	37
මානව සම්පත්	39
වාර්ෂික සැලැස්ම - 2016	40
විගණකාධිපති වාර්තාව	50
විගණකාධිපති වාර්තාව සඳහා ප්‍රතිචාර දැක්වීම	56
විගණන කමිටු වාර්තාව	60
මූල්‍ය ප්‍රකාශන 2015	62

මූල්‍ය ප්‍රකාශන 2015

වගුව 01 : විදුලි සැර වැදීම් සංඛ්‍යාව (වාර්ෂික පදනම)	22
වගුව 02 : කාල පාදක ගාස්තු ක්‍රමය	27
වගුව 03 : 2015 වසරේ දී නිකුත් කළ උත්පාදන බලපත්‍ර සංඛ්‍යාව	33
වගුව 04 : 2015 වර්ෂයේ වාර්ෂික උත්පාදන සංඛ්‍යා	34
වගුව 06 : සමස්ත අලෙවි දත්ත	37

ප්‍රස්තාර

විසඳන ලද පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව	15
ප්‍රස්තාරය 01 : විදුලි සැර වැදීම් සංඛ්‍යාව (වාර්ෂිකව)	22
ප්‍රස්ථාරය 02 : විදුලි බලය උත්පාදන ක්‍රම - 2015 මුල් අර්ධය	35
ප්‍රස්ථාරය 03 : ලිහිසි තෙල් අලෙවි දත්ත	37
ප්‍රස්ථාරය 04 : ලිහිසි තෙල් අලෙවිය	38
ප්‍රස්ථාරය 05 : ලිහිසි තෙල් අලෙවි ආදායම - 2015	38

කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිෂන් සභාව) විදුලිබල කර්මාන්තයේ ආර්ථිකය, ආරක්ෂක හා තාක්ෂණික නියාමනය සඳහා වගකිය යුතු ආයතනය වශයෙන් ජාතික ආර්ථිකය තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර ලිහිසි තෙල් වෙළඳපොළේ ඡායා නියාමක වශයෙන් ද කටයුතු කරයි.

අපි විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, සැපයුම සහ භාවිතය නියාමනය කරන්නෙමු.
අපගෙන් ඉටුවන ඉතා වැදගත් සේවාවන් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය තුළ ප්‍රමාණවත් ආයෝජන, එම සේවා ලබා ගැනීම සඳහා වූ වැඩි ඉඩප්‍රස්ථා, කාර්යක්ෂම සැපයුමක් සහ විදුලිබල පාරිභෝගිකයින් සඳහා ඉහළ ගුණාත්මකභාවයක සේවාවක් ඇති බවට තහවුරු කිරීම කොමිෂන් සභාව මගින් ඉටු වේ.

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිබල අංශය නියාමනය කිරීම සඳහා ස්ථාපිත කළ ආයතනය වේ.

කොමිෂන් සභාවේ අරමුණු, කාර්යයන් සහ නෛතික රාමුව 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යටතේ අර්ථ දක්වා ඇත.

එමෙන්ම පනත හරහා ජල සේවා කර්මාන්තය සහ ඛනිජතෙල් කර්මාන්තය නියාමනය සඳහා ද කොමිෂන් සභාවට බලය පවරා ඇත. එම අංශ දෙක නියාමනය කිරීම සඳහා වූ පනත් පාර්ලිමේන්තුව මගින් ඉදිරියේ දී සම්මත කර ගැනීමට නියමිතය.

2003 වසරේ දී කොමිෂන් සභාවේ ප්‍රථම කොමසාරිස්වරුන් සහ අධ්‍යක්ෂ ජනරාල්වයා පත් කිරීමත් සමග කොමිෂන් සභාවේ කටයුතු ආරම්භ විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය ඇතිව ප්‍රතිපත්ති සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් පස්දෙනෙක්ගෙන් සමන්විත කොමිෂන් සභාව පත් කරනු ලැබේ.

2015 වසරේ අයවැය රජය ඛනිජතෙල් සහ ජල සේවා කර්මාන්ත නියාමනය පිළිබඳ සිය ප්‍රතිපත්තිය නිවේදනය කළ අතර ඒ අනුව එම කර්මාන්ත නියාමනය සඳහාද කොමිෂන් සභාවට බලය පැවරීමට අවශ්‍ය නෛතික පදනම ස්ථාපනය කරන කිරීමට නියමිතය.

■ අයවැය - 2015

390. “ස්වාධීන **SOEs** ගොඩනගා ගැනීමේ දී ශක්තිමත් නියාමන යාන්ත්‍රණයක් තිබීම ඉතා වැදගත් වන බවට හඳුනා ගනිමින්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය **(NWSDB)** සහ ලංකා ඛණිජතෙල් සංස්ථාව **(CPC)** යන ආයතන දෙක ඇතුලත් කිරීම මගින් පිරිවැය නිරූපිත පාරාදෘශ මිල යාන්ත්‍රණයක් ඇති කිරීම තුළින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන බලතල **(PUCSL)** පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා රජය විසින් නෛතික බලය ලබා දෙනු ඇත.

ඒ අනුව, කොමිෂන් සභාව මගින් ඛණිජ තෙල් කර්මාන්තය හා ජල සේවා කර්මාන්තයට අදාළ පනත පාර්ලිමේන්තුවේ දී සම්මත වූ සැනින් එම අංශය නියාමනය සඳහා පියවර ගැනීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික අදියරේ වැඩකටයුතතු ආරම්භ කර ඇත.

සංස්ථානික තොරතුරු

කොමිෂන් සභාවේ නම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

නෛතික තත්ත්වය

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කර ඇත.

2015 වසර තුළ කොමිෂන් සභාවේ සාමාජිකයින්

නීතිඥ සාලිය මැතිව් මහතා - සභාපති

නීතිඥ සංජය ගමගේ මහතා - නියෝජ්‍ය සභාපති

මහාචාර්ය රාහුල අතලගේ මහතා - සාමාජික

ප්‍රසාද් ගල්හේන මහතා - සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්

දමිත කුමාරසිංහ මහතා

කොමිෂන් සභාවේ ලේකම්

ජානකී එම් විතානගම මහත්මිය

ලියාපදිංචි කාර්යාලය

6වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, ශා. මයිකල් පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල: **info@pucsl.gov.lk**

දුරකථනය: **+9411 239 2607/8**

ෆැක්ස්: **+9411 239 2641**

වෙබ් අඩවිය: **www.pucsl.gov.lk**

විගණකවරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව, පොල්දූව පාර, බත්තරමුල්ල.

බැංකුකරු

ලංකා බැංකුව

1වන සහ 2වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ,

අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ.

කොමිෂන් සභාවේ සාමාජිකයින්

නීතිඥ සාලිය මැතිව් මහතා
සභාපති

නීතිඥ සංජය ගමගේ මහතා
නියෝජ්‍ය සභාපති

මහාචාර්ය රාහුල අතලගේ
සාමාජික

ප්‍රසාද් ගල්හේන මහතා
සාමාජික

සභාපතිතුමාගේ ප්‍රකාශය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 2015 වසර තුළ දී දිවයිනේ විදුලිබල අංශයේ සමස්ත සංවර්ධනය වෙනුවෙන් තිරසාර වැඩකටයුතු රාශියක් ඉටු කිරීමට සමත්විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය තරඟකාරී පරිසරයක් ඇති ආර්ථික වශයෙන් ශක්තිමත් අංශයක් ලෙස ක්‍රමිකව පරිවර්තනයවීමෙන් සුවිශේෂී අත්දැකීම විඳීමට ආසන්නව ඇත.

විදුලිබල ප්‍රවාහයන් මුදල් ප්‍රවාහයන් බවට පරිවර්තනය කරනු ලබන්නේ බෙදාහැරීම තුළින් වන බැවින් ඕනෑම කර්මාන්තයක් සේම විදුලිබල සම්පාදනයේ දී පවා සේවාදායක අතුරුමුහුණත නැතහොත් බෙදාහැරීමේ අංශය ව්‍යාපාරය තුළ ඉතාම වැදගත් අංගය වන බවට මම දැඩිව විශ්වාස කරමි. එබැවින් විදුලිබල උපයෝගිතාවන්ගේ දීර්ඝ කාලීන තිරසාරකත්වය තහවුරු කර ගැනීම සඳහා බෙදාහැරීමේ අංශයේ කාර්යසාධනය ඉතාමත්ම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

අලාභ අවම කිරීම, ඵලදායී ලෙස ඉහළ එක්රැස් කිරීමේ කාර්යක්ෂමතාව සහ වැඩි දියුණු කළ පාරිභෝගික සත්කාරය හරහා බෙදාහැරීමේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අපගේ මූලික අවධානය යොමු වන්නේ මෙවැනි සංදර්භයක් තුළ දීය.

එබැවින් විදුලිබල අංශය සඳහා උසස් තාක්ෂණික මැදිහත්වීම් මගින් නියාමන කාර්යන් හඳුන්වාදීමට උත්සාහ කළ යුත්තෙමු.

බලශක්ති අංශය ඕනෑම ආර්ථිකයක සංවර්ධනයේ නියමුවා වන අතර බලශක්ති අංශයේ තත්ත්වය ආර්ථිකයේ තත්ත්වය බොහෝ විට නිවැරදිව නිරූපණය කරන්නකි. එබැවින් අප වෙත පැවරී ඇති මෙම ඉතා වැදගත් සාමාජීය සහ ආර්ථික වගකීම අප හඳුනා ගත යුතු වන අතරම ඉදිරි දියුණුව වෙනුවෙන් රට ගෙනයාමට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගත යුතුය.



සාලිය බී මැතිව්
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

විදුලිබල නියාමකයා ලෙස කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2015 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මට අතිශයින් සතුටට පත් වෙමි.
එමගින් 2015 වසර සඳහා වූ අපගේ වැඩකටයුතු විස්තර කරන අතර දර්ශක රාශියක් ඔස්සේ අපගේ කාර්යසාධනය පිළිබඳව අදහස් දක්වයි. එමගින් අපගේ වැඩකටයුතු සහ ආයතනය පිළිබඳව වැඩි පාරදෘශ්‍යභාවයක් ද ලබා දෙනු ලැබේ.

බලශක්ති සේවා වැදගත් වෙනස්කම් රාශියකට මුහුණ දෙමින් ඇත. සාධාරණ මිල ගණන් යටතේ විදුලිබල පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා සාම්ප්‍රදායක බලශක්ති වෙළඳපොළවල් සහ සේවාවලට ඇති හැකියාව සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇති කණස්සල්ල මෙම වෙනස්කම් බොහොමයක් සඳහා හේතු වී ඇත. කැපී පෙනෙන මිල වැඩි කිරීම් සහ සමාලෝචන හා ප්‍රතිසංස්කරණ හඳුන්වාදුන් බැරෑරුම් කාලපරිච්ඡේදයකින් පසුව ප්‍රජාව අප එනම් බලශක්ති ව්‍යාපාරය සහ රජය ඒවායේ ප්‍රතිඵල නෙළාගන්නා තෙක් බලා සිටිති. මෙම අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම 2015 වසර තුළ අපගේ වැඩකටයුතුවල මූලික ඉලක්කය විය.

2015 වර්ෂය සඳහා වූ අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන් බලපත්‍රලාභීන්ගේ ආර්ථික, තාක්ෂණික සහ ආරක්ෂන රෙගුලාසි වැඩිදියුණු කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පාරිභෝගිකයින්ගේ සහභාගීත්වය ඉලක්ක කර ගත්තේය. අපි 2015 වසර තුළ දී සියලුම තීරණ ගැනීම්වල දී සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී මෙම ඉලක්කයට අනුව කටුයුතු කළෙමු.

මෙම වසරේ දී අපි මහජනතාව සඳහා වූ ආරක්ෂක දැනුවත් කිරීමේ ව්‍යාපාර පුළුල් කළ අතර විදුලිබල වෙළඳපොළේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මූලාරම්භයන් රාශියක්ම යෝජනා කළෙමු.

කාර්යබහුල වේලාවල දී විදුලිබල පරිභෝජනය අවම කර ගැනීම තුළින් බලශක්ති පිරිවැය ඉතිරි කර ගැනීම සඳහා පාරිභෝගිකයින් සවිබලගැන්වීම වෙනුවෙන් වූ සංශෝධන සඳහා අපි අඛණ්ඩව සහභාගී වූයෙමි. එමෙන්ම අපි අපගේ නියාමන ප්‍රවේශය සඳහා පාරිභෝගික නියෝජනයන් ඇතුලත් කර ගැනීමේ නව ක්‍රම ගොඩනගන ලද අතර අපගේ ජාල තීරණවල දී පාරිභෝගික අදහස් සඳහා නාලිකා ඇතුලත් කර ඇත.

විදුලිබල අංශයේ ඇති ගැටළු විසඳීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති සැපයුම්කරුගේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාවට ඉලක්ක 12ක අපේක්ෂා සහිත සැලැස්මක් තිබේ. ඒ අනුව 2020 වසරේ දී අත්කර ගැනීමට අපේක්ෂා කරනු ලබන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා 2015 වසරේ දී ඉටු කිරීමට නියමිත ව්‍යාපෘති ඇතුලත් 2015 වසර සඳහා වූ ක්‍රියාකාරකම් සැලැස්ම කොමිෂන් සභාව සතු වේ. බලපත්‍රලාභීන්ට සිදු වන අලාභය අවම කිරීමට උපකාර වන සහ පාරිභෝගිකයින් සඳහා තෘප්තිමත් සේවාවක් සපයන විදුලිබලය, සැපයුම සහ සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා උපායමාර්ගික සැලැසුමක් සකස් කරන ලදී.

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

අපගේ ඉදිරි ගමන;
කොමිෂන් සභාවේ උපායමාර්ගික දිශාව

අපගේ උපායමාර්ගික දිශාව සෑම විදුලිබල පාරිභෝගිකයෙක් සම්බන්ධයෙන්ම ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා වූ ස්වාධීන නියාමනය සඳහා වේ.

අපගේ දැක්ම, මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් නියාමනය හරහා පාරිභෝගිකයින් සඳහා වඩාත් වාසිදායක ප්‍රතිඵල ලබා ගැනීම එයින් අදහස් වේ. ස්වාධීන නියාමනය යන්නට රීති හා නියෝග සකස් කිරීම සහ පැණවීම පමණක් ඇතුලත් නොවන බවට හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. පාරිභෝගිකයින්ගේ සහභාගීත්වය සහ සමාගම්වල ආයෝජනය තුළින් අපගේ වැඩකටයුතු සම්බන්ධයෙන් විශ්වාසය සහ පැහැදීම ගොඩනගා ගැනීම ද එයට ඇතුලත් වේ. එමෙන්ම අත්‍යවශ්‍ය සේවාවකින් ජනතාව අපේක්ෂා කරන ප්‍රමිති සකස් කිරීමේ සහ ඒවා බලාත්මක කිරීමේ අනිවාර්ය කාර්යභාරයක් ද අප සතුය.

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ සියලුම වාසිකයින් සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා දායක වන සියලුම පාර්ශ්වයන් සඳහා දිවයිනේ තිරසාර සංවර්ධන සැලැස්මේ සීමාවන් ඇතුලත අත්‍යවශ්‍ය යටිතලපහසුකම් සහ උපයෝගීතා සේවාවන් සම්බන්ධයෙන් ඉහළම ප්‍රමිතියෙන් යුත් පිරිමැසුම්දායක ආකාරයක ප්‍රවේශයක් ඇති පරිසරයක් නිර්මාණය කිරීම.

අපගේ මෙහෙවර

දැනට සිටින පාරිභෝගිකයින් මෙන්ම අනාගත පාරිභෝගිකයින් ද සඳහා ඉහළම සාධාරණ සහ තිරසාර ආකාරයක ආරක්ෂිත, විශ්වාසදායක සහ සාධාරණ මිලකරණයකින් යුත් යටිතලපහසුකම් සේවාවන් සහතික කිරීම සඳහා සියලුම උපයෝගිතාවන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ විෂයසීමාව ඇතුලත නියාමනය කිරීම.

කාර්යයන්

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන් පහත දැක්වේ,

(අ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත හෝ වෙනත් කර්මාන්ත පනතක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල, කාර්යයන් හා යුතුකම් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම සහ කිරීම.

(ආ) කොමිෂන් සභාවේ තීරණවලින් බලපෑමක්වීමට ඉඩ ඇති යම් තැනැත්තෙක් හෝ කණ්ඩායමක් සමග උචිත යයි කොමිෂන් සභාව සලකන ප්‍රමාණයට සාකච්ඡා කිරීම

(ඇ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ විෂයපථය ඇතුලත් වන යම් කර්මාන්තයක් පිළිබඳ සියලුම කාරණා සම්බන්ධයෙන් යෝග්‍ය යි කොමිෂන් සභාව සලකන පරිදි ආණ්ඩුවට උපදෙස්දීම

(ඈ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 15 (4) වගන්තියට යටත්ව කවර හෝ මහජන උපයෝගිතා කර්මාන්තවලට අදාළ තොරතුරු රැස් කිරීම, වාර්තාගත කිරීම සහ ව්‍යාප්ත කිරීම

(ඉ) කොමිෂන් සභාවේ කර්තව්‍ය පාලනය වන යහපත් පරිචයක් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයක් ඇතුළත් නියාමන අත්පොතක් එය පිහිටුවා මාස හයක් ඇතුලත සකස් කර අවශ්‍ය අවස්ථාවල දී අවශ්‍ය පරිදි එය සංශෝධනය කිරීම

(ඊ) යම් කර්මාන්ත පනත්වල සලසා තිබෙන සියලුම කාරණා සම්බන්ධ බලපත්‍රදීමේ, විධිමත් කිරීමේ හා පරීක්ෂණ පැවැත්වීමේ කාර්යයන් ඉටු කිරීම

(උ) යම් කර්මාන්ත පනතක අධිකාරිය යටතේ බලපත්‍රවල, කොන්ත්‍රාත්තුවල සහ වෙනත් සාධන පත්‍රවල විධිවිධාන බලාත්මක කිරීම

(ඌ) යම් කර්මාන්ත පනතකින් නියම කරන අවස්ථාවල දී නියාමනය කළ අස්ථිත්ව විසින් අය කරන තීරු ගාස්තු සහ වෙනත් ගාස්තු විධිමත් කිරීම

(එ) යම් මහජන උපයෝගිතා කර්මාන්තයක උද්ගතවන ආරාවුල් මැදිහත්වීමෙන් නිශ්චය කිරීම

(ඒ) මහජන උපයෝගිතා කර්මාන්තවල ආරක්ෂාව, තත්ත්වය, අඛණ්ඩ පැවැත්ම හා විශ්වාසනීයත්වය පිළිබඳ තාක්ෂණික හා වෙනත් ප්‍රමිති නියම කර බලාත්මක කිරීම

(ඔ) කොමිෂන් සභාවේ කිසියම් කර්තව්‍යයක් සාර්ථකව ඉටු කිරීම සඳහා යෝග්‍ය බව කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය හැකි වෙනත් යම් ආනුෂංගික හෝ උපයෝගී ක්‍රියාකාරකම් කිරීම

පරමාර්ථ

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා කොමිෂන් සභාව මගින් ඉහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ. මෙම අරමුණු පහතින් හඳුනා ගනී,

(අ) සියලුම පාරිභෝගිකයින්ගේ අයිතිය ආරක්ෂා කිරීම

(ආ) තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම

(ඇ) මහජන උපයෝගිතා කර්මාන්තවල ක්‍රියාකාරීත්වය සහ ප්‍රාග්ධන ආයෝජන යන දෙකෙහිම කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම

(ඈ) මහජන උපයෝගිතා කර්මාන්තවලට සම්පත් කාර්යක්ෂමව වෙන්කර දීම ප්‍රවර්ධනය කිරීම

(ඉ) මහජන උපයෝගිතා කර්මාන්තවල ආරක්ෂාකාරීත්වය සහ සේවාවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම

(ඊ) හැකි අවස්ථාවල දී, ජාත්‍යන්තර ප්‍රමිතිවලට ප්‍රතිපාර්ශ්වික උපයෝගීතා සේවා මංසලකුණු කිරීම, සහ

(උ) මිල පාලිත අස්ථිත්වවලට ඔවුන්ගේ මහජන උපයෝගිතා කර්මාන්ත සඳහා මුදල් සපයා ගැනීමෙහිලා අයථා දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදු නොවන බවට වගබලා ගැනීම.

අපගේ මූලික සාරධර්ම

සාධාරණත්වය

අපි අපගේ අරමුණු, යුතුකම් සහ කාර්යයන් සැලකිල්ලට ගනිමින් පොදුවේ පිළිගත් යහපත් පරිචයන්ට අනුකූල වන ආකාරයකින් තීරණ ගන්නෙමු.

අපක්ෂපාතීත්වය

අපි අපගේ සියලුම නෛතික බැඳියාවන් සැලකිල්ලට ගනිමින් අපට ලැබෙන සියලුම අදහස්, විවේචන පැමිණිලි සහ අපට අදාළ සියලුම ගැටළු අපක්ෂපාතී ආකාරයකින් විසඳන්නෙමු.

ස්වාධීනත්වය

අපගේ තීරණ අනිසි බලපෑමෙන් තොර වේ.

කාලානුරූපීබව

ප්‍රමාදය මූල්‍යමය පාඩු වැඩකටයුතුවල නිරර්ථකභාවයට මුල් වන බවට අපි පිළිගනිමු. අපි මතු වන ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් හැකි වහාම ප්‍රතිචාර දක්වන්නට උත්සාහ කරන්නෙමු.

විනිවිදභාවය

අපි රහස්‍යභාවය හෝ නෛතික සීමාවන්වලින් නොවළක්වන්නේ නම් මිස සාමාන්‍යයෙන් සියලුම සාක්ෂි, තීරණ සහ අදාළ ලේඛණ සියල්ල ප්‍රකාශයට පත් කරන්නෙමු. සලකා බලන කාර්යපටිපාටීන් සහ ගැටළු සම්බන්ධයෙන් සියලුම පාර්ශ්වකරුවන්ට දැනුම් දෙන්නෙමු. අපගේ ක්‍රියාකාරකම් සහ ඒවායේ පිරිවැය විස්තර ඇතුලත් වාර්තාවක් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන්නෙමු.

විෂයමූලිකත්වය

අපි ප්‍රතිපත්ති, නෛතික සහ අධිකරණ තීණ්දු ගැනීම්වල දක්වා ඇති පරිදි සෑම තර්කයක්ම එහි හරය, සාක්ෂි සහ මාර්ගෝපදේශ පදනම්ව සලකා බලන්නෙමු.

අනුරූපතාව

අපි අදාළ ව්‍යවස්ථා යටතේ වූ අපගේ නෛතික බැඳියාවන්ට අනුකූල වන තීරණ ගොඩනගන අතර, පූර්ව "සමාන කරුණු ඇති" තීණ්දු ගැනීම්වල දී භාවිතා කළ සමාන ප්‍රවේශයම, එවැන්නක් උපකාරී වන බවට අපට විශ්වාස කළ හැකි අවස්ථාවල දී අනුගමනය කරන්නට උත්සාහ කරන්නෙමු.

මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පාරිභෝගිකයින්, අපි විසින් ඉටු කරන සියලුම කාර්යයන්ගේ කේන්ද්‍රය වන බවට විශ්වාස කරමු. අපි සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන පාරිභෝගික ප්‍රතිඵල අලුතින් හඳුන්වා දුන් අපගේ 2020 ඉලක්කවල පැහැදිලිව හඳුනා ගෙන ඇත.

දිගු කාලීන ඉලක්ක සපුරාලීමේ ක්‍රියාකාරකම්

කොමිෂන් සභාව විදුලිබල අංශය සඳහා දීර්ඝ කාලීන ඉලක්ක දොළහක් සකස් කර ඇත. අදාළ ඉලක්කගත වර්ෂය වන විට මෙම ඉලක්ක ඉටු කර ගැනීමේ පියවර වෙනුවෙන් 2015 වසර තුළ දී ක්‍රියාකාරකම් 35ක් සිදු කර ඇත. මෙම ක්‍රියාකාරකම්වල විස්තර 2015 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මේ දක්වා ඇත. 2015 සැප්තැම්බර් මස 30 දි වන විට මෙම ක්‍රියාකාරකම් වැඩි ප්‍රමාණයක භෞතික ප්‍රගතිය 80%කට වැඩි වේ. 2015 වර්ෂය සඳහා වූ සමස්ත අයවැය රුපියල් මිලියන 247.6කි.

විදුලිබලයේ ගුණාත්මකභාවය

1 වැනි ඉලක්කය: 230 වෝල්ට් සැපයුම සඳහා 6%ක ප්‍රතිශතයක විචලතා පරාසයක් හා සංඛ්‍යාතය සම්බන්ධයෙන් හර්ට්ස් 50 මට්ටමේ සිට 0.5%ක සංඛ්‍යාත හා සුසරන පරාසයකින් යුත් විදුලිබල සැපයුමක් සහතික කිරීම.

විදුලිබල කර්මාන්තයේ නියාමකයා වන කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභීන් පාරිභෝගිකයින්ට සපයන විදුලිබල සැපයුමේ ගුණාත්මකභාවය සහතික කළ යුතුය. මෙම ඉලක්කය ඉටු කර ගනු වස් 2015 වසර තුළ දී පහත දැක්වෙන ක්‍රියාකාරකම් ඉටු කරන ලදී.

සැපයුමෙහි ගුණාත්මකභාවය

2 වැනි ඉලක්කය: විදුලිබල සේවාවේ බිඳවැටීම් දර්ශකය පාරිභෝගිකයෙකුට වර්ෂයක් තුළ දී පැය 24ට වඩා අඩු කිරීම.
විදුලිබල සේවා බිඳවැටීම් දර්ශකය (SAIDI) විදුලිබල උපයෝගීතා මගින් විශ්වාසදායක දර්ශකයක් ලෙස බහුලව භාවිතා කරයි. එය එක් එක් පාරිභෝගිකයා සඳහා සාමාන්‍ය විදුලිබලය ඇණහිටුම කාලසීමාව වන අතර කාල ඒකක, බොහෝවිට විනාඩි හෝ පැයවලින් මනිනු ලැබේ. එය විදුලිබලයේ ගුණාත්මකභාවය පිළිබඳ දර්ශකයක් වේ.

3 වැනි ඉලක්කය: පාරිභෝගිකයෙක් විසින් වසරක් තුළ දී අත්විඳින විදුලිබල සේවාවෙහි බිඳවැටීම් මුළු සංඛ්‍යාව සිදුවීම් 30කට වඩා අඩු කිරීම (සාමාන්‍ය මට්ටමින්)

SAIFI ද පොදුවේ භාවිතා කරනු ලබන විශ්වාසදායක දර්ශකයක් වන අතර පාරිභෝගිකයෙක් අත්විඳින සේවා බිඳවැටීම්වල සාමාන්‍ය සංඛ්‍යාව වේ. එය එක් පාරිභෝගිකයෙක් සඳහා වූ බිඳවැටීම් ඒකකවලින් මනිනු ලබන අතර සාමාන්‍යයෙන් වසරක කාල සීමාවක් සඳහා මනිනු ලැබේ.

4 වැනි ඉලක්කය: පාරිභෝගික සේවා රැහැන් දෝෂයක් සම්බන්ධයෙන් විදුලිබල සේවාව යථාතත්ත්වයට පත් කිරීමේ කාලය පාරිභෝගිකයෙක්ට පැය 2කට වඩා අඩු කිරීම.

පාරිභෝගික සේවා රැහැන් දෝෂයක් සම්බන්ධයෙන් විදුලිබල සේවාව යථාතත්ත්වයට පත් කිරීමේ කාලය පද්ධතියක විශ්වාසදායකභාවය පිළිබඳ දර්ශකයකි. එය විදුලිබලය ඇණහිටීමකින් පසුව එහි සේවාව නැවත යථාතත්ත්වයට පත් කිරීමට විදුලිබල උපයෝගීතාවට ගත වන සාමාන්‍ය කාලය වේ. නියාමකයා වශයෙන් කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයින්ට ප්‍රශස්ත සේවාවක් ලබා දෙන බවට සහතික කළ යුතු වන අතර විදුලිබල සේවාව යථා තත්ත්වයට පත් කිරීමේ වේලාව හැකිතාක් දුරට අඩු කිරීම ප්‍රමුඛතාවක් වේ.

සේවා ගුණාත්මකභාවය

5 වැනි ඉලක්කයඃ පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ තොරතුරු පාරිභෝගිකයින්ට කලින්ම ලබාදීම සහ ඔවුන් විසින් එවැනි තොරතුරු ඉල්ලා සිටි විට එම තොරතුරු සැපයීම.

පාරිභෝගිකයින් සහ බලපත්‍රලාභීන් ඇතුළු කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් පිළිබඳව අධ්‍යාපනයක් සඳහා වඩාත් හොඳ ප්‍රවේශයක් තිබෙන්නේ නම් ඔවුන් ඒවා පිළිබඳව ඉතා හොඳින් දැනුවත් වේ. මෙම තොරතුරුවලට විදුලිබල සේවාව ලබා ගන්නා විට පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් මෙන්ම නියාමන රාමුව පිළිබඳ තොරතුරු ද ඇතුලත් විය යුතු වන අතර ඒ අනුව අඛණ්ඩ සේවාවක් ලබාදීම සඳහා බලපත්‍රලාභීන් ද වඩාත් සුදුසු තත්ත්වයකට පත් වේ. එමෙන්ම මෙමගින් කර්මාන්තයේ දියුණුව සඳහා දායක වන රෙගුලාසි සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සකස් කිරීමේ දී රජය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය වේ. දැනුවත් භාවය ඇති කිරීම සහ තොරතුරු වෙත ප්‍රවේශය සැලසීම තුළින් ඉලක්කය සපුරා ගැනීමට හැකි වනු ඇත.

6 වැනි ඉලක්කයඃ විදුලිබල සේවා සැපයුම්කරු විසින් පාරිභෝගික විමසීම්/ඉල්ලීම්/පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ගන්නා සාමාන්‍ය කාලය දින 30කට අඩු වේ.

2020 වසරේ දී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක අනුව, 2014 වසරට වඩා 2015 වසරේ දී කොමිෂන් සභාවට යොමු කළ කරුණු කැපීපෙනෙන ලෙස ඉක්මනින් විසඳීමට සමත් වී ඇත.

7 වැනි ඉලක්කයඃ කොමිෂන් සභාව පාරිභෝගිකයින්ට සේවය කිරීම සඳහා ගන්නා සාමාන්‍ය කාලය දින 30කට අඩු වේ.

පාරිභෝගිකයින් සඳහා වඩාත් හොඳ සේවාවක් යන්නෙන් ඔවුන්ගේ ප්‍රශ්න සහ ගැටළු සම්බන්ධයෙන් ඉක්මන් සහ වඩාත් කාර්යක්ෂම විසඳුම් ලැබෙන බවට අදහස් වේ. පාරිභෝගිකයෙක්ගේ පැමිණිල්ලක් ලැබුනු විට ඔහුට/ ඇයට සෑහීමකට පත් විය හැකි විසඳුමක් හැකි ඉක්මනින්ම ලබා දෙන බව සහතික කිරීම සඳහා ගත හැකි සියලුම පියවර ගත යුතුය. පාරිභෝගිකයින්ට සේවා සැපයීමට ගන්නා සාමාන්‍ය කාලය දින 14ක් දක්වා අඩු කිරීමේ ඉලක්කය වන්නේ වර්තමානයේ දී ලබා දෙන සේවාවට වඩා හොඳ සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමයි.

විදුලිබල අයකුම සහ සේවා ගාස්තු

8 වැනි ඉලක්කයඃ 2013 වසරේ විදුලිබල සැපයුම සඳහා වැය වූ මුළු පිරිවැයට සාපේක්ෂව විදුලිබල සැපයුම් පිරිවැය සියට 10කින් අඩු කිරීම (උත්පාදන සංයුතියේ හා ඉන්ධන මිල ගණන්වල මූර්තමය අගයෙහි ගැලපීම්වලට යටත්ව සමස්ත පිරිවැය ගණන් බලනු ලැබේ.)

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ සඳහන් කර ඇති පරිදි බලපත්‍රලාභීන් විසින් පාරිභෝගිකයින් මත පණවනු ලබන විදුලිබල අයකුම සහ විවිධ සේවා ගාස්තු නියාමනය කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වේ. මෙම ගාස්තු විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ දිවයින පුරා බෙදාහැරීම වෙනුවෙන් බලපත්‍රලාභීන් විසින් අය කරනු ලැබේ. බලපත්‍රලාභීන්ගේ ව්‍යාපාර පවත්වා ගෙනයාමට ප්‍රමාණවත් සාධාරණ අයකුම සහතික කරන අතරතුර ඔවුන් විසින් හැකි උපරිම සේවාව සැපයීමේ අවශ්‍යතාව පනත මගින් අවධාරණය කරයි. සාධාර අයකුම සහ සේවා ගාස්තු සහතික කිරීමේ පරමාර්ථය ඇතිව කොමිෂන් සභාව 2015 වසර තුළ දී පහත දැක්වෙන ක්‍රියාකාරකම් දියත් කරනු ඇත.

9 වැනි ඉලක්කයඃ සේවා සැපයුම්කරු 2013 වසරේ දී වෙනත් සේවා සඳහා අයකරනු ලැබූ ගාස්තු මූර්තමය වශයෙන් 10%කින් අඩු කිරීම

පාරිභෝගිකයින් සඳහා සාධාරණ සහ දැරිය හැකි ගාස්තු සහතික කිරීම කොමිෂන් සභාවේ ප්‍රධාන ඉලක්කයක් වන අතර මේ සම්බන්ධයෙන් පියවර රාශියක් ගත යුතුව ඇත. සේවා සැපයුම්කරුවන්ට ඔවුන්ගේ ගාස්තු අඩු කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම එක් ප්‍රියවරකි

විදුලිබල ආරක්ෂාව

10 වැනි ඉලක්කය: විදුලි සැර වැදීම් හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව වර්ෂයකට 20කට වඩා අඩු කිරීම 2012 වසරේ දී සිදුවීම් 180ක් තරම් ඉහළ අගයක් ගත් ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදීම් සංඛ්‍යාව 2013 වසරේ දී සිදුවීම් 76ක් දක්වා කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළේය. කොමිෂන් සභාව මඟින් පවත්වන ලද විදුලිබල ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු රාශිය විදුලිබලය ආශ්‍රිත මරණ සංඛ්‍යාව අඩුවීමට දායක වූ ප්‍රධාන කරුණක් ලෙසට විශ්වාස කළ හැකිය.

අනවසර විදුලිය ලබාගැනීම්, දෝෂ සහගත උපකරණ, විදුලි රැහැන් හා ඉදිකිරීම් අතර පැවතිය යුතු අවම පරතරය නොතැබීම, අනාරක්ෂිත අභ්‍යන්තර විදුලි රැහැන් ඇදීම, වෘත්තීය සුදුසුකම් සහිත විදුලි කාර්මිකයින්ගේ සේවය ලබා නොගැනීමගැනීම, වැරදීම් හා නොසැලකිලිමත්කම, නුසුදුසු පරිසරයන් තුළ වැඩ කිරීම සහ සේවා සැපයුම්කරුවන්ගේ විවිධ දෝෂ ශ්‍රී ලංකාවේ සිදු වන විදුලි සැර වැදීම් සඳහා ප්‍රධාන හේතු සාධක වේ.

2008 - 2012 දක්වා සිදු කළ සමීක්ෂණවලට අනුව අනුරාධපුරය, රත්නපුරය, මහ නුවර, අම්පාර සහ වව්නියාව විදුලි සැර වැදීම් සම්බන්ධයෙන් අවදානම් බහුල ප්‍රදේශ වේ. වන සතුන් මැරීම හා වගා බිම් ආරක්ෂාව සඳහා අනවසර විදුලි රැහැන් ඇදීම, විදුලිබල සැපයුමට අනවසර ප්‍රවේශය ලබා ගැනීම සහ නිසි ලෙස පරිවාර නොයෙදූ හානි වූ, කැඩුනු විදුලි උපකරණ මෙම විදුලි සැර වැදීම් සඳහා හේතු ලෙස හඳුනා ගෙන ඇත. දිවයින පුරා සිදු වන විදුලි සැර වැදීම්වලින් සියයට 28ක් මෙම ප්‍රදේශවල සිදු වූ බවට අනාවරණය වී ඇති අතර එවැනි සිදුවීම් අවම කර ගැනීම සඳහා ඉක්මන් අවධානය යොමු කළ යුතුය.

2020 වසර වන විට විදුලි සැර වැදීම් සංඛ්‍යාව 0 දක්වා ගෙන ඒමට කොමිෂන් සභාව ඉලක්ක කර ගෙන ඇති අතර මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා වූ එහි සැලසුම් හා ක්‍රියාකාරකම් දැඩි කර ඇත. ශ්‍රී ලංකාවේ විදුලිබල අංශයේ ස්වාධීන නියාමකයා වශයෙන් කොමිෂන් සභාව පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම එහි ප්‍රධාන පරමාර්ථයක් ලෙසින් සලකයි.

විදුලිබල පරිශීලකයින් දැනුවත් කිරීම, රෙගුලාසි හා සංග්‍රහ සකස් කිරීම හරහා බලපත්‍රලාභීන්ගේ ක්‍රියාකාරකම් ප්‍රමිතිගත කිරීම සහ නීතිවිරෝධී භාවිතයන් හඳුනාගන්නා තැනැත්තන්ට ත්‍යාග ප්‍රදානය කිරීම ආදිය විදුලි සැර වැදීම් සංඛ්‍යාව අවම කිරීම සඳහා කොමිෂන් සභාව හඳුනා ගෙන ඇති ක්‍රියාමාර්ග කීපයකි.

විදුලිබල ඉල්ලුම

11 වැනි ඉලක්කය: සියලුම අවස්ථාවල දී රට තුළ විදුලිබල ඉල්ලුම සපුරාලන බවට සහතික කර ගැනීම සඳහා 2020 වර්ෂය වන විට ඕනෑම තත්ත්වයක දී අවම සංචිත මට්ටම සියයට 10ක් වශයෙන් පවත්වා ගැනීම අතීතයේ දී සිදු වූ ආකාරයට විදුලිබල සැපයුම ආශ්‍රිතව දිවයින කිසිදු බරපතල ගැටළුවලට මුහුණ නොදෙන බවට සහතික කර ගැනීම සඳහා සියලුම අවස්ථාවල දී සංචිත මට්ටමක් පවත්වා ගෙන යා යුතුය. විදුලිබලය සඳහා දිවයින තුළ ඇති වන සියලුම ඉල්ලුම සපුරාලිය හැකි වන පරිදි විදුලිබලය සම්බන්ධයෙන් සියයට දහයක අවම සංචිතයක් පවත්වා ගෙන යාම 2020 වර්ෂය සඳහා වූ කොමිෂන් සභාවේ ඉලක්කයක් වේ.

විදුලිබලය කාර්යක්ෂමව භාවිතා කිරීම සහ සංරක්ෂණය

12 වැනි ඉලක්කය: උපයෝගිතා ආයතනවල බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් හරහා 2020 වර්ෂය වන විට අවම වශයෙන් ගිගාවොට් 250ක බලශක්තියක් සහ මෙගාවොට් 30ක ධාරිතාවක් සංරක්ෂණය කිරීම.

පාරිසරික බැඳීම් ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ නියාමකයා වශයෙන් කොමිෂන් සභාව සතු බැඳීමක් වේ. නාස්තිය අවම කිරීම හා විදුලිබලය භාවිතයේ දී කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා කාර්යපටිපාටීන් දිරිමත් කිරීම හා ගොඩනැගීම 2015 වර්ෂය තුළ කොමිෂන් සභාවේ අවධානය යොමු කළ ප්‍රධාන කරුණු අතර වේ. මෙම ඉලක්කය එය සාක්ෂාත් කර ගැනීම ආශ්‍රිත ව්‍යාපෘති හා කටයුතු කෙරෙහි අවධානය යොමු කරයි.

විදුලිබල පාරිභෝගිකයා

විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා බැඳීම් ආරක්ෂා කිරීම හරහා ඔවුන් ආරක්ෂා කිරීම විදුලිබල කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යභාරවලින් එකකි. පාරිභෝගික අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික කිරීම, විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා වගකීම් සම්බන්ධයෙන් ඔවුන් සවිබලගන්වන අතරතුර පාරිභෝගිකයින්ගේ දුක්ගැනවිලි විසඳීමේ දී ඔවුන්ට උපදෙස්දීම හා සහායදීම ද එහි කාර්යභාරයට ඇතුලත් වේ. එමෙන්ම කොමිෂන් සභාව රජයේ රීති හා රෙගුලාසිවලට අනුකූල වන අතරතුර බලපත්‍රලාභීන්ගේ හා අනෙක් පාර්ශ්වයන්ගේ පරමාර්ථ ඉටු වන බවට සහතික කරයි. පාරිභෝගිකයින් ඔවුන්ගේ දෛනික වැඩකටයුතුවල දී විවිධ කටයුතු සම්බන්ධයෙන් ආරක්ෂාකාරී හා තෘප්තිමත් වන බවට සහතික කිරීම ද එහි ප්‍රධාන අරමුණු අතර වේ.
කොමිෂන් සභාව විවිධ මුල්පිරීම් හරහා විදුලි පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදී.

පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශනය

2009 ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 (1) (ඉ) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිෂන් සභාව) විසින් විදුලි පාරිභෝගිකයින්ගේ පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් දක්වෙන ප්‍රකාශනයක් ප්‍රකාශයට පත් කළ යුතුය.

පාරිභෝගික ආරක්ෂණය සඳහා ඉතා වැදගත් වන විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව ඔවුන් තුළ දැනුවත්භාවයක් ඇති කිරීම, සේවා බලපත්‍රලාභීන් සැපයිය යුතු ගුණාත්මකභාවයේ මට්ටම් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සහ කාර්යක්ෂම විදුලිබල සේවාවක් සැපයීම සඳහා අත්‍යවශ්‍ය නියමයක් වන පාරිභෝගික වගකීම් පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම මෙම ප්‍රකාශනය ප්‍රකාශනයට පත් කිරීමේ ප්‍රධාන පරමාර්ථය වේ.

ඒ අනුව කොමිෂන් සභාව මගින් 2015 වසරේ දී පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශනය ප්‍රකාශටපත්කර දියත් කරන ලදී.

විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාස්කම් හා වගකීම් ප්‍රකාශනය තුළ පහත දක්වෙන අයිතිවාසිකම් හා වගකීම් පැහැදිලි කර ඇත.

පාරිභෝගික අයිතිවාසිකම්:

- බලපත්‍රලාභීන් විසින් සැපයීමට එකඟ වී ඇති තත්ත්ව ප්‍රමිතිවලට සරිලන විශ්වාසදායක හා ආරක්ෂිත විදුලිබලය සඳහා ප්‍රවේශය
- විදුලිබල සැපයුම් සේවාව සම්බන්ධ කරුණු පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශය.
- නව සේවා සම්බන්ධතාව සේවා ධාරිතාව/ අයකුම කාණ්ඩය වෙනස් කිරීම
- විසන්ධි කිරීම සහ ගිවිසුම අවසන්වීම
- නැවත සම්බන්ධතාව ලබාදීම්
- පැමිණිලි කළමනාකරණය
- විදුලි මනු, විදුලි මනු කියවීම හා බිල්පත් සකස් කිරීමේ ක්‍රියාවලි
- විදුලි බිල්පත්
- සේවා ගාස්තු, මිල යටිතලපහසුකම් සහ බිල්පත් ගෙවීම්
- පාරිභෝගිකයින්ගේ පරිශ්‍රවලට ඇතුළුවීම
- පාරිභෝගික අධ්‍යපානය
- පාරිභෝගිකයින්ට සැලකීමේ සමානාත්මතාව
- පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය

පාරිභෝගික වගකීම්:

- නීත්‍යානුකූල බිල්පත් ගෙවීම්
- බලපත්‍රලාභියා හා එහි බලයලත් නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
- බලපත්‍රලාභියා සමඟ එළැඹුනු අයකුම ගිවිසුමේ නියම හා කොන්දේසිවලට අනුකූලවීම
- පරිශ්‍රවල සවි කළ විදුලිබල රැහැන්වල ආරක්ෂාව සහතික කිරීම
- නව සම්බන්ධතාවක් සඳහා ඉල්ලුම් කිරීමේ දී බලපත්‍රලාභියාට අදාළ සියලුම තොරතුරු හෙළිදරව් කිරීම

කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් විදුලි පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශනය ගරු. විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙත පිළිගැන්වීම

ආරාවුල් විසඳීමේ රීති

බලපත්‍රලාභියෙකු හා පාරිභෝගිකයෙකු හෝ වෙනත් බලපත්‍රලාභියෙකු හෝ පීඩාවට පත් වූ වෙනත් කිසියම් පාර්ශ්වයක් අතර ඇති වන ආරාවුල් කොමිෂන් සභාව මගින් නිර්දේශිත විදුලි (ආරාවුල් විසඳීමේ) රීති යටතේ විසඳීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කළ හැකිය. විදුලිබල පනතට සිදු කළ 2009 අංක 20 සහ 2013 අංක 31 දරන සංශෝධනවල ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාත්මකව පැවති ආරාවුල් විසඳීමේ රීති සංශෝධනය කිරීම අනිවාර්ය විය. සිදු කළ යුතු සියලුම වෙනස්කම් අධ්‍යයනය කර ඒවා ඇතුලත් කරමින් කෙටුම්පතක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. කොමිෂන් සභාව මඟින් අනුමත කළ අවසාන කෙටුම්පත අනුමැතිය සඳහා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. එය 2016 වසරේ දී ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

විදුලි පාරිභෝගික පැමිණිලි

2015 වර්ෂය තුළ දී කොමිෂන් සභාවට විදුලි පාරිභෝගිකයින්ගෙන් පැමිණිළි 1140ක් ලැබී ඇති අතර මෙම පැමිණිලි සියල්ලම සම්බන්ධයෙන් කටයුතු කර ඇත. පැමිණිළිවලින් සියයට 39ක් නව සම්බන්ධතා, ආරක්ෂාව හා ඉහළ වෝල්ටීයතාව සම්බන්ධයෙන් වූ අතර සියයට හතරක් අයකුම හා ආරක්ෂක තැන්පතුව සම්බන්ධයෙන් විය.



දැනුවත් කිරීමේ ව්‍යාපාර - විදුලි පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම්

කොමිෂන් සභාව විදුලි පාරිභෝගික අයිතිවාස්කම් හා වගකීම් ප්‍රකාශනයේ පිටපත් 20,000ක් මුද්‍රණය කරන ලද අතර සිය අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව දැන ගැනීමට අපේක්ෂා කරන හා ඕනෑම කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සහාය බලාපොරොත්තු වන විදුලි පාරිභෝගිකයෙක්ට ප්‍රකාශනය ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලිබල සමාගම, දිස්ත්‍රික් ලේකම්කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ග්‍රාම නිලධාරී කාර්යාල වෙත පිටපත් 19,118ක් බෙදා හරින ලදී.

මාධ්‍ය හරහා දැනුවත් කිරීම

විදුලි බලය සම්බන්ධයෙන් ඇති මහජනතාවගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට, ප්‍රජාව තුළ ඇති දැනුම අඩුකම මගහැරීමට සහ ඔවුන්ගේ ආරාවුල් විනිවිදභාවයකින් හා ඉක්මනින් විසඳීමට පුවත්පත් ලිපි හා රූපවාහිනී සම්මුඛසාකච්ඡා මාලාවක් පළ කරන ලදී.

පෝස්ටර, පත්‍රිකා සහ පොත්පිංච හරහා දැනුවත් කිරීම

විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශනය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව මහජනතාව අතර ප්‍රසිද්ධියක් ඇති කිරීම සඳහා කොමිෂන් සභාව පාරිභෝගික පැමිණිලි හා ආරාවුල් විසඳීම පිළිබඳව පෝස්ටර, පත්‍රිකා සහ පොත්පිංච හරහා ඔවුන් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

ඒ අනුව 2015 වර්ෂය අවසානය වන විට සිංහල හා දෙමළ භාෂාවෙන් ලියැවුනු පෝස්ටර, භාෂා තුනෙන්ම වූ පත්‍රිකා සහ පොත්පිංච ග්‍රාම සේවක නිලධාරී කාර්යාලවල පොදු පරිශීලනය සඳහා තැබීමට ග්‍රාම නිලධාරීන් 14,200ක් දෙනා අතර බෙදා දෙන ලදී.

පාරිභෝගිකයින්ට සේවය සැලසීම සඳහා ගන්නා සාමාන්‍ය වේලාව මැනීම

කොමිෂන් සභාව මගින් සියලුම බලපත්‍රලාභීන්ගේ තෝරාගත් ප්‍රදේශ/ ශාඛා කාර්යාල වෙත සංචාරය කළ අතර පොදු සේවාවන් පහක් හඳුනා ගෙන, බලපත්‍රලාභීන් විසින් පිළිගත් තොරතුරු එක්රැස් කිරීමේ ආකෘති සකස් කරන ලදී. බලපත්‍රලාභීන් විසින් 2016 වසරේ පෙබරවාරි මස පළමු සතිය තුළ දී පළමු තොරතුරු කට්ටලය එවීමට එකඟ වී ඇත. 2016 වර්ෂය සඳහා ද ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයන ලදී.

කොමිෂන් සභාවට යොමු කළ කරුණු විසඳීම සඳහා ගන්නා සාමාන්‍ය වේලාව මැනීම

කොමිෂන් සභාවට යොමු කරන විවිධ කරුණු ඉක්මනින් විසඳීම සඳහා දින 14ක ඉලක්කය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් මෙම මූලාරම්භය දියත් කරන ලදී. ඒ අනුව 2014 වර්ෂය සඳහා කොමිෂන් සභාවට යොමු කළ සියලුම කරුණු හඳුනා ගන්නා ලද අතර අදාළ කරුණු ලැබූ දින හා විසඳන ලද දින ලබා ගන්නා ලදී.

එක් එක් කරුණ විසඳීම සඳහා ගත් කාලය ගණනය කරන ලද අතර 2014 වර්ෂය තුළ දී විසඳීම සඳහා කොමිෂන් සභාවට යොමු කළ කරුණක් විසඳීමට ගත් සාමාන්‍ය කාලය දින 64ක් විය. එමෙන්ම 2015 වර්ෂය තුළ දී කොමිෂන් සභාවට යොමු කළ කරුණක් විසඳීමට ගත් සාමාන්‍ය කාලය ගණනය කළ අතර එය දින 42ක් විය.

පාරිභෝගික ජාලය පිහිටුවීම

කොමිෂන් සභා පනතේ 28වැනි වගන්තිය අනුව කොමිෂන් සභාව විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබේ. පාරිභෝගිකයින්ට කරුණු කියා සිටීමට හා ඔවුන්ගේ අයිතීන් කෙරෙහි නිසි සැලකිල්ල ලැබෙන බවටත් පාරිභෝගික අධ්‍යාපනය ලැබෙන බවටත් සහතිකවීම කොමිෂන් සභා පනතින් සහතික කර ඇති අයිතිවාසිකම් අතර වේ. පොදුවේ ගත් කළ, ශ්‍රී ලංකා ආයතනික අංශයේ සිටින පාරිභෝගිකයින් සාමාන්‍යයෙන් සංවිධානාත්මක වන අතර විධිමත් සාකච්ඡා අතරතුර දී ඔවුන්ගේ අදහස් පළ කරන බැවින් ආයතනික අංශය සම්බන්ධයෙන් ගත් කළ සාධාරණ ලෙස කරුණු කියාසිටීමට අවස්ථාව සහතික කළ හැකිය. කෙසේවුව ද, සංවිධානාත්මක නොවන සුළු පාරිභෝගිකයින් විශාල සංඛ්‍යාවකට සිය අදහස් ප්‍රකාශ කිරීම සඳහා විධිමත් සංවිධානයක් නොමැති බැවින් ඔවුන්ගේ හඬ නිසි ලෙස නොඇසෙන බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

මේ අනුව කොමිෂන් සභාව මගින් පාරිභෝගික උපදේශක කමිටුව වෙත ඔවුන්ගේ අදහස් විධිමත් ලෙස ලබා දෙන පාරිභෝගික ගැටළු සම්බන්ධයෙන් ස්වේච්ඡා පදනම මත කටුයුතු කරන ජාතික පාරිභෝගික ජාලයක් නිර්මාණය කිරීමට අදහස් කරන ලදී. කෙසේවුව ද, අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා එවැනි මුල්පිරීම්වල දීර්ඝ කාලීන පැවැත්ම සහතික කළ යුතු බවට මෙයට සමාන මුල්පිරීම් දියත් කිරීම තුළින් කොමිෂන් සභාව ලද අත්දැකීම් අනුව ඔප්පු වී ඇත. දීර්ඝ කාලීන පැවැත්ම සලකා බැලීමේ දී මෙම ජාලයේ ක්‍රියාකාරකම් විෂයපථය විදුලිබලයට පමණක් සීමා නොවූ අතර ජාල සාමාජිකත්වය සඳහා පොදු උනන්දුවක් ඇති වෙනත් ඕනෑම අංශයක් සඳහා ද එය විවෘත විය. අඛණ්ඩ පදනමක් මත විවිධාකාර ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමට හැකියාව ලබා දෙන බැවින් විෂයපථය පුළුල් වන තරමට ජාලයේ පැවැත්ම ඉහළ යන බවට කොමිෂන් සභාව අදහස් කරයි.

ජාතික පාරිභෝගික ජාලයේ පළමු අදියර ලෙස කොමිෂන් සභාව දිවයින තුළ පොදු තීරණ ගැනීමේ දී ඉහළ ගුණාත්මකභාවයක පුරවැසි/ පාරිභෝගික නියෝජනයක් අත්කර ගත හැකි පදනමක් ලෙස පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ පරමාර්ථය ඇතිව ලංකා විදුලි පුද්ගලික සමාගමේ ප්‍රදේශ ද (දකුණු පළාත) ඇතුලත් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා ප්‍රදේශවල IVවැනි කලාපයේ පාරිභෝගික ක්‍රියාකාරකම් පිළිබඳ ජාලයක් නිර්මාණය කරන ලදී. මෙම අරමුණ ඉටු කර ගනු වස් කොමිෂන් සභාව විදුලිබල/ බලශක්ති පාරිභෝගිකයින් සිය අයිතිවාසිකම් හා වගකීම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ පාරිභෝගික ජාල පිහිටුවීම සඳහා උපදේශක කණ්ඩායමක සේවය ලබා ගන්නා ලදී.

උපදේශකයින් බඳවා ගැනීම 2014 වර්ෂයේ දී ආරම්භ වූ අතර බලශක්ති සංසදය හා කොමිෂන් සභාව අතර 2015 අගෝස්තු මස 19වැනි දින ඇති කර ගත් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමත් සමඟ 2015 අගෝස්තු මාසයේ දී එම වැඩකටයුතු අවසන් විය. පසුව උපදේශකයින් විසින් ක්‍රියාකාරකම් සැලැස්මක් ඉදිරිපත් කරන ලද අතර එය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. අනෙකුත් නියාමකයින් සමඟ එක්ව කටයුතු කිරීමේ වැදගත්කම සලකා බලමින් පාරිභෝගික කටයුතු අධිකාරිය ද සිය සහයෝගය පළ කළේය. කොමිෂන් සභාව ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල සිටින ලියාපදිංචි ප්‍රජා පාදක සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ කර ගත හැකි තොරතුරු එක්රැස් කළ අතර ඔවුන්ට පාරිභෝගික ජාල ක්‍රියාකාරකම්වලට සහභාගීවන ලෙසට ආරාධනා කළේය. 2015 දෙසැම්බර් මස 17, 21 හා 22 යන දිනවල දී පිළිවෙලින් මාතර, හම්බන්තොට සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් වැඩමුළු තුනක් සංවිධානය කරන ලදී. මෙම වැඩකටයුතු 2016 වර්ෂය දක්වා ද දීර්ඝ වේ.

පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම් සම්බන්ධයෙන් පාරිභෝගික ජාල සාමාජිකයින්ගේ ධාරිතා ගොඩනැගීම

පාරිභෝගික ජාල සාමාජිකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම, ඔවුන් පාරිභෝගික අදහස් විමසීම් සඳහා යොමු කිරීම සහ විදුලිබලය හා විදුල්බල සැපයුම ආශ්‍රිත ඔවුන්ගේ ගැටළු විසඳීම තුළින් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මෙම මූලාරම්භය දියත් කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාව මඟින් ලංකා විදුලි පුද්ගලික සමාගමේ ප්‍රදේශ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ දකුණු කලාපය තුළ පාරිභෝගික ජාලය පිහිටුවීමට අනුමැතිය ලබා දෙන ලන අතර 2015 සැප්තැම්බර් මාසයේ දී උපදේශකයෙක් පත් කරන ලදී. එමෙන්ම 2015 වසරේ දී පරිපාලන ග්‍රාම නිලධාරීන් සඳහා ගාල්ල, හම්බන්තොට, කළුතර සහ රත්නපුරය යන ප්‍රදේශවල පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශනය දියත් කරන ලදී.

විදුලිබල ආරාවුල් විසඳීමේ ක්‍රමය භාවිතයේ ඇති හස්ත ක්‍රමයට ගැලපීම

දැනටමත් ගොඩනගා ඇති ආරාවුල් විසඳීමේ පද්ධති මෘදුකාංගයට එයට පසුව ගොඩනගන ලද හස්ත දුක්ගැනවිලි හසුරුවීමේ ක්‍රියාවලිය ආවරණය කිරීමට නොහැකි විය. ඉක්මන් සේවාවක් සැපයීම සඳහා හස්ත පිරිසැකසුම් ක්‍රමය පරිගණකගත ක්‍රමයකට පරිවර්තනය කළ යුතු විය.

සැම පිරිසැකසුම් අදියරක්ම සහ දුක්ගැනවිලි හසුරුවීමක්ම තෝරා ගත් මෘදුකාංග ගොඩනගන්නා වෙත පැහැදිලි කරන ලදී. 2015 වසරේ දී මෘදුකාංග ගොඩනැගීම නිමා කළ ද එය පරීක්ෂා කිරීම හා දියත් කිරීම 2016 වර්ෂය දක්වා දීර්ඝ කරන ලදී.

මහජන මත විමසීම්

මහජන මත විමසීම කිසියම් කරුණක් පිළිබඳ අවසාන තීරණ ගැනීමට පෙර ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තමන්ට බලපෑමක් වන ජාතික වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධයෙන් මහජනතාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වූ අත්‍යවශ්‍ය අන්‍යෝන්‍ය යාන්ත්‍රණයක් ලෙස සලකනු ලැබේ.
ඒ අනුව 2015 වර්ෂයේ දී පහත දැක්වෙන මහජන මත විමසීම් නිමා කරන ලදී.

බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විදුලිබලය සම්බන්ධ කිරීමේ දී හා සැපයීමේ දී දැරූ වියදම් දැරීමට පුද්ගලයෙක්ට ප්‍රමාණවත් මුදල් නොමැති බවට සෑහීමකට පත්වීමේ කාර්යය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිෂන් සභාව) විදුලිබල කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂණ නියාමකයා වශයෙන් සහ විදුලිබල සම්බන්ධතා හා සැපයුම සඳහා අය කරනු ලබන මිල ගණන් සම්බන්ධයෙන් විදුලිබලය සැපයුම ආශ්‍රිතව අනාගත පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පරමාර්ථය ඇතිව ඉහත කරුණු පිළිබඳ මහජන අදහස් ඉල්ලා සිටී.

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 27වැනි වගන්තිය අනුව විදුලිබල සැපයුමක් ලබාදීමේ දී දරනු ලබන මුළු වියදම එකවර ගෙවීමට ප්‍රමාණවත් මුදලක් නොමැති ඕනෑම තැනැත්තෙක් අයකුම සමග එම වියදම් සාධාරණ මාසික වාරිකවලින් අය කර ගැනීමට බෙදාහැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිය හැකිය.

මේ අනුව යම් තැනැත්තෙක්ට බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිබල සම්බන්ධතාවක් හා සැපයුමක් ලබාදීමේ දී දරනු ලබන මුළු වියදම එකවර ගෙවීමට ප්‍රමාණවත් මුදලක් නොමැති බවට සෑහීමකට පත්වීමේ කාර්යය සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියාට අවශ්‍ය කරන තොරතුරු 2009 අංක 20 දරන එකී පනත යටතේ රීති ලෙස කොමිෂන් සභාව මගින් නියම කිරීමට නියමිත මාර්ගෝපදේශ මත පදනම් විය යුතුය.

මෙම කාර්යය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව සකස් කළ උපදේශක ලේඛණය පිළිබඳව අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව අදාළ සියලුම පාර්ශ්වවල අදහස් ලබා ගැනීමට තීරණය කරන ලදී.

වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම 2016 පිළිබඳ මහජන අදහස් ලබා ගැනීම

කොමිෂන් සභා පනතේ නියම කර ඇති පරිදි කොමිෂන් සභාවේ 2016 ක්‍රියාකාරකම් සැලැස්මේ කෙටුම්පත2015 වර්ෂයේ දී මහජන අදහස් ලබා ගැනීමට ඉදිරිපත් කරන ලදී. මෙම ක්‍රියාකාරකම් සැලැස්ම විදුලිබල කර්මාන්තයේ නියාමකයා සහ ලිහිසි තෙල් වෙළඳපොළේ ඡායා නියාමකයා වශයෙන් කොමිෂන් සභාව විසින් ඉටු කිරීමට නියමිත ව්‍යාපෘති විස්තර කරයි. කොමිෂන් සභාවේ ඉලක්ක සහ ක්‍රියාකාරී සැලැස්ම මෙම වාර්තාව මගින් දීර්ඝ ලෙස විස්තර කරනු ලැබේ. සැලැස්ම තුළ හඳුනා ගත් ව්‍යාපෘති පිළිබඳ අදහස් හෝ යෝජනා දැනුම් දෙන ලෙසට උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වකරුවන්ට ආරාධනා කරන ලදී.

විවිධ අංශවලින් විශේෂයෙන්ම අයකුම, ආරක්ෂාව හා තත්ත්වයෙන් බාල උපකරණ ආදිය පිළිබඳව ඉදිරිපත් කර ලද අදහස් ලැබුනි. මෙම අදහස් බරපතල ලෙස සැලකිල්ලට ගෙන අවශ්‍ය අවස්ථාවල දී කොමිෂන් සභාව වෙනස්කම් ඇති කරන ලද අතර ඇතැම් අදහස් 2016 ක්‍රියාකාරකම් සැලැස්මට ඇතුලත් කර තිබේ.

ශ්‍රී ලංකාව තුළ කාර්මික නොවන යෙදවුම්වල පේනු සහ කෙවෙනි සඳහා තනි ප්‍රමිතියක් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව ක්‍රමයෙන් එක් වර්ගයක පේනු සහ කෙවෙනි භාවිතා කිරීමට මාරුවීම සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට, අවශ්‍ය රෙගුලාසි නිකුත් කිරීමට සහ වෙනත් නියාමන අනුයෝජිතය ආයතනවල සහභාගීත්වයට පහසුකම් සැලසීමට තීරණය කර ඇත.

මේ අනුව (ඇම්පියර 13 පේනුව හා කෙවෙනිය ලෙස ප්‍රසිද්ධ සහ "කොටු කුර" හා කෙවෙනිය ලෙස පොදුවේ හඳුන්වන) ජී වර්ගයේ පේනුව සහ කෙවෙනිය ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන එකම ජාතික ප්‍රමිතිය ලෙස කොමිෂන් සභාව තීරණය කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ කාර්මික නොවන තනි පේනුව හා කෙවෙනිය පිළිබඳව විදුලිබල පාරිභෝගිකයින්ගේ හා වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා හැකියාව ලබාදීමට කොමිෂන් සභාව මඟින් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 1 (උ) සහ 4 1 (අ) වගන්තිය යටතේ සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව පනතේ 17 (ආ) වගන්තිය අනුව උපදේශක ලිපියක් නිකුත් කර ඇත. කොමිෂන් සභාව උපදේශක ලිපියේ දක්වා ඇති (i) සිට (vii) දක්වා වූ පහත දැක්වෙන නිශ්චිත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මහජන අදහස් කැඳවන ලදී.

(i) පේනු: කොමිෂන් සභාව 2016 මැයි මස 1වැනි දින සිට ජී වර්ගයේ පේනු හැරුණු කොට වෙනත් වර්ගවල පේනු සහිත උපකරණ ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම තහනම් කිරීමට යෝජනා කරයි.

(ii) කෙවෙනි: දැනටමත් සවිකර ඇති ඕනෑම ආකාරයක බිත්ති කෙවෙනි ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසාන වන තෙක් සවිකර තැබීමට ඉඩදීමට කොමිෂන් සභාව යෝජනා කරයි.

(iii) විදුලි රැහැන් ඇදීම: ජී වර්ගයේ සම්මත පේනුව භාවිතා කිරීමට මාරුවීම හේතුවෙන් එම නව සම්මතයට අනුකූලවීමේ කාර්යය සඳහාම පමණක් කිසියම් පරිශ්‍රයක නැවත විදුලි රැහැන් ඇදීමක් අවශ්‍ය නොවන අතර දැනට තිබෙන විදුලි රැහැන් ඇදීම එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසාන වන තෙක් තිබීමට ඉඩ දෙන බවට කොමිෂන් සභාව යෝජනා කරයි.

(iv) මාරුවීමේ කටයුතු: දැනටමත් තිබෙන කෙවෙනියක් වෙනුවට සම්මත ජී වර්ගයේ කෙවෙනියක් භාවිතා කරන පාරිභෝගිකයින්ට එහි භාවිතා කිරීමේ සීමාවන් හා ආරක්ෂක අවශ්‍යතාවන් විස්තර කරන විශේෂ නෙරා ඇති සලකුණු සහිත ජී වර්ගයේ කෙවෙනියක් මිල දී ගැනීමට හැකිවන බවට කොමිෂන් සභාව යෝජනා කරයි. මෙම විශේෂයෙන් සලකුණු කරන ලද කෙවෙනිය 2017 මැයි 1වැනි දින සිට වසර 20ක් අවසාන වන තෙක් මිල දී ගැනීමට තිබේ.

(v) භාවිතාකරන්නන්ට උපදෙස්: කෙවෙනි නිවැරදි ප්‍රමාණයේ රැහැන්වලින් රැහැන් ඇද ඇති බවටත් යෝග්‍ය විලායකයකින් හෝ පරිපථ කඩනයකින් (**circuit breaker**) ආරක්ෂා කර ඇති බවටත් සහතික කර ගැනීම සඳහා 2017 මැයි 1වැනි සිට අලෙවි කිරීමට නියමිත ජී වර්ගයේ සියලුම කෙවෙනිවල උපදෙස් පත්‍රිකාවක් ඇතුලත් විය යුතු බවට හෝ ඒවායේ පෙට්ටිය මත උපදෙස් මුද්‍රණය කර තිබිය යුතු බවට කොමිෂන් සභාව යෝජනා කරයි.

(vi) ඇඩප්ටර **Adaptors**): ("බහු-කෙවෙනි" ලෙස පොදුවේ හඳුන්වන) ආරක්ෂාවට හානිකර වන ඇඩප්ටර 2016 මැයි 01වැනි දින සිට තහනම් කිරීමට සහ 2017 මැයි 01වැනි දින සිට ඒවායේ අලෙවිය තහනම් කිරීමට කොමිෂන් සභාව යෝජනා කරයි.

(vii) විස්තාරණ රැහැන් (**Extension cords**)ඃ අනාරක්ෂිත විස්තාරන රැහැන් හා ආවරණ රහිත දුර්වල ස්පර්ශක ඇති බහු-කෙවෙනි (**multiple sockets with non-shuttered poor contact**) බහුල ලෙස භාවිතයේ ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. 2016 මැයි 1වැනි දින සිට එවැනි විස්තාරණ රැහැන් ආනයනය තහනම් කිරීමටත් 2017 මැයි 01වැනි දින සිට ඒවායේ අලෙවිය තහනම් කිරීමටත් කොමිෂන් සභාව යෝජනා කරයි. මෙම කාර්යය සඳහා විස්තාරණ රැහැන් සම්බන්ධයෙන් නව ප්‍රමිතියක් නිවේදනය කරනු ඇත.

(vii) කූරු දෙකේ පේනුඃ පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව කූරු දෙකක පේනු ඇති උපකරණ සඳහා එම උපකරණය තුළ ද්විත්ව පරිවාරක යෙදීමක් සහ සම්බන්ධ කිරීමේ රැහැන් තිබීමට අවශ්‍ය වේ. කෙසේවුව ද යෝජිත ජී වර්ගයේ සම්මතය සඳහා කූරු දෙකේ පේනු නොගැලපෙනු ඇත. එබැවින් 2016 මැයි 01වැනි දින සිට අනුමත ද්විත්ව පරිවාරක යෙදීම සමඟ රට තුළට ආනයනය කරන හෝ රට තුළ නිෂ්පාදනය කරන උපකරණ ජී වර්ගයේ කෙවෙනි සඳහා පහසුවෙන් සවි කළ හැකි වන පරිදි සම්මතවල දක්වා ඇති ලෙස එම උපකරණවල තුන්වැනි කූරක් ද තිබිය යුතු බවට කොමිෂන් සභාව යෝජනා කරයි.

2015 - 2034 දිගු කාලීන උත්පාදන සැලැස්ම පිළිබඳ මහජන අදහස් විමසීම

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17 (ආ) වගන්තිය සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 (ඹ) වගන්තිය කොමිෂන් සභාව මගින් කිසියම් ප්‍රධාන ප්‍රතිපත්ති තීරණ ගැනීමට පෙර මහජන අදහස් විමසීම අනිවාර්ය කර ඇත. එබැවින් (සංශෝධිත) 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43වැනි වගන්තිය යටතේ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා එනම් ලංකා විදුලිබල මණ්ඩලය මගින් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ 2015-2034 දීර්ඝ කාලීන උත්පාදන සැලැස්ම පිළිබඳ මහජන අදහස් ලබා ගන්නා ලදී.

දැනට ඇති උත්පාදන පද්ධතිය, අනාගත ඉල්ලුම, යෝජිත ඉල්ලුම්කාර බලශක්ති සැපයුම් ශිල්ප ක්‍රම, ඒවායේ පිරිවැය හා කාර්යක්ෂමතා පරාමිතීන්, සැලැස්ම සඳහා භාවිතා කළ විශ්වාසනීයත්වය පිළිබඳ නිර්ණායක, ඉන්ධන මිල පුරෝකථනය, වට්ටම් අනුපාතය ආදිය පිළිබඳ විස්තීරණ දැක්මක් වාර්තාව මගින් සපයයි. බලපත්‍රලාභීන්, පරිසරවේදීන් හා ජනතාවගේ සාමාජිකයින් ඇතුළු උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වවලින් අදහස් ලැබුනි. මෙම අදහස් සහ කොමිෂන් සභාව හඳුනාගත් ඇතැම් ගැටළු සලකා බලමින් හඳුනාගත් ගැටළු නිවැරදි කිරීම සඳහාත් දීර්ඝ කාලීන උත්පාදන සැලැස්ම කොමිෂන් සභාව වෙත නැවත ඉදිරිපත් කරන ලෙසටත් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා සිටීමට තීරණය කරන ලදී.

විදුලිබල ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ ස්වාධීන නියාමකයා වශයෙන් සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ පැවරී ඇති අධිකාරිය යටතේ මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන ඉලක්කයකි. එබැවින් කොමිෂන් සභාව රට තුළ විදුලි සැර වැදීම් අඩු කිරීමට හා අවම කිරීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදීම් විශ්ලේෂණය (වාර්තාව) අනාවරණය කළ පරිදි ශ්‍රී ලංකාවේ වසරකට වාර්තා වන විදුලි සැර වැදීම් සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගනී. 2020 වසර වන විට විදුලි සැර වැදීම්වලින් සිදු වන මරණ සංඛ්‍යාව වසරකට මරණ 20කට වඩා අඩු කිරීමේ ඉලක්කය ඇතිව කොමිෂන් සභාව රට තුළ ඉහත සඳහන් කළ හානිකර තත්ත්වය මඟහැරීම සඳහා විවිධ පියවර ගෙන ඇත.

දත්තවලට අනුව 2012 වසරේ දී විදුලි සැර වැදීම් හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව 180ක් පමණ වාර්තා වූ අතර 2014 වසරේ දී මෙම අගය 73 දක්වා අඩු විය. 2015 වසරේ දී මරණ සංඛ්‍යාව 96ක් දක්වා යළිත් වැඩි වී ඇත.

විදුලි රැහැන් ආසන්නයේ ගොඩනැගිලි ඉදිකිරීම වැළැක්වීමේ යාන්ත්‍රණය

කොමිෂන් සභාව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව සමඟ බද්ධව වැඩකටයුතු කිරීම ආරම්භ කරන ලද අතර ශ්‍රී ජයවර්ධනපුර නගරය විදුලිබල ආරක්ෂාව සම්බන්ධයෙන් ආදර්ශ නගරයක් ලෙසට ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව කොමිෂන් සභාව ඔබේසේකරපුර ප්‍රදේශයේ සංචාරය කළ අතර විදුලි රැහැන් හා ඉදිකිරීම් අතර පැවතිය යුතු අවම පරතරය උල්ලංඝනය කළ නිවාස පරිශ්‍ර පරීක්ෂා කරමින් අවම විදුලි රැහැන් ඉඩකඩ උල්ලංඝනය පිළිබඳව ඔබේසේකරපුර ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය. අවම විදුලි රැහැන් ඉඩකඩ උල්ලංඝනය කර ඉදිකළ සියලුම නිවාස ඉවත් කිරීමට තීරණය කරන ලදී. කොමිෂන් සභාව ජනතාව නැවත පදිංචි කරවීම සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සහ යූඑස්ඩීඒ සමඟ රැස්වීම් පැවැත් වූ අතර ක්‍රියාවලිය අඛණ්ඩව කර ගෙනයාම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවට වැඩසටහන භාර දෙන ලදී.

මෙයට අතරව කොමිෂන් සභාව ලංකා විදුලි පුද්ගලික සමාගම හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාලය සමඟ එක්ව පාසැල්වල විදුලි පද්ධතියේ ඇති විද්‍යුත් අඩුපාඩු හඳුනාගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ පාසැල් 21ක් අධීක්ෂණය කළ අතර මහනගර සභාවේ ඇති අරමුදල්වලින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා උපදෙස් දෙන ලදී.

බලපත්‍රලාභී ප්‍රදේශ පහක ගෘහස්ථ ආරක්ෂාව පරීක්ෂා කිරීම සඳහා වූ විස්තීරණ සමීක්ෂණය

බොහොමයක් විදුලි සැර වැදීම් පිළිබඳව බලපත්‍රලාභියාට වාර්තා නොවන බැවින් තොරතුරු එක්රැස් කිරීමේ වඩාත් කාර්යක්ෂම ක්‍රමය වන්නේ පොලිස් දෙපාර්තමේන්තුව හරහා වන බවට හඳුනා ගන්නා ලදී. ඒ අනුව 2008 සිට 2012 කාල සීමාව තුළ සිදු වූ විදුලි සැර වැදීම් 593ක් පිළිබඳ තොරතුරු පොලිස් දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාවට ලබා දෙන ලදී.

වර්ෂයකට සාමාන්‍යයෙන් විදුලි සැර වැදීම් 180ක් සිදු වන බවට මෙම විදුලි සැර වැදීම් පිළිබඳ දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූ අතර කටුගස්තොට පොලිස් වසම තුළ වැඩිම විදුලි සැර වැදීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත. මේවා අතුරින් විදුලි සැර වැදීම් සියයට 36කට පමණ ගෘහාශ්‍රිත ස්ථානවල ශේෂ ධාරා මෙවලම් (**Residual Current Devices - RCD**) නොමැතිවීම හෝ ක්‍රියාවිරහිතවීම හේතු වී ඇත. මෙම සන්දර්භය තුළ කොමිෂන් සභාව මඟින් ලංකා විදුලිබල මණ්ඩලයේ කටුගස්තොට ප්‍රදේශය තුළ නියමු සමීක්ෂණයක් පවත්වන ලදී. එම සමීක්ෂණයේ සොයා ගැනීම් පහත දැක් වේ.

■ ශේෂ ධාරා මෙවලම් තිබීම සහ පාරිභෝගිකයින්ගේ ආදායම් මට්ටම අතර කිසිදු සම්බන්ධතාවක් නොමැති බව.
■ ශේෂ ධාරා මෙවලම් ඇත්තේ පාරිභෝගිකයින්ගෙන් අඩක් පමණ ප්‍රමාණයකට පමණි බව.
■ 180 සහ ඊට වැඩි බලශක්ති කාණ්ඩයට අයත් වන පාරිභෝගිකයින් ශේෂ ධාරා මෙවලම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වයි. කෙසේවුව ද ඔවුන් සිය ශේෂ ධාරා මෙවලම් පරීක්ෂා කිරීමේ දී අනෙක් පාරිභෝගිකයින්ට වඩා ඉදිරියෙන් සිටින බව.

වක්‍ර සට්ටනයට එරෙහි ආරක්ෂාව, ඍජු සට්ටනයට එරෙහි අනුපූරක ආරක්ෂාව සහ ගිනි හා තාප බලපෑම්වලට එරෙහිව ආරක්ෂාව ඇතුළු විදුලි සවිකිරීම්වල දී මතු විය හැකි නිශ්චිත අන්තරායන්වලට එරෙහිව ආරක්ෂාවක් සැපයීම සඳහා ශේෂ ධාරා මෙවලම් භාවිතා කරනු ලබන බැවින් මෙම තත්ත්වය ඉතාම තැතිගන්වන සුළු තත්ත්වයකි.

එබැවින් කොළඹ උතුර, ගාල්ල (ලංකා විදුලිබල මණ්ඩල හා ලංකා විදුලි පුද්ගලික සමාගම යන දෙකේම), යාපනය, නුවරඑළිය හා අනුරාධපුරය යන බලපත්‍රලාභී ප්‍රදේශ පහක ගෘහස්ත ආරක්ෂාව පරීක්ෂා කිරීම සඳහා විස්තීරණ සමීක්ෂණයක් පවත්වන ලදී.

නුවරඑළියෙන් එක්රැස් කළ දත්ත විශ්ලේෂණය කළ අතර ගාල්ල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල දත්තවලින් සියයට අනූවක් විශ්ලේෂණය කරන ලදී. කොළඹ උතුර ප්‍රදේශයෙන් සියයට 80ක නියැදි දත්ත එක්රැස් කරන ලද අතර යාපනය දිස්ත්‍රික්කයෙන් සියයට හැටක දත්ත එක්රැස් කරන ලදී.
කොමිෂන් සභාව මගින් අවසාන වාර්තාවේ ව්‍යුහයක් සකස් කර තිබෙන අතර එම වැඩකටයුතු 2016 වර්ෂය සඳහා ඉදිරියට ගෙන යන ලදී.

වගුව 01 : විදුලි සැර වැදීම් සංඛ්‍යාව (වාර්ෂික පදනම)

වර්ෂය	විදුලි සැර වැදීම් සංඛ්‍යාව
2008	103
2009	108
2010	122
2011	119
2012	180
2013	76
2014	73
2015	95

ප්‍රස්තාරය 01 : විදුලි සැර වැදීම් සංඛ්‍යාව (වාර්ෂිකව)



නව ආරක්ෂක රෙගුලාසි අනුව ආරක්ෂාව පිළිබඳ සිදුවීම් වාර්තා කිරීම සඳහා වූ දත්ත සමුදාය

විදුලිබල ආරක්ෂාව සම්බන්ධ රෙගුලාසි (1956 අතිරේක ව්‍යවස්ථාකරණය) යටතේ නිශ්චිතව දක්වා ඇති සහ යෝජිත විදුලිබල ආරක්ෂක ගුණාත්මකභාවය සහ අඛණ්ඩතා රෙගුලාසිවල (2014) විධිවිධාන අනුව සිදුවීම් පිළිබඳව දැනුම්දීම සඳහා කොමිෂන් සභාව මඟින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය පාදක මෙවලමක් ගොඩනඟන ලදී.

කිසියම් තැනැත්තෙක්ගේ මරණය, කිසියම් තැනැත්තෙක්ට තුවාල සිදුවීම, කිසියම් ගින්නක් හෝ පිපිරීමක් එමඟින් හඳුනා ගෙන ඇති අවස්ථා වර්ගවලට ඇතුලත් වේ.

රෙගුලාසිවලට අනුව බලපත්‍රලාභීන් විසින් කොමිෂන් සභාව මඟින් න්ශ්චිතව දක්වා ඇති ආකාරයට මෙම සිදුවීම් පිළිබඳව කොමිෂන් සභාවට දැනුම්දීම කළ යුතුය.

මෙම ව්‍යායාමයේ පළමු අදියර ලෙස කොමිෂන් සභාව අනතුරු සම්බන්ධ තොරතුරු ඉලෙක්ට්‍රොනිකව යොමු කිරීම සඳහා අන්තර්ජාල වෙබ් අඩවි පාදක සිදුවීම් වාර්තා කිරීමේ ක්‍රමයක මූලික අනුවාදයක් ගොඩනඟා ඇත. ඉහත සඳහන් කළ මෘදුකාංගයේ පළමු අනුවාදයේ කටයුතු අවසාන කරමින් සහ ඒ සඳහා අධිකාරය පැවරීමේ කටයුතු සිදු කරමින් ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය සමඟ ඇති කර ගන්නා සාකච්ඡාවලට පසුව සහ නියම කිරීමේ මූලික අදියරේ දී මතු විය හැකි තාක්ෂණික දෝෂ නිවැරදි කරමින් පද්ධතියේ විධිමත් නිල අධිකාරිය පැවරීම සිදු කරනු ඇත.

සෞඛ්‍ය හා ආරක්ෂක දර්ශක සකස් කිරීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සියලුම විදුලිබල බලපත්‍රලාභීන්ගේ අදාළ බලපත්‍රවල 16වැනි කොන්දේසිය අනුව ඔවුන්ගේ විද්‍යුත් ආරක්ෂක කාර්යසාධනය විධිමත් කිරීමේ පරමාර්ථය ඇතිව විදුලිබල බලපත්‍රලාභීන් සඳහා සෞඛ්‍ය හා ආරක්ෂක දර්ශක සකස් කිරීමට ව්‍යාපෘතියක් දියත් කරන ලදී.

යෝග්‍ය සෞඛ්‍ය හා ආරක්ෂක දර්ශක සහ සියලුම විදුලිබල බලපත්‍රලාභීන්ගේ ආරක්ෂණ කාර්යසාධනය ඇගයීම සඳහා වූ ක්‍රමවේද සකස් කිරීම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය විය.

ක්‍රියාවලියේ දී භාවිතා කරනු ලබන මිනුම් සහ උප-මිනුම් පිළිබඳ විස්තර සමඟ ආරක්ෂක සූචිය සහ උප-දර්ශක ගණනය කිරීමේ ක්‍රමවේදය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමක් පවත්වන ලදී.

2015 වර්ෂය අවසානයේ දී ක්‍රමවේදය අවසන් කරන ලද අතර සකස් කරන ලද දර්ශකයේ ආරක්ෂක කාර්යසාධනය අනුව බලපත්‍රලාභීන් විසින් 2016 වසරේ සිට ඉදිරියට ආරක්ෂක සංඛ්‍යාලේඛණවලට අනුකූලවිය යුතු වන අතර ඒවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය.

"විදුලිබලය ආරක්ෂාකාරී ලෙස භාවිතා කිරීම" - දැනුවත් කිරීමේ වැඩසටහන්

කොමිෂන් සභාව විද්‍යුත් ආරක්ෂාව පිළිබඳ අධ්‍යාපනය ලබාදීම සඳහා පාසැල් 18ක දී දැනුවත් කිරීමේ වැඩසටහන් 18ක් ද ජාතික අධ්‍යාපන ආයතනයේ දී දැනුවත් කිරීමේ වැඩසටහන් 12ක් ද, ශ්‍රී ලංකා පොලීසියේ දී සහ දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 18ක් ද පවත්වන ලදී.

තව ද කොමිෂන් සභාව මඟින් විවිධ සංවිධානවල (බෙන්තොට ප්‍රදේශීය සභාව, මදුරාවල ප්‍රදේශීය ලේකම් කාර්යාලය) ඉල්ලීම පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය.

මේවාට අමතරව විදුලි ආරක්ෂක ක්‍රමවේද පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා කොමිෂන් සභාව පාසැල් ළමුන් අතර විදුලි ආරක්ෂාව පිළිබඳ තරගයක් ද පවත්වන ලදී. තව ද කොමිෂන් සභාව පොදු ස්ථානවල සවි කළ විශාල තිර භාවිතා කරමින් විද්‍යුත් ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ දැන්වීම් ප්‍රදර්ශනය කරන ලද අතර පුවත්පත් හරහා ද මහා පරිමාණයේ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී.

සෑම දැනුවත් කිරීමේ වැඩසටහනකදීම විද්‍යුත් ආරක්ෂාව පිළිබඳ (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් යුත්) පත්‍රිකා බෙදාහරින ලදී

රෙගුලාසි/ රීති/ ක්‍රියාපටිපාටීන්/ සංග්‍රහ/ ක්‍රමවේද/ මාර්ගෝපදේශ

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට සහ ඒ යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර අනුව විදුලිබල සැපයුමේ හා මන් කියවීමේ සේවාවල ආරක්ෂාව, ගුණාත්මකභාවය, අඛණ්ඩතාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් ප්‍රමිති ඇති කිරීමට සහ බලාත්මක කිරීමට රීති, සංග්‍රහ, ප්‍රමිති සහ ක්‍රමවේද ආකාරයෙන් වූ නියාමන මෙවලම් අවශ්‍ය වේ.

මෙම ඉලක්ක අත්කර ගැනීම සඳහා 2015 වසර තුළ දී කොමිෂන් සභාව මගින් ඉල්ලුම් අංශ කළමනාකරණය, ආරක්ෂාව හා ගුණාත්මකභාවය, වෙළඳ ගිවිසුම් සම්මුති වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු ක්‍රියාවට නංවන ලදී. විදුලිබල කර්මාන්තය තුළ කොමිෂන් සභාවේ නියාමන කාර්යභාරය ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම වෙනුවෙන් මෙම කාලපරිච්ඡේදය තුළ දී පහත දැක්වෙන මුල්පිරීම් ක්‍රියාත්මක කරන ලදී.

බලපත්‍රලාභීන් සඳහා වූ නියාමන වගවීම පිළිබඳ මාර්ගෝපදේශ

දිවයිනේ විදුලිබල කර්මාන්තයේ තාක්ෂණික, ආරක්ෂක හා ආර්ථික නියාමකයා වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අවසර දෙන ගාස්තු තීරණය කිරීම සහ බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනය අධීක්ෂණය කිරීම ඇතුළු දනට ඇති සහ අනාගත නියාමන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තොරතුරු අවශ්‍ය කරයි.

කොමිෂන් සභාව මගින් ප්‍රදානය කරනු ලබන විදුලිබල උත්පාදන බලපත්‍ර, විදුලිබලය සම්ප්‍රේෂණ හා තොග සැපයුම් බලපත්‍ර, විදුලිබලය බෙදාහැරීමේ හා සැපයීමේ බලපත්‍ර සම්බන්ධයෙන් සැලකීමේ දී බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යවස්ථාපිත ගිණුම්වලට වඩා වඩාත් විස්තීරණ හෝ වෙනස් වන සහ කොමිෂන් සභාව මගින් නිශ්චිත කළ කිසියම් විස්තර ඇතුලත් හා කිසියම් ආකෘතියක වූ ගිණුම්කරන තොරතුරු කොමිෂන් සභාව මගින් ඉල්ලා සිටිය හැකිය.

වර්තමානයේ දී බලපත්‍රලාභීන් ඉදිරිපත් කරන ව්‍යවස්ථාපිත ගිණුම්වල නියාමන කාර්යය සඳහා ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් නොවන බැවින් සහ බලපත්‍රලාභීන් අතර සැසඳිය නොහැකි බැවින් විදුලිබලය සැපයීමේ දී දූරු පිරිවැය/ අයක්‍රමවල සාධාරණත්වය සහ විදුලිබල අංශයේ ගාස්තු අඩු කිරීම ඇතුළු එහි කොමිෂන් සභාවේ නියාමන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා නියාමන ගිණුම් සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

ඒ අනුව කොමිෂන් සභාව දේශීය හා විදේශීය විද්වතුන්ගේ උපදේශන සේවා ලබාගත් අතර නියාමන ගිණුම් සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ ගොඩනගන ලදී. කොමිෂන් සභාව මෙම කරුණ සම්බන්ධයෙන් අන්තර්කාලීන වාර්තාව නිමා කළ අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ අදහස් ද විමසීය.

විදුලිබල වෙළඳ කටයුතු පිළිබඳ රෙගුලාසි

(සංශෝධිත) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව උත්පාදකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන විදුලිබල ප්‍රසම්පාදන සඳහා අවසර ලත් එකම පාර්ශ්වය වන්නේ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙක් වන ලංකා විදුලිබල මණ්ඩලය පමණි. 2009 අංක 20 දරන එකී පනතේ 43වැනි වගන්තිය අනුව විදුලිබලය උත්පාදන ධාරිතාව මිල දී ගැනීම සඳහා නිර්දේශිත මිල අවම පිරිවැය මූලධර්මයට ගැලපෙන බවට කොමිෂන් සභාව සෑහීමකට පත් විය යුතුය. විදුලිබලය සම්ප්‍රේෂණ හා තොග සැපයුම් බලපත්‍රලාභියාට අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වලට සහ විදුලිබලය අලෙවි කිරීමේ ගිවිසුම්වලට එළැඹිය යුතුය.

එකී පනතේ 56 (1) (අ) වගන්තිය අනුව බලපත්‍රලාභීන් අතර සුදුසු විදුලිබල වෙළඳ කටයුතු සඳහා ඉඩදීමට සහ එවැනි වෙළඳ කටයුතු ඇති කිරීමට රෙගුලාසි ඇති කළ හැකිය.

ඉහත සඳහන් කළ සියලුම කරුණු සැලකීමේ දී සහ බලපත්‍රලාභීන් අතර සුදුසු විදුලිබල වෙළඳාම් කටයුතු සඳහා අවසර දීම හා ඒවා ඇති කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව (විදේශී හා දේශීය) උපදේශක සේවාවන් ප්‍රසම්පාදනය කළ අතර අන්තර්කාල වාර්තාව නිමා කර, රෙගුලාසි කෙටුම්පත් කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ අදහස් විමසීය. මෙම රෙගුලාසි මඟින් විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම් හා විදුලිබලය අලෙවි කිරීමේ ගිවිසුම්වල වර්ගය හා අන්තර්ගතය නිශ්චය කරනු ඇත.

අයක්‍රම පැණවීම පිළිබඳ ප්‍රතිපත්ති උපදේශය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව පාරිභෝගිකයින් සඳහා ලබා දිය හැකි වඩාත් පිරිමැසුම්දායක හා කාර්යක්ෂම සේවාවක් සහතික කිරීම පිණිස බලපත්‍රලාභීන් සහ වෙනත් විදුලිබල කටයුතු මගින් පණවනු ලබන අයක්‍රම සහ වෙනත් ගාස්තු නියාමනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ඇත.

ඒ අනුව නිශ්චිත කර්මාන්ත සහ පාරිභෝගික කණ්ඩායම් ඉලක්ක කරගත් සහනාධාර ලබා දෙන අතර විශේෂයෙන්ම අයක්‍රම මට්ටම්වල බලපෑම හා පිරිවැය ප්‍රතික්‍රියක අයක්‍රම අත්කර ගැනීම සඳහා අවසාන පරිශීලක අයක්‍රම සහේතුක කිරීමේ අවශ්‍යතාව ඇතුළු ශ්‍රී ලංකාව තුළ විදුලි බලය භාවිතය සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමට හැකි කරවන ශ්‍රී ලංකාවේ අයක්‍රම පැණවීමේ පරිසරය පැහැදිලි කරන අධ්‍යයනයක් සකස් කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

මෙම අධ්‍යයනය තුළින් විදුලි බලය භාවිතා කිරීම මෙන්ම සුභ සාධනය හා ඵලදායීත්වය අනුව ගත් කළ (ගෘහස්ථ, ආගමික, කාර්මික, හෝටල හා පොදු කාර්යයන් ආදී) වෙනස් පාරිභෝගික කණ්ඩායම් මත අයකුම ඇති කරන බලපෑම මෙන්ම රජයේ වඩාත් පුළුල් සංවර්ධන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ කරුණු මගින් ඇති කරන බලපෑම අවබෝධ කර ගැනීම ඉලක්ක කරයි.

කොමිෂන් සභාව මගින් අධ්‍යයනයේ යොමු කිරීමේ අනුදේශ සහ ඒ සම්බන්ධයෙන් අදහස් පළ කරන ලෙසට ඉල්ලා සිටි පාර්ශ්වකරුවන්ගේ අවසාන ලැයස්තුව සකස් කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂය සඳහා ද ඉදිරියට ගෙන යනු ඇත.

විදුලිබල සැපයුමක් ඉල්ලා සිටින තැනැත්තෙක් හට බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් විදුලිබල රැහැන, පිරියත හෝ සැපයුම ලබාදීමේ දී දැරූ වියදම් එකවර මුළුමනින්ම ගෙවීමට ප්‍රමාණවත් මුදල් නොතිබෙන බවට නිශ්චය කර ගැනීමට බෙදාහැරීමේ බලපත්‍රලාභියෙක්ට අවශ්‍ය කරන තොරතුරු පිළිබඳ මාර්ගෝපදේශ

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 27වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව, බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් නව සම්බන්ධතාවක් ලබාදීමට දරන වියදම් ගෙවීමට ප්‍රමාණවත් මුදල් නොමැති පාරිභෝගිකයෙක් හඳුනා ගැනීම සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් භාවිතා කළ යුතු තොරතුරු සහ සම්මත අයකුම ගිවිසුම ප්‍රකාරව බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයකුම හා වෙනත් ගාස්තු සමග එවැනි වියදම් සාධාරණ මාසික වාරිකවලින් ආපසු ලබාදීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නියම කළ හැකිය.

ඒ අනුව කොමිෂන් සභාව මගින් ලංකා විදුලිබල පනත මණ්ඩලයෙන් සහ ලංකා විදුලි පුද්ගලික සමාගමෙන් තොරතුරු විමසන ලද අතර පාරිභෝගික උපදේශන කමිටුව ඇතුළු මහජන අදහස් විමසීමක් පවත්වන ලදී. පසුව කොමිෂන් සභාව මගින් යෝජිත මාර්ගෝපදේශ නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලදී.

විදුලිබලය (සම්ප්‍රේෂණය) කාර්යසාධන ප්‍රමිති පිළිබඳ රෙගුලාසි

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් විදුලිබලය තොග අලෙවිය සම්බන්ධයෙන් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් අත්කර ගත යුතු කාර්යසාධනයේ ප්‍රමිති පිළිබඳ රෙගුලාසි නියම කළ හැකිය.

ඒ අනුව මෙම රෙගුලාසි, විදුලිබලය (බෙදාහැරීමේ) කාර්යසාධන ප්‍රමිති රෙගුලාසිවලට අනුකූල විය යුතුය.

කොමිෂන් සභාව මෙයට පෙර සකස් කළ (බෙදාහැරීමේ) කාර්යසාධන ප්‍රමිති මත පදනම්ව ප්‍රමිතිවල ස්වභාවය හා විෂයපථය සම්බන්ධයෙන් සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සමග සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව විදුලිබලය (සම්ප්‍රේෂණ) කාර්යසාධන ප්‍රමිති පිළිබඳ රෙගුලාසි සකස් කර 2015 ජුලි 02වැනි දින විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයාට නිර්දේශ කරන ලදී.

නව උත්පාදන පිරියතක් ප්‍රසම්පාදනය කිරීම සහ දැනට පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීම පිළිබඳ රීති

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව කොමිෂන් සභාවට සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් නව උත්පාදන පිරියතක් ගොඩනැගීමට හෝ දැනට පවතින උත්පාදන පිරියතක් පුළුල් කිරීමට ටෙන්ඩර කැඳවීම සඳහා අවශ්‍ය කරන ප්‍රසම්පාදනය ආශ්‍රිත රීති නියම කළ හැකිය.

කොමිෂන් සභාව විසින් රීතිවල අවසාන කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

(ඉංග්‍රීසි) රීති කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද අතර ඒවා සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීමේ අදියරේ පවතී. මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු 2016 වර්ෂයට ද ඉදිරියට ගෙන යන ලදී.

විදුලිබල සැපයුමක් සඳහා කෙරෙන ඉල්ලුමක් සමග ඉදිරිපත් කළ යුතු තොරතුරු පිළිබඳ රෙගුලාසි

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් විදුලිබල සැපයුමක් ඉල්ලා සිටින කිසියම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු විසින් අදාළ බෙදාහැරීමේ බලපත්‍රලාභියා වෙත සැපයිය යුතු තොරතුරු පිළිබඳ රෙගුලාසි නියම කළ හැකිය.

කොමිෂන් සභාව මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ අදහස් විමසීමෙන් අනතුරුව බෙදාහැරීමේ බලපත්‍රලාභියාට ලබා දිය යුතු අතිරේක තොරතුරු පිළිබඳ රෙගුලාසි සකස් කර 2014 වසරේ දී විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වෙත නිර්දේශ කරන ලදී.

"සැම දෙනෙක්ම සඳහා විදුලිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම" යන ශීර්ෂය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම අමතන ලද 2010 නොවැම්බර් 02 සහ 2011 ඔක්තෝබර් 17 දිනැති ලිපි පදනම් කර ගෙන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි මෙම රෙගුලාසි සංශෝධනය කරන ලදී.

මෙයට පසුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නිර්දේශය පදනම් කර ගෙන මෙම රෙගුලාසි නැවත සංශෝධනය කළ අතර 2015 ජනවාරි 29වැනි දින අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

අයකුම සමාලෝචනය සඳහා ක්‍රියාමාර්ගය පිළිබඳ රීති

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව කොමිෂන් සභාව විසින් විදුලිබල සම්ප්‍රේෂණය හා තොග අලෙවිය මෙන්ම බෙදාහැරීමේ හා සැපයීමේ අයකුම සමාලෝචනය සඳහා ක්‍රියාදාමයක් නියම කළ යුතුය.

මෙම රීති මඟින් කොමිෂන් සභාව විසින් අයකුම සමාලෝචනය කළ යුතු කාලසටහනක් සහ පාරිභෝගිකයින්ට හා වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සමාලෝචන ක්‍රියාවලියට සහභාගීවීම සඳහා වූ ඉඩකඩ දක්වයි.

අයකුම සමාලෝචනය සඳහා වූ රීති සකස් කර ලංකා විදුලිබල මණ්ඩලයේ, ලංකා විදුලි පුද්ගලික සමාගමේ සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අදහස් පදනම්ව සංශෝධනය කළ අතර 2015 වසරේ දී නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලදී.

විදුලිබල ජාල සංග්‍රහය

කොමිෂන් සභාව ප්‍රදානය කරනු ලබන විදුලිබල සම්ප්‍රේෂණ හා තොග සැපයුම් බලපත්‍රය අනුව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියෙක් විසින් කොමිෂන් සභාව මඟින් අනුමත කළ ජාල සංග්‍රහයක් ගොඩනඟා ක්‍රියාත්මක කිරීම මෙන්ම කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව සකස් කළ සැලසුම් හා මෙහෙයුම් ප්‍රමිතිවලට අනුකූල සම්ප්‍රේෂණ පද්ධති මෙහෙයවීම, සැලැසුම් කිරීම, නඩත්තු කිරීම හා ගොඩනැඟීම සිදු කළ යුතුය.

ප්‍රායෝගිකව උපරිම ආකාරයට විදුලිබල සැපයුම සහතික කරමින් ආරක්ෂක, විශ්වාසදායක හා කාර්යක්ෂම ජාලයක් පවත්වාගෙන යන අතර ජාලයට පිවිසීමේ දී ආර්ථිකමය වශයෙන් විෂමතාවකින් තොරව විනිවිදභාවයකින් ඊට ප්‍රවේශය ලබාදීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධනය, නඩත්තුව හා මෙහෙයුම සඳහා නිර්ණායක, මාර්ගෝපදේශ, මූලික රීති, පටිපාටි, වගකීම්, ප්‍රමිති සහ වගකීම් මෙම ජාල සංග්‍රහයට ඇතුලත් වේ.

ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශනය යටතේ සකස් කළ සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ ජාල සංග්‍රහය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ අතර කොමිෂන් සභාව අනුමැතිය සඳහා විකල්ප ජාල සංග්‍රහයක් ඉදිරිපත් කරන ලදී.

කොමිෂන් සභාව උපදේශකයින්ගේ සේවාවන් ලබා ගෙන ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කළ ජාල සංග්‍රහය සමාලෝචනය කරන ලදී.

ඒ අනුව කොමිෂන් සභාව ලංකා විදුලිබල මණ්ඩලයේ අදහස් විමසීමෙන් අනතුරුව අවසාන වාර්තාව නිමා කරන ලදී.

කාර්මික විදුලිබල කාර්යක්ෂමතාව සඳහා මාර්ගෝපදේශ

බලශක්තිය ලෝකයේ සෑම අංශයක් තුළම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර ප්‍රයෝජනයට ගත හැකි බලශක්ති ප්‍රභවයන්හි දුලබතාව හේතුවෙන් ලෝකය අහිතකර බලශක්ති අර්බුදයකට මුහුණපාමින් ඇත. එබැවින් අනාගත පරම්පරාවන් සඳහා බලශක්තිය ඉතිරි කළ හැකි බැවින් ප්‍රයෝජනයට ගත හැකි බලශක්තිය සෑම කාර්යක්ෂම ආකාරයකින්ම භාවිතයට ගත යුතුය.

බලශක්ති කාර්යක්ෂමතා කෝණයෙන් බලන කළ, කර්මාන්ත ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ග කළ හැකිය. එක් කාණ්ඩයක් කර්මාන්තය තුළ ඇති සියලුම පිරිසැකසුම් යාන්ත්‍රණ බලශක්ති වෘත්තිකයින්ගේ අධීක්ෂණයට යටත් වන ඉතා කාර්යක්ෂම ආකාරයකින් බලශක්ති භාවිතා කරන ඉහළ නිමාවක් ඇති කාණ්ඩය වේ. මේ අතර මෙම බලශක්ති කාර්යක්ෂමතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර නොමැති කර්මාන්ත ද තිබේ. කුඩා පරිමාණ හා මධ්‍යම පරිමාණ කර්මාන්ත මෙම කාණ්ඩය යටතේ හඳුනා ගත හැකිය. මෙම කර්මාන්තවලට බලශක්ති කාර්යක්ෂමතාව හා එහි ප්‍රතිලාභ පිළිබඳ නිසි දැනුමක් නොමැත. කොමිෂන් සභාව මෙම අඩුපාඩුව මඟහැරීමට තීරණය කර ඇති අතර එම ඉලක්කය ඇතිව මෙම කර්මාන්තවල ඇති බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳ තාක්ෂණික දැනුම සහ බලශක්තිය ඉතිරි කර ගැනීම පිණිස ඔවුන් එම බලශක්ති කාර්යක්ෂමතා ක්‍රමවේදවලින් කොපමණ ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන්නේ ද යන්න හඳුනා ගැනීම සඳහා කොමිෂන් සභාව දිවයින පුරා විවිධ කර්මාන්ත රාශියක සංචාර කරන ලදී. එම නිරීක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාව එම කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීමට තීරණය කළ අතර එය මෙම කටයුත්තේ මූලික ප්‍රතිඵලයක් වේ.

කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස සලකා බැලිය යුතු ප්‍රධාන සාධක මෙම මාර්ගෝපදේශයේ ඇතුලත් වේ. ආයතනයේ සේවකයින් විසින් මෙම මාර්ගෝපදේශ බරපතල ලෙස සැලකිල්ලට ගෙන ඔවුන්ගේ දැක්ම හා ආකල්ප වෙනස් කර ගන්නා තෙක් මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම මඟින් පමණක් බලශක්ති කාර්යක්ෂමතාව සහතික කළ නොහැකිය. එබැවින් බලශක්ති කාර්යක්ෂමතාව කෙරෙහි සේවකයින්ගේ මනස, දැක්ම සහ ආකල්ප යොමු වන පරිසරයක් හා වැඩ සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ඉහළ මට්ටමේ අරමුණු තීරණයකරන්නන් සහ උපායමාර්ග තීරණයකරන්නන් ඔවුන්ගේ සැලසුම් වෙනස් කළ යුතුය.

බලශක්ති විගණනය සිදු කිරීම සඳහා කර්මාන්තවල සාමාජිකයින් 12දෙනෙක් තෝරා ගන්නා ලදී. කොමිෂන් සභාව එම තෝරා ගත් කර්මාන්තවල සංචාරය කළ අතර ඔවුන් බලශක්ති නාස්තිය අවම කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂම ක්‍රමවේද උපයෝගී කර ඇති ආකාරය නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාව විසින් බලශක්ති කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගත් අතර දත්ත එක්රැස් කර, ඒ අනුව විශ්ලේෂණය කරන ලදී. මෙම සොයා ගැනීම් භාවිතා කරමින් කොමිෂන් සභාව බලශක්ති කාර්යක්ෂමතා මාර්ගෝපදේශය සකස් කරන ලදී.

අයක්‍රම, සේවා ගාස්තු සහ ආර්ථික කටයුතු

ගෘහස්ථ පරිශීලකයින් සඳහා භාවිතා කරන කාලය සම්බන්ධ අයක්‍රම හඳුන්වාදීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව 2015 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ගෘහස්ථ පාරිභෝගිකයින් සඳහා භාවිතා කරන කාලය සම්බන්ධ අයක්‍රම (TOU) අනුමත කරන ලදී. තෙකලා, ඇම්පියර 30ක් හෝ ඊට වැඩි විදුලි සැපයුමක් පරිභෝජනය කරන ගෘහස්ත පරිශීලකයින් සඳහා විකල්ප අයක්‍රමයක් ලෙස මෙය සකස් කර ඇත.

භාවිතා කරන කාලය සම්බන්ධ අයක්‍රමය මගින් ගෘහස්ත පරිශීලකයින් සඳහා ප්‍රයෝජනවත් වන බවටත් කාර්ය බහුල වේලාවේ දී විදුලිබලය භාවිතය අධෛර්යමත් කරමින් කාර්ය බහුල නොවන වේලාවේ දී විදුලිබලය භාවිතය දිරිමත් කරන බවටත් හඳුනා ගෙන ඇත. විද්‍යුත් මෝටර් රථ ආරෝපණය කිරීම වැනි කාර්යයන් සඳහා කාර්යබහුල නොවන වේලාවේ දී විදුලිය භාවිතා කිරීම දිරිගැන්වීමට මෙමගින් මූලිකවම ඉලක්ක කරයි.

TOU අයක්‍රමයට අනුව වෙන වෙනම මානනය කරනු ලබන හා බිල්පත්ගත කරනු ලබන විදුලිය උපරිම වශයෙන් භාවිතා නොකරන වේලාවන් (2230-0530), දිනය (0530-1830) සහ විදුලිය උපරිම වශයෙන් භාවිතා කරන වේලාවන් (1830-2230) ලෙස වෙනස් වේලා කොටස් තුනක් තිබේ. විද්‍යුත් මෝටර් රථ ආරෝපණය කිරීමේ කාර්යය සඳහා සාධාරණ මුදලක් වන ඒකකයකට **(kWh)** රු. 13ක් පමණක් විදුලිය උපරිම වශයෙන් භාවිතා නොකරන වේලාවල දී අය කරනු ලැබේ. විදුලිය උපරිම වශයෙන් භාවිතා කරන වේලාවල දී ඒකකයකට අයක්‍රමය රු. 54ක් වන අතර කාර්‍ය බහුල නෙවන වේලාවල දී ඒකකයකට රු. 25 බැගින් අය කරනු ලැබේ.

වගුව 02 ඃ කාල පාදක ගාස්තු ක්‍රමය

භාවිතා කරන කාලය	බලශක්ති ගාස්තුව (රුපියල්/ කිලෝවොට්)	ස්ථාවර ගාස්තුව (රුපියල්/ මාසය)
විදුලිය උපරිම වශයෙන් භාවිතා නොකරන වේලාවන්**(meh 2230-0530)**	13.00	540.00
දිනය (පැය 0530-1830)	25.00	
විදුලිය උපරිම වශයෙන් භාවිතා කරන වේලාවන් (පැය 1830-2230)	54.00	

අනුමත ගාස්තු 2015 - ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම

නව විදුලිබල සම්බන්ධතාවක් ලබාදීම, බලශක්ති බිල්පත් මනු සෝදිසි කිරීම, සවිකිරීම සෝදිසි කිරීම, කණු සිටුවීම සහ විදුලි පාරිභෝගිකයෙක්ගේ ඉල්ලීම පරිදි බලපත්‍රලාභීන් විසින් සැපයීමට අවශ්‍ය වෙනත් කිසියම් සේවාවක් වැනි සම්ප්‍රේෂණ හෝ බෙදාහැරීමේ බලපත්‍රලාභියෙක්ට පාරිභෝගිකයෙක්ගෙන් අය කිරීමට අනුමැතිය ඇති ගාස්තු අනුමත ගාස්තුවලට ඇතුලත් වේ.

එවැනි සේවා සැපයීමේ දී බලපත්‍රලාභියාට කිසියම් පිරිවැයක් දැරීමට සිදු වන අතර එබැවින් පාරිභෝගිකයා විසින් ඔවුන්ට ගෙවීම් සිදු කළ යුතු බවට අපේක්ෂා කරයි.

මෙම සේවාවන් සඳහා පාරිභෝගිකයින් බලපත්‍රලාභීන්ට ගෙවනු ලබන ගාස්තු සාධාරණ හා අපක්ෂපාතී වන බවටත් කාර්යපටිපාටිය විනිවිදභාවයකින් යුක්ත බවටත් සහතික කිරීම සඳහා ස්වාධීන තුන්වැනි පාර්ශ්වයක් සහ නියාමන ආයතනය ලෙස කොමිෂන් සභාව විසින් බලපත්‍රලාභියා (අනෙක් සේවාවන් සඳහා) යෝජනා කරනු ලබන අනුමත ගාස්තු අනුමත කරනු ලැබේ.

2010 සැප්තැම්බර් මස කොමිෂන් සභාව හඳුන්වා දුන් ක්‍රමවේදයට අනුව බලපත්‍රලාභියා විසින් අනුමත ගාස්තු සකස් කර ඇත.

කොමිෂන් සභාව හඳුන්වා දී ඇති ක්‍රමවේදය බලපත්‍රලාභියා අනුමත ගාස්තු ඇති කිරීමේ විනිවිදභාවය වැඩිදියුණු කරන අතර පිරිවැයේ සිදු වන වෙනස්කම් නිරූපණය කිරීම සඳහා මෙම ගාස්තු වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

ඒ අනුව, බලපත්‍රලාභීන් අනුමත ගාස්තු සඳහා වූ තම යෝජනා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන අතර කොමිෂන් සභාව ඒවා ක්‍රමවේදයට අනුකූල වන්නේ ද යන්න සොයා බැලීමට ඒවා විශ්ලේෂණය කරයි. අනුමත යෝජනාවක් වසරක කාලයකට වලංගු වේ.

බෙදාහැරීමේ විගණන මාර්ගෝපදේශ ගොඩනැගීම

කොමිෂන් සභාව බෙදාහැරීමේ මෙවලමේ පශ්චාත් සිද්ධි විමසුම, විදුලිබල පද්ධතියේ ව්‍යවහාරයන් සහ බෙදාහැරීම වඩාත් ලාභදායී වන ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී.

ඒ අනුව කොමිෂන් සභාව බෙදාහැරීමේ තීරණගැනීම් සඳහා භාවිතා කළ තාක්ෂණ/ මෙවලම් අඩුපාඩු හඳුනාගත් අතර බෙදාහැරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය තොරතුරු හඳුනා ගනී.

මේ පිළිබඳ අන්තර්කාලීන වාර්තාව ලැබුනු අතර ලංකා විදුලිබල මණ්ඩලයේ අදහස් ලබා ගැනීම සඳහා සාකච්ඡාවක් පැවැත්විය.

මාර්ගෝපදේශ සකස් කිරීම 2016 වර්ෂයේ දී අඛණ්ඩව සිදු වනු ඇත.

සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (NCRE) ව්‍යප්ත කිරීම සහ සම්මත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම (SPPA) පිළිබඳ අධ්‍යයනය

SEA මඟින් ප්‍රදානය කළ බලශක්ති බලපත්‍රය වාණිජ මෙහෙයුම් දිනයේ සිට වසර 20ක් සඳහා පමණක් වලංගු වේ. සම්මත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වල වසර 20ක කාලපරිච්ඡේදය නිමා වූ විට සලකා බැලිය යුතු ප්‍රතිපත්ති විකල්ප සොයා බැලීම මෙම ලිපියේ පරමාර්ථය වේ.

2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 13වැනි වගන්තිය ප්‍රකාරව අදාළ අවශ්‍යතාවන් සපුරාලීමෙන් අනතුරුව නව උත්පාදන පිරියතක් ප්‍රසම්පාදනයට හෝ උත්පාදන ධාරිතාව ව්‍යාප්ත කිරීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වෙත කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කරනු ලැබේ, සංශෝධනය බලාත්මකවීමට පෙර SEA මඟින් අවශ්‍ය කරන බලපත්‍රය නිකුත් කර ඇත. කෙසේවුව ද පිරියතක ධාරිතාව මෙගාවොට් 25ක් ඉක්මවා යන අවස්ථාවල දී ඉහත සඳහන් කළ විධිවිධාන අදාළ නොවන අතර එවැනි අවස්ථාවල දී තරඟකාරී ප්‍රසම්පාදනය අවශ්‍ය වේ. මෙම විධිවිධාන හැරුණු කොට නුදුරු අනාගතයේ දී කල්ඉකුත් වන සම්මත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම් සඳහා විසඳුමක් වන්නේ කුමක් ද සම්බන්ධයෙන් කිසිදු විධිවිධානයක් නොමැත. එබැවින් දැනට ක්‍රියාත්මක වන සම්මත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වල කල්ඉකුත් වූ විට අනුගමනය කළ යුතු කාර්යපටිපාටික විධිවිධාන නොමැත.

ඒ අනුව දැනට පවතින සම්මත විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම් ව්‍යාප්ත කිරීම සඳහා විනිවිදභාවයකින් යුත් යාන්ත්‍රණයක් හරහා NCRE අංශ සංවර්ධනය කිරීමට අධ්‍යයනය සිදු කරන ලදී. අධ්‍යයනය මඟින් බලශක්ති මිල දී ගැනීම සඳහා සාධාරණ මිලක් සහතික කිරීම සහ විමධ්‍යගත උත්පාදනය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අදාළ කර ගත හැකි විකල්ප සොයා බලන අතරතුර NCRE අංශයේ පූර්ණ විභවය එක්රැස් කිරීමේ පරමාර්ථය ඇතිව NCRE අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. 2015/සැප්තැම්බර් වැනි දින අවසාන වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

අනුමත ගාස්තුවල ඇතුලත් කර ඇති බහුලව භාවිතා කරන භාණ්ඩවල මිල ගණන් පිළිබඳ වාර්තාව

කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂක නියාමකයා වේ. දිවයිනේ විදුලිබල කර්මාන්තය ආශ්‍රිත තොරතුරු එක්රැස් කිරීමේ සහ වාර්තා කිරීමේ කාර්යය කොමිෂන් සභාවට පැවරී ඇත.

කොමිෂන් සභාව මඟින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය සඳහා වූ දිගු කාලීන ඉලක්කවලට "2014 වසරේ දී සේවා සපයන්නා විසින් අය කරන ගාස්තු 2020 වසර වන විට මූර්තමය වශයෙන් 10%කින් අඩු කිරීම" (9වැනි ඉලක්කය) ඇතුළු දීර්ඝ කාලීන ඉලක්ක මාලාවක් ඇතුලත් වේ.

බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරන ගාස්තුවල පිරිවැය දක්වනන් හඳුනා ගැනීම සහ එය තුලනාත්මක ආකාරයකින් ඉදිරිපත් කිරීමත් මෙම වාර්තවේ අරමුණ වේ. කොමිෂන් සභාව 2012 වර්ෂයේ සිට බලපත්‍රලාභීන්ගේ අනුමත ගාස්තු අනුමත කරනු ලබන අතර අනුමත ගාස්තු තීරණය කිරීමේ ක්‍රමවේදය 2010 සැප්තැම්බර් මාසයේ දී කොමිෂන් සභාව මඟින් අනුමත කරන ලදී. ඉන් පසුව බලපත්‍රලාභීන්ට එම ක්‍රමවේදය අනුගමනය කිරීමට නියෝග කළ අතර එතැන් සිට ඔවුන් එය අනුගමනය කරයි. ක්‍රමවේදයේ ඇතැම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම් හඳුන්වාදීමේ හැකියාවක් ඇති බවට පසුගිය වසර කීපය තුළ දී කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය.

ඒ අනුව විදුලිබලය බෙදාහැරීමේ ව්‍යාපාරය ආශ්‍රිත "අනුමත ගාස්තු" යටතේ ආවරණය කළ සේවාවල පිරිවැය ප්‍රතිසාධනය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යවහාර සම්බන්ධ තුලනාත්මක විග්‍රහයක් ඇතුලත් වාර්තාව සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී.

බලපත්‍රලාභීන් අතර මිනුම් ලකුණු කිරීම අනුමත ගාස්තු ආශ්‍රිත පිරිවැය පිළිබඳ වාර්තාව

මිනුම් ලකුණු ලෙස එකිනෙක භාවිතා කිරීමේ අරමුණ ඇතිව බලපත්‍රලාභීන් අතර අනුමත ගාස්තු සැසඳීමක් මෙම වාර්තාවේ අන්තර්ගත වේ. බලපත්‍රලාභීන් අතර මිනුම් ලකුණු කිරීම අනුමත ගාස්තු ආශ්‍රිත පිරිවැය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම සම්බන්ධ අභ්‍යන්තර අදහස් කොමිෂන් සභාව විසින් එක්රැස් කරන ලදී. උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අදහස් විමසීම සිදු කළ අතර කොමිෂන් සභාව මගින් අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කළේය. තව ද, බලපත්‍රලාභීන් අතර ගාස්තු තීරණය කිරීමේ වෙනස සහ වෙනත් වැදගත් අංශ මෙම වාර්තාවේ සාකච්ඡා කර ඇත.

අනුමත ගාස්තු පිළිබඳ ජාත්‍යන්තර ව්‍යවහාරය පිළිබඳ වාර්තාව

කොමිෂන් සභාව මගින් ජාත්‍යන්තර ව්‍යවහාරය පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලද අතර මෙම ව්‍යවහාර පිළිබඳව වාර්තාවක් නිකුත් කළේය. විදුලිබලය බෙදාහැරීම සම්බන්ධ "අනුමත ගාස්තු" යටතේ ආවරණය වන සේවා පිරිවැය ප්‍රතිසාධනය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යවහාර සැසඳීමක් මෙම වාර්තාවට ඇතුලත් වේ. අනුමත ගාස්තු තීරණය කිරීම සම්බන්ධ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේද හඳුනා ගැනීමත් ඒ අනුව ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ දී අනුගමනය කරන අනුමත ගාස්තු ක්‍රමවේදය සම්බන්ධයෙන් සිදු කළ හැකි වැඩිදියුණුවීම් ක්ෂේත්‍ර හඳුනා ගැනීමත් මෙම ක්‍රියාකාරකමේ අරමුණ වේ.

ආරෝපණ සහිත සූර්ය ජාල මීටර්කරණය පිළිබඳ පිරිවැය ප්‍රතිලාභ අධ්‍යයනය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට දිවයිනේ විදුලිබල කර්මාන්තය ආශ්‍රිත තොරතුරු එක්රැස් කිරීමේ හා වාර්තා කිරීමේ කාර්යය පැවරී ඇත. තව ද නිවැරදි හා ප්‍රායෝගික ප්‍රතිපත්ති උපදෙස් නිකුත් කිරීමේ ඉලක්කය ඇතිව අනාගත විදුලිබල කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා විදුලිබල කර්මාන්තයේ නව ප්‍රවණතාවන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට හා අධ්‍යයන පැවැත්වීමට ද කොමිෂන් සභාවට වගකීමක් ඇත.

ප්‍රධාන වශයෙන් පරිශ්‍රයක විදුලිබල පිරිවැය අඩු කිරීම සඳහා සහ හරිත පරිසරයක් නිර්මාණය කර ගැනීම සඳහා ජාල මීටර්කරනය සහිත වහල මත සූර්ය විදුලිබලය උත්පාදනය ශ්‍රී ලංකාව තුළ නව ප්‍රවණතාවක් වේ. කෙසේවුව ද බැටරි ගබඩාකරනය සහිත සූර්ය විදුලිබලය ප්‍රධාන ධාරාවක් බවට පත්වීමට ඉඩ තිබේ.

වර්තමාන වෙළඳපොළ මිල සහ වෙනත් විදුලිබල පරාමිතීන් භාවිතා කරමින් පිරිවැය ප්‍රතිලාභ අධ්‍යයනයක් ඇතුළු ගබඩාකරනය සහිත සූර්ය ජාල මීටර්කරණයේ ශක්‍යතාව පිළිබඳව කොමිෂන් සභාව මූලික විශ්ලේෂණයක් සිදු කරන ලදී.

මෙම අධ්‍යයනය සම්බන්ධ දත්ත එක්රැස් කිරීම නිමා කර තිබෙන අතර 2015 ඔක්තෝබර් මාසයේ දී විශ්ලේෂණ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

2013 දී හඳුන්වා දුන් භාවිතා කරන කාලය සම්බන්ධ ගාස්තුවල (TOU) බලපෑම පිළිබඳ අධ්‍යයනය

කාර්ය බහුල වේලාවල දී බලශක්ති ඉල්ලුම අඩු කිරීම සඳහා භාවිතා කරන කාලය සම්බන්ධ ගාස්තු 2011 ජනවාරි 1වැනි දින සිට හෝටල් හා කාර්මික පරිශීලකයින් සඳහා අනිවාර්ය කළේය. 2012 පෙබරවාරි, 2013 අප්‍රියල් සහ 2014 නොවැම්බර් යන මාසවල දී මෙම ගාස්තු සංශෝධනය කරන ලදී.

මෙම අධ්‍යයනය මගින් 2013 අප්‍රියල් 20වැනි දින හඳුන්වා දුන් භාවිතා කරන කාලය සම්බන්ධ ගාස්තු විශ්ලේෂණය කරනු ලැබේ.

උපයෝගීතා ආයතනවල බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් හරහා 2020 වන විට අවම වශයෙන් ගිගාවොට් 250ක බලශක්තියක් සහ මෙගාවොට් 30ක ධාරිතාවක් සංරක්ෂණය කිරීම මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ ඉලක්කයක් ලෙස එහි 2015 ක්‍රියාකාරී සැලැස්මේ හඳුනා ගෙන ඇති අතර මෙම ක්‍රියාකාරකම මෙම ඉලක්කය යටතේ නිශ්චිතව දක්වා ඇත.

ඉහත ඉලක්කය අත්කර ගැනීම පිණිස බලශක්තිය සංරක්ෂණය කිරීම දිරිමත් කරන TOU අයක්‍රම ව්‍යුහය තුළ වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍ර මෙම අධ්‍යයනයෙන් හඳුනා ගන්නා ලදී.

තව ද, විදුලි පාරිභෝගිකයිනගේ කාර්ය බහුල වේලාවල බලශක්ති පරිභෝජන කටයුතු කාර්ය බහුල නොවන වේලාවට මාරු කිරීම සඳහා ඔවුන් දිරිමත් කිරීම සඳහා විවිධ විදුලිබල පාරිභෝගිකයින් සඳහා වූ TOU අයක්‍රම ද අධ්‍යයනයෙන් හඳුනා ගන්නා ලදී.

සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පිරිවැය මිනුම්ලකුණු කිරීම

බලපත්‍රලාභීන්ගේ යෙදවුම් පිරිවැය හෝ නිමැවුම් පිරිවැය ඔවුන්ගේ ජාතික හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් හෝ බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනය සමග සැසඳීමෙන් බලපත්‍රලාභීන්ගේ කාර්යක්ෂමතාව ඇගයීම සඳහා මිනුම්ලකුණු කිරීම සාමාන්‍යයෙන් සිදු කරනු ලැබේ.

පිරිවැය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, සැපයුම් පිරිවැය අඩු කිරීම හා පාරිභෝගික සේවය වැඩිදියුණු කිරීම සඳහා අංශයට තරඟකාරීත්වය හඳුන්වාදීම ලෝකය පුරා සිදු කරන විදුලිබල අංශයේ සංශෝධනවල මූලික අංගයක් වේ. කෙසේවුව ද, පරිපූර්ණ තරඟකාරී වෙළඳපොළක් නිර්මාණය වන තෙක් වෙළඳපොළේ ඒකාධිකාරී ලක්ෂණවලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාව කාර්යසාධනය පාදක රෙගුලාසි නිකුත් කරයි. එසේ කිරීම පිණිස වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා සහ බලපත්‍රලාභීන්ගේ ව්‍යාපාර පිරිවැය (Capex සහ Opex ආශ්‍රිත පිරිවැය) ප්‍රශස්තිකරණයට දිරිගැන්වීම සහ මෙහෙයුම් කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා බලපත්‍රලාභීන්ගේ කාර්යසාධනය වෙනත් බපලපත්‍රලාභීන් සමග මිනුම්ලකුණු කරනු ලැබේ.

මේ පිළිබඳ අන්තර්කාල වාර්තාව අවසන් කළ අතර 2016 වසරේ දී අවසාන වාර්තාව සකස් කිරීම සිදු කළේය.

බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ පිරිවැය (OPEX) මිනුම් ලකුණු කිරීම (සාපේක්ෂ) පිළිබඳ වාර්තාව

විදුලිබල අංශයේ නියාමකයින් විසින් එක් එක් සමාගමේ අනුමත ආදායම නියාමනය කිරීම සඳහා විදුලිබලය බෙදාහැරීමේ සමාගම් මිනුම් ලකුණු කරනු ලැබේ. ප්‍රත්‍යන්ත මිනුම් ලකුණු කිරීමේ ශිල්පක්‍රම මගින් නිපදවනු ලබන සාපේක්ෂ කාර්යක්ෂමතා ලකුණු භාවිතා කිරීමෙන් ප්‍රධාන වශයෙන් මෙය සිදු කරනු ලැබේ. මෙම වාර්තාව ජාත්‍යන්තර නියාමන ආයතනවල භාවිතා කරන ප්‍රමුඛ මිනුම් ලකුණු කිරීමේ ශිල්පක්‍රම කෙරෙහි අවධානය යොමු කරන අතර වර්තමානය වන විට බෙදාහැරීමේ බලපත්‍රලාභීන් පස් දෙනෙක් පමණක් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාව තුළ ඒවායේ අදාළත්වය අගයයි.

බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ කාර්යක්ෂමතාවන්ට අනුව ඔවුන්ගේ අනුමත ආදායම පාලනය කිරීමට ඇති හැකියාව පිළිබඳ නියම කිරීමේ සංඥා ලබා දෙන සාපේක්ෂ කාර්යක්ෂමතා ලකුණු මෙම වාර්තාවෙන් නිපදවා ඇත. නියාමකයා වශයෙන් මෙම ක්‍රම/ ප්‍රතිඵල අනාගත මිල සමාලෝචන සඳහා යෙදවුම් ලෙස ගත හැකිය.

කොමිෂන් සභාව මගින් සාදන ලද මාර්ගෝපදේශ අනුව ශ්‍රී ලංකාවේ තාප විදුලි බලාගාරවල බලශක්ති විගණන ක්‍රියාත්මක කිරීම

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ තාප විදුලි බලාගාරවල බලශක්ති විගණනය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට සහ මාර්ගෝපදේශයට අනුව ඒවායේ උත්පාදන පිරියතවල බලශක්ති විගණන සිදු කිරීමට ක්‍රියාත්මක කරන ලදී.

මේ අනුව උපදේශකයින් විසින් තාප උත්පාදන බලපත්‍රලාභීන්ගේ නිලධාරීන් සහ කොමිෂන් භාවේ අදාළ නිලධාරීන් ඇතුළු නිලධාරීන් 35කගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ තාප විදුලි බලාගාරවල බලශක්ති විගණනය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලද අතර වැඩමුළුවට සහභාගීවූවන්ගේ අදහස් හා මත පදනම්ව මාර්ගෝපදේශයට ඇතැම් සංශෝධනය සිදු කරන ලෙසට ඉල්ලා සිටි අතර උපදේශකයින් විසින් අවසාන විගණන මාර්ගෝපදේශය ඉදිරිපත් කරන ලදී.

කොමිෂන් සභාව සකස් කළ විගණන මාර්ගෝපදේශ අදාළ උත්පාදන බලපත්‍රලාභීන්ට යොමු කිරීමට අපේක්ෂා කරන අතර ඔවුන්ගේ බලගාර තුළ බලශක්ති විගණන පැවැත්වීමට උපදෙස් දී ඇත. අවසාන වශයෙන් බලශක්ති විගණන හරහා හඳුනාගත් අවශ්‍ය කරන බලශක්ති වැඩිදියුණු කිරීම් සිදු කිරීම තුළින් නව උත්පාදන දායකත්වය ජාලයට එකතු කර ගැනීම ඉහළ නැංවිය හැකි වන අතර අවසානයේ දී ජාලයට එකතු වන ශුද්ධ බලශක්ති පිරිවැය අඩුකර ගත හැකි වේ.

විදුලිබලය, සැපයුම සහ සේවා ගුණාත්මකභාවය

විදුලිබල ගුණාත්මකභාවය, සැපයුම් ගුණාත්මකභාවය සහ සේවා ගුණාත්මකභාවය දීර්ඝ කාලීන වශයෙන් කොමිෂන් සභාවට අත්කර ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර ලෙම හඳුනා ගන්නා ලදී. මෙම ප්‍රධාන කාණ්ඩ තුන යටතේ ඉලක්ක හතක් හඳුනා ගෙන වර්ගකරන ලදී.

කොමිෂන් සභාව පහත දක්වෙන මුල්පිරීම් ඔස්සේ ඉහත සඳහන් කළ ඉලක්ක ක්‍රියාත්මක කරන ලදී.

බලශක්ති සූක්ෂම කර්මාන්තවලට සැපයෙන විදුලිබල සේවාවෙහි අනුවර්තීය තත්ත්වයන් මැනීම පිළිබඳ වාර්තාව

අනුවර්තීය තත්ත්වයන් යනු විදුලිබල ගුණාත්මකභාවයේ ප්‍රශ්න මතු කළ හැකි විදුලිබල පද්ධතියක ඇති විද්‍යුත් වෝල්ටීයතාවන් හා ධාරාවන් වේ. රටේ මෑත කාලීන සංවර්ධනය සමඟ විචල්‍ය වේග දක්වන්නන්, ස්වයංක්‍රීය නිපැයුම් පෙළ, පුද්ගලික පරිගණක හා අරේඛීය ඉලෙක්ට්‍රොනික මෙවලම්, විදුලි පද්ධතිවල ඇති විදුලිසංදේශ උපකරණ වැනි කර්මාන්තවල ඇති විදුලිබල ඉලෙක්ට්‍රොනික පාලිත උපකරණවල ඉහළ භාවිතය අනුවර්තීය තත්ත්වයන් ඇති කර තිබේ. විදුලිබල පද්ධති අනුවර්තීය තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස අලාභ ඉහළයාම, උපකරණ රත්වීම හා අක්‍රීයවීම සහ ආරක්ෂක, පාලන හා සන්නිවේදන පරිපථවල බාධා සිදු වේ.

නියාමකයා වශයෙන් කොමිෂන් සභාව මඟින් අනුවර්තීය තත්ත්වයන්ගෙන් තොර විදුලිබල පද්ධතියක් සහතික කිරීම පිණිස සහ බලපත්‍රලාභීන්ගේත් කර්මාන්තවලත් ප්‍රතිලාභය පිණිස විවිධාකාර කර්මාන්ත ක්‍රියාවලි හරහා උත්පාදනය වන අනුවර්තීය තත්ත්වයන් මැනීමට සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම වැඩසටහන යටතේ විවිධ කර්මාන්ත දොළහක අනුවර්තීය තත්ත්වයන් මනින ලද අතර එසේ මනින ලද අනුවර්තීය අගයන් IEEE (519-1992 – IEEE) ප්‍රමිතියේ දක්වා ඇති අනුරූප සීමා සමඟ සසඳන ලදී. මෙම සොදිසිවලට අනුව මෙම සියලුම කර්මාන්ත දොළහ IEEE අනුවර්තීය ප්‍රමිතිවලට අනුකූල වේ.

තෝරාගත් ප්‍රදේශයක නියාමක ව්‍යාපෘතියක් ලෙස ඉහළ SAIDI/SAIFI සඳහා හේතු හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක්

කාල සීමාව මැනීමේ අගයක් වන පද්ධති සාමාන්‍ය විදුලිය ඇනහිටීම් කාලසීමා දර්ශකය (System Average Interruptions Duration Index (SAIDI) සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ පාරිභෝගිකයෙක්ට සේවා නොලැබෙන වාර ගණන අර්ථදක්වන පද්ධති සාමාන්‍ය විදුලිය ඇනහිටීම් වාර දර්ශකය (SAIFI) සම්බන්ධ සිද්ධීන් හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2015 ක්‍රියාකාරි සැලැස්ම යටතේ නියාමක ව්‍යාපෘතියක් ලෙස සිදු කළ සිද්ධි අධ්‍යයනයේ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට මෙම වාර්තාව සකස් කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ 02 බෙදාහැරීමේ කොට්ඨාසයේ බස්නාහිර පළාත් උතුර බෙදාහැරීමේ ජාලයේ මීගමුව බෙදාහැරීමේ බලප්‍රදේශය සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ මීගමුව ශාඛා බෙදාහැරීමේ කලාපය වන 2014 වසර සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ බෙදාහැරීමේ කලාපවල මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

බිල්පත්කරන කළමනාකරණ සැලැස්ම මැනීම

භූගෝලීය සාධකවල විචල්‍යතාවන් මාපක නිවැරදිතාව කෙරෙහි කැපීපෙනෙන බලපෑමක් සිදු කරන්නේ ද යන්න මැනීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මේ අනුව කොමිෂන් සභාව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ ගාල්ල ලෙකෝ මාපක පරීක්ෂාව නිමා කළ අතර අවසාන වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා දත්ත ඉදිරිපත් කරන ලෙසට අදාළ බලපත්‍රලාභීන්ට උපදෙස් දෙන ලදී. කොමිෂන් සභාව නුවරඑළිය, අම්පාර සහ අනුරාධපුරය යන ප්‍රදේශවල මාපක පරීක්ෂා කිරීම ආරම්භ කළ අතර 2016 වර්ෂය සඳහා ද කටයුතු ඉදිරියට ගෙන යන ලදී.

SAIFI, SAIDI (විදුලිබලය ඇණහිටුවන කාලසීමාව) තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන LISS (බලපත්‍රධාරී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය) තුළට ඉලෙක්ට්‍රොනික පුවරු සැලසුම් කිරීම සහ එක්කාසු කිරීම

බෙදාහැරීමේ සංග්‍රහයේ 2.4 වගන්තිය මගින් බෙදාහැරීමේ පද්ධතියට වෝල්ටීයතාව, ස්විච්චිපන්න භාරණය, උපකරණ තක්සේරු කිරීම්, විදුලිබල ගුණාත්මකභාවය, පද්ධති අලාභ, විශ්වාසදායකභාවය හා සැපයුමේ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රමිති ඇති කිරීමට හැකියාව තිබෙන බවට සහතික කරමින් පද්ධතිය සැලසුම් කිරීම බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ (DC) වගකීමක් බවට දක්වයි. තව ද විශ්වාසදායක මට්ටම් ඇගයීම සඳහා කොමිෂන් සභාවට බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් විදුලිබලය ඇණහිටුවන කාලසීමාවන් පිළිබඳ දත්ත කලින් කලට කොමිෂන් සභාවට ලබා දිය යුතුය.

විදුලිබලය බෙදාහැරීමේ කාර්යසාධන ප්‍රමිති පිළිබඳ යෝජිත රෙගුලාසි සමාලෝචනය කිරීමෙන් සහ බෙදාහැරීම් සංග්‍රහ බලාත්මක කිරීමේ හා සමාලෝචන මණ්ඩලය (DCERP) සමඟ සාකච්ඡාවලින් යෙදවුම් ලබා ගැනීමෙන් කොමිෂන් සභාව බලපත්‍රලාභී තොරතුරු භාරදීමේ ක්‍රමය (LISS) හරහා විදුලිබලය ඇණහිටුවන කාලසීමාවන් සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා වූ ආකෘති ගොඩනඟා ඇත. මෙම ආකෘති බලපත්‍රලාභී තොරතුරු භාරදීමේ ක්‍රමයට එකතු කරනු ලැබේ, එබැවින් බලපත්‍රලාභීන්ට අදාළ තොරතුරු ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පහසුවෙන් යොමු කළ හැකි වේ.

වෝල්ටීයතාව මැනීමේ වැඩසටහන සඳහා අවශ්‍ය කරන බඹී (බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රමය) තුළට ඉලෙක්ට්‍රොනික අච්චු සැලසුම් කිරීම හා එක්කාසු කිරීම

බෙදාහැරීමේ සංග්‍රහයේ (DC) 6.4 වගන්තිය මගින් එකී සංග්‍රහයේ දක්වා ඇති ප්‍රමිති අනුව එහි බෙදාහැරීමේ පද්ධතිය සැලසුම් කිරීම, ගොඩනැගීම හා මෙහෙයවීම බෙදාහැරීමේ බලපත්‍රලාභියාගේ (DL) වගකීමක් බවට දක්වයි. බෙදාහැරීමේ සංග්‍රහයේ 6.5.2 වගන්තිය ප්‍රකාශිත බෙදාහැරීමේ වෝල්ටීයතාවල සීමාවන් දක්වයි.
විදුලිබලය බෙදාහැරීමේ කාර්යසාධන ප්‍රමිති පිළිබඳ යෝජිත රෙගුලාසි සමාලෝචනය කිරීමෙන් සහ බෙදාහැරීම් සංග්‍රහ බලාත්මක කිරීමේ හා සමාලෝචන මණ්ඩලය (DCERP) සමඟ සාකච්ඡාවලින් යෙදවුම් ලබා ගැනීමෙන් කොමිෂන් සභාව බලපත්‍රලාභී තොරතුරු භාරදීමේ ක්‍රමය (LISS) හරහා ප්‍රකාශිත වෝල්ටීයතාව සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා වූ ආකෘති ගොඩනඟා ඇත. මෙම ආකෘති බලපත්‍රලාභී තොරතුරු භාරදීමේ ක්‍රමයට එකතු කරනු ලැබේ, එබැවින් බලපත්‍රලාභීන්ට අදාළ තොරතුරු ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පහසුවෙන් යොමු කළ හැකි වේ.

වාර්තාවට කාර්තුව බැගින් අදියර දෙකක් ඇතුලත් විය. පළමු අදියරේ දී බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් එක් එක් කාර්තුවේ පළමු මාසයේ අවසානය වන විට වෝල්ටීයතා මැනීම සඳහා තෝරාගත් ප්‍රදේශවල ලැයිස්තුව වාර්තා කළ යුතුය. දෙවැනි අදියරේ දී බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් පළමු අදියරේ දී වාර්තා කළ පාරිභෝගිකයින් ලැයිස්තුව අතුරින් වෝල්ටීයතා අඩුපාඩු ඇති තොග පාරිභෝගිකයින් ලැයිස්තුව වාර්තා කළ යුතුය.

ලංකා විදුලිබල මණ්ඩලයේ මීගමුව කලාපයේ විදුලිබල ප්‍රතිස්ථාපන කාලය විශ්ලේෂණය කිරීම

මීගමුව ප්‍රදේශය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබලය ප්‍රතිස්ථාපන කාලය විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ඒ අනුව කොමිෂන් සභාව මීගමුව ප්‍රදේශයේ ලංකා විදුලිබල මණ්ඩලයට පැමිණි සියලුම සේවා ඇමතුම් පිළිබඳ දත්ත එක්රැස් කරන ලද අතර එසේ එක්රැස් කළ දත්ත ලැයිස්තුවලට ඇතුලත් කර විශ්ලේෂණය කරන ලදී. කොමිෂන් සභාව අවසාන වාර්තාව සම්පාදනය කිරීමට ආරම්භ කර ඇති අතර මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයට ද ඉදිරියට කර ගෙනයාමට නියමිතය.

බලපත්‍ර ලබා ගැනීම

බලපත්‍ර ප්‍රදානය කිරීමේ කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ දී පුද්ගලික විදුලිබල නිෂ්පාදකයින් සඳහා විදුලිබල උත්පාදන බලපත්‍ර ඇගයීමේ, (විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව) තෝරාගැනීමේ සහ ප්‍රදානය කිරීමේ කාර්යය පැවරී ඇත. එය බලපත්‍රලාභීන් දෙදෙනාගේ (ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ) බෙදාහැරීමේ ක්‍රියාකාරකම් නිරන්තරයෙන්ම අධීක්ෂණය කරන අතර උත්පාදනය හා අලෙවි පිරිවැය පිළිබඳ තොරතුරු මාසිකව ඉල්ලා සිටී.

උත්පාදන බලපත්‍ර ප්‍රදානය කිරීම

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව විදුලිබලය උත්පාදන පිරියතක් පිහිටුවීමට හෝ මෙහෙයවීමට සැලසුම් කරන ඕනෑම පාර්ශ්වයක් විසින් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. දිවයින තුළ නිෂ්පාදිත විදුලිබලයේ ආරක්ෂාව, ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාව සහතික කිරීමට සහ විදුලිබලය උත්පාදනයේ දී අවශ්‍ය ප්‍රමිති නියාමනය කිරීමට ද මෙය අවශ්‍ය වේ. ඒ අනුව රට තුළ විදුලිබලය නිෂ්පාදනය කරන සියලුම පාර්ශ්වයන් සඳහා කොමිෂන් සභාව මගින් උත්පාදන බලපත්‍ර නිකුත් කරනු ලැබේ. ලංකා විදුලිබල මණ්ඩලය විශාලතම උත්පාදන බලපත්‍රලාභියා වේ.

2015 වර්ෂය තුළ දී කොමිෂන් සභාව පහත දැක්වෙන කාණ්ඩ යටතේ විදුලිබල උත්පාදන බලපත්‍ර 71ක් නිකුත් කර ඇත.

වගුව 03 ඃ 2015 වසරේ දී නිකුත් කළ උත්පාදන බලපත්‍ර සංඛ්‍යාව

කාණ්ඩය	2015 වසරේ දී නිකුත් කළ උත්පාදන බලපත්‍ර සංඛ්‍යාව
ජල	63
වෘක්ෂ	05
ජෛවස්කන්ධ - ඝන අපද්‍රව්‍ය	01
සූර්ය	01
සූර්ය තාප	01

බලපත්‍ර සම්බන්ධයෙන් නිදහස් කිරීම්

2015 වර්ෂයේ දී විදුලිබලය උත්පාදනය හා බෙදාහැරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස්වීම අපේක්ෂාවෙන් පාර්ශ්වකරුවන්ගෙන් අයැදුම්පත්‍ර හතක් ලැබුනි.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙන් කොමිෂන් සභාවට පවරන ලද බලතල යටතේ විදුලිබලය උත්පාදනය සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් ඇතැම් පාර්ශ්වයන් නිදහස් කළ හැකිය. එකී පාර්ශ්වය විසින් විදුලිබලය උත්පාදන කරන ආකාරය හෝ බෙදාහරින ආකාරය සැලකිල්ලට ගැනීමෙන් පසුව මෙම නිදහස් කිරීම් සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

ඒ අනුව 2015 වර්ෂයේ දී පාර්ශ්වයන් දෙකකට නිදහස් කිරීම් දෙන ලදී.

උත්පාදන කාර්යසාධන වාර්තාව

ශ්‍රී ලංකාවේ උත්පාදන ඒකකවල සහ විදුලිබල ජාලයේ තොරතුරු සාරාංශයක් සහ කාර්යසාධන සංඛ්‍යාලේඛණ උත්පාදන කාර්යසාධන වාර්තාවට ඇතුලත් වේ.

බලපත්‍රලාභී තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය හරහා ලැබුනු දත්ත සහ ලංකා විදුලිබල මණ්ඩලයේ මාසික මෙහෙයුම් දත්ත වාර්තාවලින් ලබා ගත් විස්තර පදනම්ව මෙම වාර්තාවේ සියලුම සූචි සහ වෙනත් ගණනය කිරීම් සිදු කර ඇත.

ඒ අනුව කොමිෂන් සභාව දෛනික, මාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික පදනමින් වාර්තා නිකුත් කරන ලදී. 2015 වර්ෂයේ මුල් අර්ධයේ දී (SPP කුඩා ජලවිදුලි, සූර්ය හා ජෛවස්කන්ධ දායකත්වය හැරුණු කොට) ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම වාර්තා වූ විදුලිබල ඉල්ලුම මෙගාවොට් 2210.4ක් වූ අතර 2014 වර්ෂයේ මෙම ඉල්ලුම සපුරාලීම සඳහා සහ ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාව පිරිමැසීම සඳහා 2015 වර්ෂයේ මුල් අර්ධයේ දී මෙගාවොට් 3917ක මුළු සවිකළ ධාරිතාවක් සමඟ ජාල සම්බන්ධිත විදුලිබල පිරියත 196ක් ක්‍රියාත්මක වී ඇත.

මෙම විදුලිබල පිරියත අතුරින් ජල විදුලි පිරියත 17ක්, තාප විදුලි පිරියත 9ක් සහ එක් සුළං විදුලි පිරියතක් ඇතුළු විදුලි පිරියත 27ක් ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකාරත්වයට හා මෙහෙයවීමට යටත් වේ. තාප විදුලි පිරියත 6ක් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් (IPPs) විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර කුඩා ජලවිදුලි පිරියත, සූර්ය විදුලි පිරියත, සුළං විදුලිබල පිරියත සහ ජෛවස්කන්ධ ඇතුළු පුර්ජනනීය විදුලිබල පිරියත 163ක් කුඩා විදුලිබල නිෂ්පාදකයින් (SPPs) විසින් මෙහෙයවනු ලැබේ.

පහත දැක්වෙන වගුව හා ප්‍රස්තාරය මගින් 2015 වර්ෂයේ අර්ධ-වාර්ෂික උත්පාදන සංඛ්‍යා පෙන්නුම් කරනු ලැබේ.

වගුව 04 ඃ 2015 වර්ෂයේ වාර්ෂික උත්පාදන සංඛ්‍යා

	CEB ජල	CEB තෙල්	CEB ගල්අඟුරු	IPP ඔයැරජ්ක	පුනර්ජනනීය	එකතුව
Jan	499	24	393	31	95	1,043
Feb	361	68	389	63	92	973
Mar	313	89	528	132	62	1,124
Apr	382	40	484	30	96	1,032
May	481	14	493	6	136	1,131
Jun	326	119	380	140	140	1,105
Jul	283	158	374	194	153	1,163
Aug	277	176	295	266	137	1,151
Sep	273	183	257	254	136	1,103
Oct	445	123	330	82	149	1,129
Nov	626	20	283	2	149	1,080
Dec	659	54	251	26	129	1,118
Total	4,925	1,067	4,457	1,228	1,474	13,151

මූලාශ්‍රය: LISS

පහත දැක්වෙන ප්‍රස්තාරය මඟින් 2015 වර්ෂයේ මුල් මාස හය තුළ ශ්‍රී ලංකාවේ උත්පාදන ප්‍රතිශත පෙන්නුම් කරයි.

ප්‍රස්ථාරය 02 ඃ විදුලි බලය උත්පාදන ක්‍රම - 2015 මුල් අර්ධය



වෙනත් ක්‍රියාකාරකම්

බිල්පත්කරන සහ මැනීමේ ප්‍රධාන සැලැස්ම

12වැනි ඉලක්කය (උපයෝගිතා ආයතනවල බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් හරහා 2020 වර්ෂය වන විට අවම වශයෙන් ගිගාවොට් 250ක බලශක්තියක් සහ මෙගාවොට් 30ක ධාරිතාවක් සංරක්ෂණය කිරීම.) සාක්ෂාත් කර ගැනීමේ පියවරක් ලෙස මැනීම සම්බන්ධයෙන් විනිවිදභාවයක් හා සාධාරණත්වයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාල සංග්‍රහයේ, බෙදාහැරීමේ සංග්‍රහයේ, නව බිල්පත්කරන රෙගුලාසි සහ වෙනත් නියාමන අවශ්‍යතාවන්හි විධිවිධාන අනුව බිල්පත්කරන සැලැස්මක් සකස් කිරීම් අපේක්ෂාවෙන් මෙම පියවර ක්‍රියාත්මක කරන ලදී. තාවකාලික දළ සැලැස්මක් සකස් කිරීම සඳහා බලපත්‍රලාභීන්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ මිනුම් දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී. ශ්‍රී ලංකා සන්දර්භය තුළ අත්කරගත හැකි හා යථාර්ථවාදී වන්නේ කුමක් ද යන්න වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම පිණිස වෙනත් රටවල නියාමන අවශ්‍යතාවන් ද අධ්‍යයනය කරන ලදී. නියාමන කමිටුව මඟින් සකස් කළ බිල්පත්කරන රෙගුලාසි කෙටුම්පත සමාලෝචනය කළ අතර මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් රෙගුලාසි නැවත කෙටුම්පත් කිරීම සිදු වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂය සඳහා ද ඉදිරියට ගෙන යන ලදී.

උත්පාදන සැලැසුම් ක්‍රියාවලිය පිළිබඳ විස්තීරණ අධ්‍යයනය

කොමිෂන් සභාව රට තුළ දිගු කාලීන විද්‍යුත් බලශක්ති ආරක්ෂාව සහතික කිරීම පිණිස ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ සහාය ඇතිව සැලැසුම් දත්ත යෙදවුම් සමාලෝචනය කිරීම මඟින් උත්පාදන සැලසුම් ක්‍රියාවලිය පිළිබඳ විස්තීරණ අධ්‍යයනයක් සිදු කළේය. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා **LCLTGEP** (අවම පිරිවැය දිගු කාලීන උත්පාදන ව්‍යාප්ත කිරීමේ සැලැස්ම) සකස් කිරීමේ දී භාවිතා කළ උපකල්පනවල ශක්‍යතාව ද උත්පාදන සැලසුම් ක්‍රියාවලිය සමාලෝචනයේ දී විශ්ලේෂණය කරන ලදී.

මෙම අධ්‍යයනය මත පදනම්ව ලංකා විදුලිබල මණ්ඩලයේ උත්පාදන සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් උපදෙස් දෙන ලදී.

2015 - 2034 **LCLTGEP** සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලෙසට සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට නියෝග කරන ලදී. මෙම පියවර මඟින් 11වැනි ඉලක්කය (සියලුම අවස්ථාවල දී රට තුළ විදුලිබල ඉල්ලුම සපුරාලන බවට සහතික කර ගැනීම සඳහා 2020 වර්ෂය වන විට ඕනෑම තත්ත්වයක දී අවම සංචිත මට්ටම සියයට 10ක් වශයෙන් පවත්වා ගැනීම) අත්කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ කුඩා කර්මාන්ත පාරිභෝගිකයින් පොදුවේ භාවිතා කරන කඩිනම් බලශක්ති ක්‍රියාදාමවල කාර්යක්ෂමතාව පිළිබඳ වාර්තාව

කාර්මික ක්‍රියාදාමවල උපයෝජන කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකි පොදු ක්ෂේත්‍ර හඳුනාගැනීමට මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඒ අනුව ලංකා වාණිජ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති කාර්මික ආයතන අතර මාර්ගගථ සමීක්ෂණයක් බෙදාහරින ලද අතර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ද තොරතුරු එක්රැස් කර ගන්නා ලදී.

කාර්මික ආයතන හතක බලශක්ති විගණන පවත්වන ලද අතර තනි බලශක්ති විගණන වාර්තා තුනක් අදාළ කර්මාන්තශාලාවලට යොමු කරන ලදී. මෙම ක්‍රියාවලිය 2016 වර්ෂයට ද ඉදිරියට ගෙනයන ලදී. (12වැනි ඉලක්කය)

ඛණිජ තෙල් කර්මාන්තය

ලිහිසි තෙල් වෙළඳපොල ඡායාමාත්‍ර නියාමනය

ලිහිසිතෙල් වෙළඳපොල ඡායාමාත්‍ර නියාමන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලිහිසි තෙල් වෙළඳපොල මෙහෙයුම් තොරතුරු වාර්තා කරයි. ලිහිසි තෙල් වෙළඳ පොල නිදහස් කිරීමට අදාල ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යංශයට උපදෙස් ලබාදීමද සිදු කෙරේ.

අනුමත සන්නාම

2015 අග වන විට ලිහිසි තෙල් අලෙවිය, ආනයනය, අපනයනය. අලෙවිය, සැපයීම සහ බෙදාහැරීම සඳහා බලයලත් නියෝජිතයින් 13 දෙනෙකු විය. ලිහිසි තෙල් ආනයනය, අපනයනය, අලවිය, සැපයීම, බෙදාහැරීම සහ මිශ්‍රකිරීම සඳහා බලයලත් පාර්ශ්වයන් 3කි.

අලෙවි සහ වෙළඳපොල කොටස

2015 වසරේදී රුපියල් බිලියන 23.4ක් වටිනා ලිහිසි තෙල් කිලෝ ලීටර 57978ක් අලෙවි විය. එය 2014ට සාපේක්ෂව සියයට 6.8ක වර්ධනයකි.

වගුව 06 ඃ සමස්ත අලෙවි දත්ත

වසර	ලිහිසි තෙල් අලෙවිය		වාර්ෂික වර්ධනය (%)	
	ප්‍රමාණය (kL)	රු. (මිලියන.)	ප්‍රමාණය (kL)	රු. (මිලියන.)
2015	57,978	23,463	6.8	3.6
2014	54,265	22,640	1.0	11.0
2013	53,708	20,397	(4.7)	(2.2)
2012	56,334	20,854	(3.8)	11.1
2011	58,554	18,775	7.7	33.8
2010	54,369	14,035	21.0	27.1
2009	44,945	11,039		

ප්‍රස්ථාරය 03 ඃ ලිහිසි තෙල් අලෙවි දත්ත



ප්‍රස්ථාරය 04ඃ ලිහිසි තෙල් අලෙවිය



ප්‍රස්ථාරය 05ඃ ලිහිසි තෙල් අලෙවි ආදායම - 2015



දැනුවත්කිරීමේ වැඩසටහන

තාක්ෂණික සිසුන් සහ වෙනත් ආයතන වල පිරිස් සඳහා ලිහිසි තෙල් කර්මාන්තය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. 2015 ලිහිසි තෙල් වෙළඳපොල වාර්තාවද සකස් කරන ලදී.

මානව සම්පත්

මහජන උපයෝගිතා කොමිෂන් සභාව ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් අනගිභවනීය සේවාවක් ඉටු කිරීමේ දී පුද්ගලයින්ගේ ඉහළම ප්‍රමිතියක වෘත්තීය හා පුද්ගලික නිපුණතාවක් ඉලක්ක කරයි. අපගේ වර්තමාන සාර්ථකත්වයට හේතුවී ඇත්තේ අපගේ අද්විතීය කණ්ඩායමේ විශිෂ්ට කැපවීම බවට අපි විශ්වාස කරමු.

ඒ අනුව සංවර්ධන ඉඩප්‍රස්ථාවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම, සාර්ථකත්වය සඳහා වැඩි ඉඩකඩ, සාමාජිකයින්ගේ එකමුතුභාවය ශක්තිමත් කිරීම සහ අද්විතීය වෘත්තිකයින් කණ්ඩායමක් නිර්මාණය කර ගැනීමේ ව්‍යායාමයේ දී සේවා පරිසරයේ ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව ආයෝජනය කරයි.

2015.12.31 දින වන විට කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය පහත පරිදි වේ.

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	
		ස්ථිර	කොන්ත්‍රාත්
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
කොමිෂන් සභාවේ ලේකම්	1	1	0
අධ්‍යක්ෂක	11	7	2
නියෝජ්‍ය අධ්‍යක්ෂක	6	3	3
සහකාර අධ්‍යක්ෂක	17	12	3
කළමනාකරණ සහකාර	9	7	0
රියදුරු/ කාර්යාල සහායක	4	2	2
		34	**10**
	50	**44**	

වාර්ෂික සැලැස්ම - 2016

1වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට සියලුම විදුලි පාරිභෝගිකයින් සඳහා 230 වෝල්ට් සැපයුම සඳහා 6%ක ප්‍රතිශතයක විචලතා පරාසයක් හා සංඛ්‍යාතය සම්බන්ධයෙන් හර්ට්ස් 50 මට්ටමේ සිට 0.5%ක සංඛ්‍යාත හා සුසරන පරාසයකින් යුත් විදුලිබල සැපයුමක් සහතික කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/INS/03	ගෘහ කර්මාන්තවල භාවිතා කරන මෝටර සඳහා විදුලිබල ධාරක හඳුන්වාදීමේ බලපෑම පිළිබඳ නියාමක සමීක්ෂණය	ගෘහ කර්මාන්ත සඳහා විදුලිබල ධාරක හඳුන්වාදීම තුළින් වෝල්ටීයතා මට්ටම සහ බෙදාහැරීමේ පද්ධතියේ ස්ථාවරත්වය වැඩිදියුණු කිරීමේ හැකියාව හඳුනාගැනීම
02	CP16/INS/05.	විදුලිබලයේ ගුණාත්මකභාවයට බලපෑ හැකි වාණිජ ගොඩනැගිලිවල ඇති විදුලිබලය බෙදාහැරීමේ පද්ධතියේ ප්‍රසංවාද අන්තර්ගතය විමර්ශනය කිරීම	වාණිජ ගොඩනැගිලිවල විද්‍යුත් පද්ධතියේ ඇති ප්‍රසංවාද අන්තර්ගතය පිළිබඳව වාර්තා කිරීම.
03	CP16/INS/07	කලාපීය ස්වයං-උත්පාදන ශිල්පක්‍රම සහ එවැනි ශිල්පක්‍රම ශ්‍රී ලංකාවට යොදා ගැනීමේ හැකියාව පිළිබඳව අධ්‍යයනය කිරීම	බෙදාහරින උත්පාදනයේ භාවිතා කරන සුනිත්‍ය බලශක්ති පද්ධති හඳුනාගැනීම කලාපීය සුනිත්‍ය ස්වයං-උත්පාදන ශිල්පක්‍රම හඳුනාගැනීම ශ්‍රී ලංකාවේ ඇති කිලෝවොට් 33ක බෙදාහැරීමේ ජාලය සඳහා එවැනි ස්වයං-උත්පාදන පද්ධති හඳුනාගැනීම ශ්‍රී ලංකාවේ අඩු වෝල්ටීයතා (වොට් 400) බෙදාහැරීමේ ජාලය සඳහා ගැලපෙන එවැනි ස්වයං-උත්පාදන පද්ධති හඳුනාගැනීම
04	CP16/LIC/06	විදුලිබලය බෙදාහැරීමේ පද්ධතියේ වෝල්ටීයතා අධීක්ෂණ වැඩසටහන සහ විදුලි ප්‍රසංවාද පිළිබඳ අධ්‍යයනය	අඩු වෝල්ටීයතාවක් ඇති තෝරාගත් ප්‍රදේශවල නියාමක ව්‍යාපෘතියක් ලෙස වෝල්ටීයතාව අධීක්ෂණ වැඩසටහනක් ආරම්භ කිරීම. නියාමන දෘෂ්ටියෙන් ප්‍රසංවාද පිළිබඳ විස්තීරණ වාර්තාවක් සකස් කිරීම වෝල්ටීයතා අධීක්ෂණ වැඩසටහනේ සුමට ක්‍රියාත්මකවීම සහතික කිරීම. අවශ්‍ය නියාමන පියවර ගැනීම පිණිස ප්‍රසංවාද පිළිබඳ විස්තීරණ වාර්තාවක් තිබීම.
05	CP16/LIC/13	විදුලිබල ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම	වර්තමාන තත්ත්වය මැනීම

2 වැනි ඉලක්කය: 2025 වර්ෂය වන විට විදුලිබල සේවාවේ බිඳවැටීම් දර්ශකය පාරිභෝගිකයෙකුට වර්ෂයක් තුළ දී පැය 24ට වඩා අඩු කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/INS/01	පාරිභෝගිකයෙක් අත්දකින විදුලිය ඇණහිටීම් සාමාන්‍ය කාලපරිච්ඡේදය හඳුනාගැනීම සඳහා සමීක්ෂණය (පද්ධති සාමාන්‍ය විදුලිබල සේවා බිඳවැටීම් දර්ශකය - SAIDI).	2015 වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීමේ ප්‍රදේශ හතරක (04) (නුවරඑළිය, රත්නපුරය සහ ගාල්ල) සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ (ගාල්ල) ඇති SAIDI තත්ත්වය හඳුනාගනු ලැබේ.
02	CP16/LIC/07	මධ්‍යම වෝල්ටීයතා මට්ටමේ දී පද්ධති සාමාන්‍ය විදුලිබල සේවා බිඳවැටීම් දර්ශකය - SAIDI) පිළිබඳ විශ්ලේෂණ වාර්තාව	MV මට්ටමේ දනට ඇති SAIDI මට්ටම හඳුනාගැනීම සහ අඩු වටිනාකම් ඇති ක්ෂේත්‍ර හඳුනාගැනීම SAIDI සීමාවන් නොඉක්මවන බවට සහතික කිරීමට
03	CP16/LIC/14	පද්ධති සාමාන්‍ය විදුලිබල සේවා බිඳවැටීම් දර්ශකය - SAIDI) නිරීක්ෂණය කිරීම	වර්තමාන තත්ත්වය මැනීම

3 වැනි ඉලක්කය: 2025 වර්ෂය වන විට පාරිභෝගිකයෙක් විසින් වසරක් තුළ දී අත්විඳින විදුලිබල සේවාවෙහි බිඳවැටීම් මුළු සංඛ්‍යාව සිදුවීම් 30කට වඩා අඩු කිරීම (සාමාන්‍ය මට්ටමින්)

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/INS/02	පාරිභෝගිකයේ අත්විඳින විදුලිය බිඳවැටීම් සාමාන්‍ය සංඛ්‍යාව හඳුනාගැනීමට සමීක්ෂණය (පද්ධති සාමාන්‍ය විදුලිය ඇනහිටීම් වාර දර්ශකය (SAIFI))	2015 වර්ෂයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ (නුවරඑළිය, රත්නපුරය සහ ගාල්ල) සහ ලංකා විදුලි පුද්ගලික සමාගමේ (ගාල්ල) බෙදාහැරීම් ප්‍රදේශ හතරක (04) SAIFI සම්බන්ධයෙන් පැවති තත්ත්වය හඳුනා ගනු ඇත.
02	CP16/LIC/08	මධ්‍යම වෝල්ටීය (MV) මට්ටමේ දී පද්ධති SAIFI පිළිබඳ විශ්ලේෂණ වාර්තාව	SAIFI අඩු අගයන් ඇති ප්‍රදේශවල පවතින MV මට්ටමේ දී SAIFI SAIFI අඩු අගයන් ඇති ප්‍රදේශවල පවතින MV මට්ටමේ දී SAIFI හඳුනාගැනීම සහ SAIFI අඩු අගයන් ඇති ප්‍රදේශ හඳුනාගැනීම SAIFI අනුමත සීමාවන් නොක්මවන බවට සහතික කිරීම
03	CP16/LIC/15	පද්ධති සාමාන්‍ය විදුලිය ඇනහිටීම් වාර දර්ශකයේ (SAIFI) සැපයුම් ගුණාත්මකභාවය අධීක්ෂණය	වර්තමාන තත්ත්වය මැනීම

4 වැනි ඉලක්කය: 2025 වර්ෂය වන විට පාරිභෝගික සේවා රැහැන් දෝෂයක් සම්බන්ධයෙන් විදුලිබල සේවාව යථාතත්ත්වයට පත් කිරීමේ කාලය පාරිභෝගිකයෙක්ට පැය 2කට වඩා අඩු කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/LIC/09	පාරිභෝගික සේවා රැහැන් දෝෂයක් සම්බන්ධයෙන් විදුලිබල සේවාව යථාතත්ත්වයට පත් කිරීමේ කාලය පිළිබඳ අධ්‍යයනය	විදුලිබල සේවාව යථාතත්ත්වයට පත් කිරීමේ වර්තමාන තත්ත්වය විශ්ලේෂණය කිරීම
02	CP16/LIC/16	පාරිභෝගික සේවා රැහැන් දෝෂයක් සම්බන්ධයෙන් විදුලිබල සේවාව යථාතත්ත්වයට පත් කිරීමේ කාලය අධීක්ෂණය	වර්තමාන තත්ත්වය මැනීම

5 වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට විදුලිබලය හෝ විදුලිබල සැපයුම පිළිබඳ පාරිභෝගික අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ තොරතුරු දැනගැනීමට පාරිභෝගිකයෙක් ගත කරන කාලය දින 1කට වඩා අඩු කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/CCO/02	පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම	දැනුවත්භාවය ඉහළ නැංවීම
02	CP16/CCO/03	කොමිෂන් සභාවේ කාර්යභාරය ගොඩනැගීම සඳහා වූ කරුණු හා යෙදවීම	දැනුවත්භාවය ඉහළ නැංවීම
03	CP16/COA/01	පාරිභෝගික ජාල සාමාජිකයින් සඳහා විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ හැකියා වර්ධනය	විදුලිබල පාරිභෝගිකයින් වෙත පණිවුඩය රැගෙනයා හැකි ප්‍රජා නියෝජිතයින්/ නායකයින් පාරිභෝගික ජාලයට ඇතුලත් වේ. දුක්ගැනවිලි විසඳීමේ දී සහ බලපත්‍රලාභියා සපයන සේවා වෙත ප්‍රවේශවීමේ දී නියෝජිතයා බලපත්‍රලාභියා සහ විදුලිබල පාරිභෝගිකයා අතර අතරමැදියෙක් ලෙස කටයුතු කරනු ඇත. එබැවින් මෙම ක්‍රියාකාරකමේ අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ පාරිභෝගික ජාල සාමාජිකයින් සඳහා විදුලි පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව දැනුවත් කිරීම සහ "පාරිභෝගික අයිතිවාසිකම් සහ වගකීම්" යන සංකල්පය සමාජගත කිරීමයි. අපේක්ෂිත බලපෑම වන්නේ පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් සවිබල ගන්වමින් කොමිෂන් සභාව සකස් කළ ලේඛණ සඳහන් කරමින් පාරිභෝගිකයින් සිය දුක්ගැනවිලි බලපත්‍රලාභියා වෙත යොමු කිරීම වේ. සිය අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව දැනුවත්වීම තුළින් විදුලිබල පාරිභෝගිකයින් තුළ චර්යාත්මක වෙනසක් සිදු වනු ඇත.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
04	CP16/COA/02	පාරිභෝගික ජාලයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තිරසාරභාවය ඇගයීම	දකුණු පළාතේ පිහිටුවන ලද පාරිභෝගික ජාලවල තිරසාරභාවය පිළිබඳ ස්වාධීන ඇගයීම
05	CP16/COA/03	ශ්‍රී ලංකා ප්‍රදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන ග්‍රාම නිලධාරීන් සඳහා අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ වැඩමුළු හතරක් පැවැත්වීම	අදාළ ග්‍රාම නිලධාරී කාර්යාලවල විදුලිබල පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශනයක් ලබා ගැනීමට තිබෙන බවට එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාරිභෝගිකයින් දැනුවත්වීම
06	CP16/COA/06.	ලංකා විදුලිබල මණ්ඩලයේ 4වැනි බෙදාහැරීමේ කලාපයේ ජාතික පාරිභෝගික ජාලය පිහිටුවීම	සේවා සපයන්නන් සමග කේවල් කිරීම තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් ප්‍රකාශයක් ඇති බවට ජාතික විදුලිබල පාරිභෝගික ජාලයේ සාමාජිකයින් දැනුවත්වීම.
07	CP16/COA/07	5 වැනි ඉලක්කය - අධීක්ෂණ වාර්තාව	5 වැනි ඉලක්කය අත්කර ගැනීම ඇගයීම පිළිබඳ වාර්තාවක්

6 වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට විදුලිබල සේවා සැපයුම්කරුවෙක් පාරිභෝගික විමසීම්/ඉල්ලීම්/පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ගන්නා සාමාන්‍ය කාලය දින 30කට අඩු කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/COA/04	බලපත්‍රලාභීන් පැමිණිලි/ ඉල්ලීම් හසුරුවීමේ හස්ත ක්‍රමය වෙනුවට කොමිෂන් සභාව ගොඩනගන ලද ආරාවුල් විසඳීමේ ක්‍රමය (DRS) භාවිතා කිරීම	තොරා ගත් සේවා පහක් ලබාදීමට ගන්නා කාලය මැනීම සඳහා දත්ත ස්වාධීනව නිසි වේලාවට එක්රැස් කළ හැකි වේ.
02	CP16/COA/08	6 වැනි ඉලක්කය - අධීක්ෂණ වාර්තාව	6 වැනි ඉලක්කය අත්කර ගැනීම ඇගයීම පිළිබඳ වාර්තාවක්
03	CP16/INS/06	බිල්පත්කරනය කළමනාකරණ සැලසුම සකස් කිරීම	බිල්පත්කරනය කළමනාකරණ සැලසුමේ කෙටුම්පත සකස් කිරීම
04	CP16/ITM/02	බලපත්‍රලාභීන් වෙත ප්‍රවේශවීම සඳහා ආරාවුල් විසඳීමේ පද්ධතිය වෙනස් කිරීම	බලපත්‍රලාභීන් සමග තොරතුරු ඉලෙක්ට්‍රොනිකව හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම
05	CP16/REA/01	විදුලිබල සැපයුම හා බිල්පත්කරණ සේවා ලබාදීම පිළිබඳ මාර්ගෝපදේශ	විදුලිබල සැපයුම හා බිල්පත්කරණ සේවා ලබාදීම සම්බන්ධයෙන් හඳුනාගත් පාරිභෝගික පැමිණිලි විසඳීමේ ඉලක්කය ඇතිව විදුලිබල සැපයුම හා බිල්පත්කරණ සේවා සැපයීම සම්බන්ධ මාර්ගෝපදේශ ඇති කිරීම

7 වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට කොමිෂන් සභාව පාරිභෝගිකයින්ට සේවය කිරීම සඳහා ගන්නා සාමාන්‍ය කාලය දින 30කට අඩු කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/COA/05	ඉලෙක්ට්‍රොනිකව සන්නිවේදනය කිරීම පිණිස කොමිෂන් සභාවේ ආරාවුල් විසඳීමේ පද්ධතිය සහ බලපත්‍රලාභීන්ගේ පැමිණිලි/ ඉල්ලීම් හසුරුවීමේ ක්‍රමය ගොඩනැගීම	කොමිෂන් සභාව සහ බලපත්‍රලාභීන් අතර සන්නිවේදනය සඳහා ගත වන කාලයෙන් වැඩි ප්‍රමාණයක් අඩු කර ගත හැකිය.
02	CP16/COA/09	7 වැනි ඉලක්කය - අධීක්ෂණ වාර්තාව	7 වැනි ඉලක්කය අත්කර ගැනීම ඇගයීම පිළිබඳ වාර්තාවක්
03	CP16/ITM/03.	බලපත්‍රලාභීන්ට කොමිෂන් සභාවට ඉලෙක්ට්‍රොනිකව තොරතුරු සැපයීම සඳහා ආරාවුල් විසඳීමේ ක්‍රමය භාවිතා කළ හැකි වන බැවින් එම පද්ධතිය වැඩිදියුණු කිරීම.	වර්තමානයේ දී බලපත්‍රලාභීන්ගෙන් තොරතුරු ඉල්ලා සිටින්නේ තැපෑලෙන් වන අතර බලපත්‍රලාභීන් ද තොරතුරු ලබා දෙන්නේ තැපෑලෙනි. ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය මඟින් කාලය ඉතිරිකර ගත හැකිය.

8 වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට 2013 වසරේ විදුලිබල සැපයුම සඳහා වැය වූ මුළු පිරිවැයට සාපේක්ෂව විදුලිබල සැපයුම් පිරිවැය සියට 10කින් අඩු කිරීම (උත්පාදන සංයුතියේ හා ඉන්ධන මිල ගණන්වල මූර්තමය අගයෙහි ගැලපීම්වලට යටත්ව සමස්ත පිරිවැය ගණන් බලනු ලැබේ.)

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP13/REA/01	නියාමන ගිණුම්කරනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ	අනුමත ආදායම තීරණය කිරීමට සහ විදුලි උපයෝජනවල කාර්යසාධනය අධීක්ෂණය කිරීමට/ දීර්ඝ කාලීනව විදුලි සැපයුමේ පිරිවැය අඩු කිරීමට අවශ්‍ය මූලික තොරතුරු
02	CP14/REA/03	බලපත්‍රලාභීන් අතර විදුලි වෙළඳාම් කටයුතු පිළිබඳ රෙගුලාසි	සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් අතර ඇති කර ගැනීමට නියමිත විදුලිබලය සැපයීම් ගිවිසුම් (PPA) සහ බලපත්‍රලාභීන් අතර ඇති කර ගැනීමට නියමිත විදුලිබලය සැපයීමේ ගිවිසුම් (PSA) සඳහා අනුමැතිය දීම සහ යෝග්‍ය විදුලිබල වෙළඳාම ඇති කිරීම
03	CP15/REA/01	අයකුම ඇති කිරීම පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස්	අයකුම මිලකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ මෙන්ම අවාසිවලට භාජනය වන පාරිභෝගික කණ්ඩායම් හඳුනාගැනීමේ ඉලක්කය ඇතිව ශ්‍රී ලංකාවේ විදුලිබලය භාවිතය පිළිබඳව රජයට උපදෙස් දීම

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
04	CP16/LIC/05	ප්‍රශස්තිකරණය කළ සංචිත සීමාව පිළිබඳ අධ්‍යයනය	පිරිවැය අඩු කිරීමේ ක්‍රමයක් ලෙස දවසේ ඇතැම් වේලාවල දී සංචිත සීමාව ලිහිල් කිරීමේ හැකියාව ඇගයීම පිළිබඳ අධ්‍යයන වාර්තාව උත්පාදන පිරිවැය අඩු කිරීම සඳහා දවස තුළ විචල්‍ය සංචිත සීමාවක් පවත්වාගෙනයාම පිළිබඳව නිර්දේශ කිරීම
05	CP16/LIC/11	බලපත්‍රලාභීන්ගේ සංවර්ධන සැලසුම්වල භාවිතා කරන වට්ටම් අනුපාත අගය සමාලෝචනය කිරීම	බලපත්‍රලාභීන්ගේ අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා ඔවුන්ගේ සංවර්ධන සැලසුම්වල භාවිතා කරන වට්ටම් අනුපාත අගය සාකච්ඡා කරන වාර්තාවක්/ බලපත්‍රලාභීන් ඔවුන්ගේ සංවර්ධන සැලසුම්වල භාවිතා කරන වට්ටම් අනුපාතවල නිවැරදිතාව වැඩිදියුණු කිරීම.
06	CP16/LIC/12	2013 වර්ෂය සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ (මෙහෙයුම් වියදම්) පිරිවැය මිනුම් ලකුණු කිරීම	බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ සමස්ත කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා "විදුලිබලය බෙදාහැරීමේ උපයෝජනවල කාර්යසාධන දර්ශක පිළිබඳ වාර්තාවේ" විස්තර කර ඇති සමස්ත කාර්යසාධනය මැනීමේ ක්‍රම **PUC/2013/158/EL/LI/05./** යොදාගැනීම සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනය පැවැත්වීම
07	CP16/REA/02	සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් අවශ්‍ය කරන තොරතුරු පිළිබඳ අධ්‍යයනය	සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සම්බන්ධ අවශ්‍ය කරන තොරතුරු හඳුනාගැනීම සහ එවැනි තොරතුරු එක්රැස් කිරීම හා වාර්තාකිරීම සම්බන්ධ නෛතික විධිවිධාන හඳුනාගැනීම
08	CP16/REA/03	නිදහස් කළ තැනැත්තන් (විදුලිබලය බෙදාහැරීම හා සැපයීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තන්) සඳහා සැපයුම් අයකුම ක්‍රමවේදය හා උපලේඛණය	විදුලිබලය බෙදාහැරීම හා සැපයීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමෙන් නිදහස් කළ තැනැත්තන්ට අදාළ වන සැපයුම් අයකුම හා අයකුම උපලේඛණය සඳහා පිරිවැය නිරූපිත ක්‍රමවේදය/ පාරිභෝගිකයින්ගෙන් සාධාරණව අයකරන බවට සහතික කිරීම
09	CP16/TEA/01	2015 බෙදාහැරීම විගණනය හා පුහුණුව	**CP15/TEA/01** යටතේ සකස් කළ බෙදාහැරීමේ මාර්ගෝපදේශ අනුව 2015 බෙදාහැරීම පිළිබඳ විගණන වාර්තාව සහ විගණය මාර්ගෝපදේශ පිළිබඳව කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයේ ධාරිතා ගොඩනැගීම

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
10	CP16/TEA/02	උත්පාදනය බෙදාහැරීමේ විචල්‍යතා පිළිබඳ වාර්තාව	අනාගතයේ දී උත්පාදන පිරිවැය අඩු කිරීමට මඟපාදන උත්පාදන බෙදාහැරීමේ විචල්‍යතා පිළිබඳ වැඩි අවබෝධය
11	CP16/TEA/03	8 වැනි ඉලක්කය අධීක්ෂණ වාර්තාව	පූර්ව නිශ්චිත පද්ධති/ ආර්ථික තත්ත්වයන් මාලාවක් පදනම්ව විදුලි සැපයුමේ පිරිවැය සැසඳීම පිළිබඳ වාර්තාව (2013 එරෙහිව 2015)
12	CP16/TEA/05	තරඟකාරී ටෙන්ඩර ක්‍රියාවලිය පාලනය කරන උත්පාදන පිරියත ප්‍රසම්පාදනයේ ආර්ථික පිරිවැය පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස්	අනාගත උත්පාදන පිරිවැය අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති උපදෙස්

9 වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට සේවා සැපයුම්කරු 2013 වසරේ දී වෙනත් සේවා සඳහා අයකරනු ලැබූ ගාස්තු මූර්තමය වශයෙන් 10%කින් අඩු කිරීම

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/TEA/06	9වැනි ඉලක්කය අධීක්ෂණ වාර්තාව	අනුමත ගාස්තු සැසඳීම (2013 එරෙහිව 2015)
02	CP16/TEA/07	අනුමත ගාස්තු පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස් සහ අනුමත ගාස්තු ක්‍රමවේදයට සංශෝධන	අනුමත ගාස්තු ආශ්‍රිත පිරිවැය ක්‍රම සඳහා වෙනස්කම්

10 වැනි ඉලක්කය: 2020 වර්ෂය වන විට විදුලි සැර වැදීම් හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව වර්ෂයකට 20කට වඩා අඩු කිරීම

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/CCO/01	විදුලිබල ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමේ ව්‍යාපාරය	උතුර, උතුරු මැද, මධ්‍යම හා දකුණ යන පළාත්වල විදුලිබල ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම. කෙවෙනි ප්‍රමිතිකරනය පිළිබඳ දීපව්‍යාප්ත දැනුවත් කිරීම
02	CP16/INS/04	විදුලි සැර වැදීම් අවම කිරීමේ වැඩසටහන	විදුලිබලය ආරක්ෂාකාරීව භාවිතා කිරීම, විද්‍යුත්මය වශයෙන් අනාරක්ෂිත තත්ත්වයන් හඳුනාගැනීම, වළක්වාගැනීමේ ක්‍රම හා විධි, ආරක්ෂාකාරීව හසුරුවන ආකාරය, අනවසර විදුලිය ලබාගැනීම්වල අන්තරාය හා නීතිරෝධී තත්ත්වය සහ දණ්ඩනීති සංග්‍රහය යටතේ අදාළ දඬුවම් පිළිබඳව පොදු ජනතාව අතර දැනුම වැඩිදියුණු කිරීම

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
03	CP16/INS/08	විදුලි ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන	ගෘහස්ත විදුලි රැහැන් ඇදීමේ නිරත පුද්ගලයින් අනාගතයේ දී විදුලි ශිල්පීන් ලෙස වෘත්තියේ නිරතවීමට බලපත්‍රයක් තිබීමේ අවශ්‍යතාව පිළිබඳව දැනුවත්වීම
04	CP16/INS/10	ආරක්ෂක හා කාර්මික කළමනාකරන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	බලපත්‍රලාභීන් සකස් කළ පළමුව ආරක්ෂාව හා කාර්මික කළමනාකරණ සැලසුම් ලබාගැනීම සහ අනුකූලතා අධීක්ෂණය
05	CP16/INS/11	සෞඛ්‍ය හා ආරක්ෂක දර්ශක ක්‍රියාත්මක කිරීම	බලපත්‍රලාභීන් විසින් සෞඛ්‍ය හා ආරක්ෂක සංඛ්‍යාල්බණ ලබා ගැනීම
06	CP16/INS/12	ස්වාධීන ආරක්ෂක විගණන පිළිබඳ මූලික අධ්‍යයනය	ආරක්ෂක විගණකයින් පත් කිරීම සඳහා පිළිගැනීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම
07	CP16/INS/13	ආරක්ෂාව සම්බන්ධ සිදුවීම් දැනුම්දීම සඳහා දත්තසමුදාය පුළුල් කිරීම	පොලීසියෙන් ආරක්ෂාව සම්බන්ධ සිදුවීම් පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා දැනට පවතින සිදුවීම්/ අනතුරු දත්තසමුදාය පුළුල් කිරීම
08	CP16/INS/14	අඩු වෝල්ටීයතා (LV) විද්‍යුත් උපකරණවලට ඇතුලත් කිරීමට නියමිත ආරක්ෂක අවශ්‍යතාවන් පිළිබඳ අධ්‍යයනය	ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදිත/ ආනයනය කරන පොදු බඩු උපකරණවලට ගැලපෙන ආරක්ෂක අවශ්‍යතා හඳුනාගැනීම
09	CP16/INS/15	විදුලි සැර වැදීම් මරණ සංඛ්‍යාව වාර්ෂිකව 20කට වඩා අඩුවීම' ඉලක්කය අධීක්ෂණය	ඉලක්කය නිසි කාලයේ දී අත්කර ගන්නා බවට සහතික කිරීම
10	CP16/ITM/01	ආරක්ෂාව ආශ්‍රිත සිදුවීම් වාර්තා කිරීම සඳහා තොරතුරු පද්ධතිය පුළුල් කිරීම - 2වැනි අදියර	CEB සහ LECO හැරුණු කොට පොලිස් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය වැනි වෙනත් පාර්ශ්වවලින් තොරතුරු මාර්ගගතව යොමු කිරීමට පහසුකම් සැලසීම පිණිස ආරක්ෂාව ආශ්‍රිත සිදුවීම් වාර්තා කිරීම සඳහා (පරීක්ෂණ මට්ටමේ ඇති) දැනට පවතින තොරතුරු පද්ධතිය පුළුල් කිරීම

11 වැනි ඉලක්කය:2030 වර්ෂය වන විට සහ ඊට පසුව සියලුම අවස්ථාවල දී සහ ඕනෑම තත්ත්වයක් යටතේ රට තුළ විදුලිබල ඉල්ලුම සපුරාලන බවට සහතික කර ගැනීම සඳහා ඕනෑම තත්ත්වයක දී අවම සංචිත මට්ටම සියයට 10ක් වශයෙන් පවත්වා ගැනීම

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/LIC/01	එබුනු ජෙනරේටරවල (විදුලිබලය බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධිත ජෙනරේටරවල) දෛනික පැටවීම් රටාවන් පිළිබඳ අධ්‍යයනය	එබුනු ජෙනරේටරවල (විදුලිබලය බෙදාහැරීමේ පද්ධතියට සම්බන්ධිත ජෙනරේටරවල) දෛනික පැටවීම් රටාවන් පිළිබඳ අධ්‍යයන වාර්තාව සහ රාත්‍රියේ කාර්යබහුල වේලාව සඳහා ඒවායේ බලපෑම හඳුනාගැනීම
02	CP16/LIC/02	ලංකා විදුලිබල මණ්ඩලය (CEB) මගින් සකස් කළ අවම පිරිවැය දිගු කාලීන උත්පාදනය ව්‍යාප්ත කිරීමේ සැලැස්ම (LCLTGEP) සමාලෝචනය කිරීම	සැපයුම් පිරිවැය අවම කරන අතරතුර නව උත්පාදන විකල්ප සහ දැනට ඇති අකාර්යක්ෂම උත්පාදන පිරියත ඉවත්කිරීම හඳුනාගැනීම තුළින් ඉල්ලුම සපුරාලීම සඳහා ඉදිරි වසර 20 සඳහා විදුලිය උත්පාදන පිණිස වූ LCLTGEP සැලැස්මට කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදීම
03	CP16/LIC/03	(WASP - සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් දිගු කාලීන උත්පාදන සැලසුම සකස් කිරීමට භාවිතා කරන මෘදුකාංගය) වියන් ස්වයංක්‍රීය පද්ධති සැලසුම් පැකේජයේ යෙදවුම් මාදිලි පිළිබඳ අධ්‍යයනය	උත්පාදන සැලසුම සකස් කිරීම සඳහා සලකා බලන පිරිවැය අංශයේ ඵත්‍ය සීමාවන් WASP යෙදවුම් මාදිලි සමග සසඳන අධ්‍යයන වාර්තාව. WASP යෙදවුම් මාදිලිවලින් සියලුම සීමාවන් සහ ප්‍රශස්ත උත්පාදන සැලසුම සකස් කිරීම සඳහා භාවිතා කරන පිරිවැය අංගවල මෙහෙයුම් ලක්ෂණ ආවරණය වන්නේ ද යන්න හඳුනාගැනීම.
04	CP16/LIC/04	උත්පාදන පිරියතවල ඉන්ධන සැපයුම හා ගබඩා කිරීමේ මට්ටම් අධීක්ෂණය	උත්පාදන පිරියතවල ඉන්ධන සැපයුම හා ගබඩා කිරීමේ මට්ටම් තීරණය කිරීම සඳහා ආකෘති සකස් කිරීම හා නිකුත් කිරීම. අවශ්‍ය කරන උත්පාදන මට්ටම ගැලපෙන ලෙස විදුලි පිරියත ප්‍රමාණවත් ඉන්ධන ගබඩා කර තබා ගන්නේ ද යන්න අධීක්ෂණය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.
05	CP16/LIC/10	එක් එක් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ විදුලිබලය හා බලශක්ති ඉල්ලුම් පුරෝකථනය	එක් එක් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වෙනුවෙන් විදුලිබලය හා බලශක්ති ඉල්ලුම පුරෝකථනය කරනු ලැබේ/ එක් එක් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ පුරෝකථනය කළ අගයන් විවිධ අධ්‍යයන අවශ්‍යතා සඳහා භාවිතා කළ හැකිය.
06	CP16/TEA/08	11වැනි ඉලක්කය අධීක්ෂණ වාර්තාව	11වැනි ඉලක්කය අත්කර ගැනීමේ ප්‍රමාණය මැනීම

12 වැනි ඉලක්කය: 2025 වර්ෂය වන විට උපයෝගිතා ආයතනවල බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් හරහා අවම වශයෙන් ගිගාවොට් 250ක බලශක්තියක් සහ මෙගාවොට් 30ක ධාරිතාවක් සංරක්ෂණය කිරීම.

අනු. අං.	යොමුව	ක්‍රියාකාරකම - 2016	නිමැවුම/ ප්‍රතිඵලය
01	CP16/INS/09	"2020 වර්ෂය වන විට බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් හරහා අවම වශයෙන් ගිගාවොට් 250ක බලශක්තියක් සහ මෙගාවොට් 30ක ධාරිතාවක් සංරක්ෂණය කිරීම" යන ඉලක්කය අධීක්ෂණය	ඉලක්කය නිසි කාලයේ දී අත්කර ගන්නා බවට සහතිකවීම
02	CP16/TEA/04	TOU/ බාධා කළ හැකි අයකුම හඳුන්වාදීම පිළිබඳ අධ්‍යයනය	අයකුම ව්‍යුහය වෙනස්කිරීම පිළිබඳ විශ්ලේෂණය පාදක ප්‍රතිපත්ති උපදෙස්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීආර්ඊ/ඩී/පීයූසී/1/15/50 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 ඔක්තෝබර් 11 දින

සභාපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2016 මැයි 27 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

3

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -37

කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද අයක්‍රමයකට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් පවරන ලද නඩුවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.300,000 ක නඩු ගාස්තු ගෙවා තිබූ අතර, විගණිත දිනය වූ 2016 මාර්තු මස 17 දින වන විටත් අවසන් කර නොමැති මෙම නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල හෙලිදරව් කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2) (ඇ)	අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවත් 2012 වර්ෂයේ දකුණු ආසියා යටිතල පහසුකම් නියාමන සංසදයේ වැඩසටහනට ගෙවන ලද රු.55,000 ක අත්තිකාරම් මුදල 2015 දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි.
(ආ)	2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.3 ඡේදය	සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා සේවකයින් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු රු.333,865 ක් නිලධාරියාගෙන් අයකර ගෙවීම වෙනුවට කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි.

2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

බලපත්‍රලාභීන් වෙත නිකුත් කරනු ලබන විදුලි උත්පාදන බලපත්‍රයෙහි කොන්දේසි අංක 11 ප්‍රකාරව ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතු එකතුව රු.81,852,700 ක වාර්ෂික නියාමන බදු මුදල් හා 2011 සිට 2015 දක්වා අනෙකුත් ආයතනවලින් අයවිය යුතු එකතුව රු.460,676 ක බදු මුදල් 2016 මාර්තු 02 දින වනවිටත් කොමිෂන් සභාවට අයවී නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,048,768 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,670,710 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,621,942 ක පිරිහීමක් නිරීක්ෂණය විය. උපදේශක සේවා ගාස්තු රු.24,667,453 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.55,978,423 ක්වූ අතිරික්තය පසු වර්ෂ 04 තුලදීම පිරිහී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.4,048,768 ක් දක්වා අඩුවී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකීමේදී 2011 සිට 2015 දක්වා දායකත්වය උච්චාවචනය වී තිබූ අතර 2013 සමඟ සැසඳීමේදී 2014 දායකත්වය සියයට 36 කින් වැඩි වී තිබුණි. 2015 එය නැවතත් සියයට 13 කින් පිරිහී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ (14) වගන්තියේ සඳහන් වන පරිදි කොමිෂන් සභාවේ අරමුණු පහත පරිදි වේ.

- සියලු පාරිභෝගිකයන්ගේ අයිතිය ආරක්ෂා කිරීම හා තරඟකාරීත්වය ප්‍රවර්ධනය

- විදුලිබල, ජලසේවා සහ ඛණිජ තෙල් යන මහජන උපයෝගිතා කර්මාන්තවල ක්‍රියාකාරීත්වය සහ ප්‍රාග්ධන ආයෝජන දෙකෙහිම කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය, ඒවායේ ආරක්ෂාකාරීත්වය සහ සේවාවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය හා ඒවාට සම්පත් කාර්යක්ෂමව වෙන්කර දීම ප්‍රවර්ධනය

- හැකි අවස්ථාවලදී ජාත්‍යන්තර ප්‍රමිතිවලට ප්‍රතිපාර්ශ්වික උපයෝගිතා සේවා "බෙන්ච්මාර්ක්" කිරීම සහ කාර්යක්ෂමව ක්‍රියා කරන මිල පාලිත අස්ථිත්වවලට ඔවුන්ගේ මහජන උපයෝගිතා කර්මාන්ත සඳහා මුදල් සපයා ගැනීමෙහි ලා අයථා දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු නොවන බවට වගා බලාගැනීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත පනත ප්‍රකාරව උපයෝගිතා කර්මාන්ත ලෙස දක්වා තිබූ විදුලිය, ජලය හා ඛණිජ තෙල් යන කර්මාන්තවලට අදාළ නියාමන කටයුතු සභාව විසින් සිදුකළ යුතු වුවත් ඛණිජ තෙල් හා ජලය ආශ්‍රිත කර්මාන්තවලට කොමිෂන් සභාවේ සේවය ලබාගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන අදාළ ආයතන මගින් මෙතෙක් එකී කර්මාන්ත පිහිටුවීමේ පනත්වලට ඇතුළත් කර නොතිබුණි. එබැවින් කොමිෂන් සභාවේ සේවය විදුලිබල කර්මාන්තයට පමණක් සීමා වී තිබූ අතර ජලය හා ඛණිජ තෙල් කර්මාන්තවලට අදාළව සේවය සැපයීමේ අරමුණ ඉටුකර ගැනීමට එය බාධාවක් වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ කාර්යයන් 07 ක් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් සම්පූර්ණ කර නොතිබුණි.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොනිමි වැඩ ලෙස දක්වා තිබූ රු.900,382 ක්වූ ව්‍යාපෘති 3 කට අදාළව කොන්ත්‍රාත්කරුවන්ගෙන් කාර්යසාධන සුරක්ෂිතයන් ලබාගෙන නොතිබුණ අතර එක් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව හා කොන්ත්‍රාත්කරු අතර ගිවිසුමකටද එළඹ නොතිබුණි.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.2(ඞී) හා (ඊ) ඡේද අනුව නව කාර්ය මණ්ඩලයෙහි සංවිධාන ව්‍යුහය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ ක්‍රියාකර නොතිබුණි.

(ආ) උක්ත (අ) හි සඳහන් චක්‍රලේඛයෙහි 9.3 ඡේදය අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ඇ) 2011 ඔක්තෝබර් 17 දින, 2012 අගෝස්තු 09 දින හා 2014 අගෝස්තු 20 යන දිනවල පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අනුව සේවකයන් බඳවා ගැනීම් හා කාර්ය මණ්ඩලය සඳහා වැටුප් තීරණය කිරීමේදී 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 අනුව කටයුතු කළ යුතු බවට නියෝග කර තිබුණද මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එයට අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ඇතුළත් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි සංග්‍රහයේ 134(2) වගන්තිය ප්‍රකාරව මුදල් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 134(3) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ අයිතම් 08 ක වියදම් සඳහා සියයට 25 සිට සියයට 59 දක්වා අධි ප්‍රතිපාදනයක් පැවතීමෙන් අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් නොතිබීම හා වැටුප් සංශෝධන සඳහා අදාළ චක්‍රලේඛ ප්‍රකාර අනුමැතිය ලබාගෙන නොතිබීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති වාර්තාව සඳහා ප්‍රතිචාර දැක්වීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය உமது இல Your No.	TRE/D/PUC/1/15/50	අපේ අංකය எமது இல. Our No.	PUCSL/IA/16/07 (FA.15)	දිනය திகதி Date	2016.06.24

විගණකාධිපති.
විගණකාධිපති දෙපාර්තමේන්තුව.
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබද 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඔබගේ සම අංක හා 2016 ජුනි 16 දිනැති ආවරණ ලිපිය සමග මාවෙත එවා තිබූ කෙටුම්පත් වාර්තාව හා බැදේ. එම වාර්තාවේ දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් පහත දැක්වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

යථෝක්ත නඩුව කොමිෂන් සභාවේ වාසියට ලැබූ නඩු තීන්දුවක් සම්බන්ධයෙන් පැවැත්වෙන අභියාචනා(ඇපෑල) නඩුවකි. මෙම නඩුව වෙනුවෙන් අසම්භාව්‍ය බැරකමක් පැන නැගීම ඉතාම දුරස්ථ බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 37හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව බැරකමක් හෙලි දරවු කිරිමේ අවශ්‍යතාවයක් නොවූ බව දන්වමි.

2.2.2.ගිණුම් කරන අඩුපාඩු

(අ)2015 වර්ෂය සඳහා ක්ෂය වැඩියෙන් පෙන්වීම නිසා වර්ෂයේ ලාභයද වත්කම් වටිනාකමද රු.450,596 කින් අඩුවෙන් නිරූපනය වීම විගණනයෙන් පෙන්වා පැහැදිලි කර දීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණු එම වරද නිවැරදි කරන ලදී.ගිණුම් කරන පරිගණක පද්ධතියේ අංක 497 දරන සටහන යටතේ සමුච්චිත ක්ෂය වෙන් කිරීම් ගිණුම් හා ක්ෂය ගිණුම් (මෘදුකාංග හා වාහන) අතර ගලපා ඇත. 2015 වර්ෂය සඳහා වූ සංශෝධිත මූල්‍ය ප්‍රකාශණය බලන්න.
(ආ)ආයෝජන පොලි ආදායම අඩුවෙන් ගිණුම් ගත කිරිම
ආයෝජන පොලී ආදායම නිවැරදිවම ගිණුම් ගතකර ඇති බව කාරුණිකව දන්වමි. එබැවින් නිවැරදි කිරිමේ අවශ්‍යතාවයක් නොමැති බවත් දන්වනු කැමැත්තෙමි.

2.2.3. ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්

විදුලි උත්පාදන බලපත්‍ර යෙහි කොන්දේශි අංක 11 අනුව වර්ෂයේ ගාස්තුව එම වර්ෂයේ ජුනි 30 දින හෝ ඊට පෙර කොමිෂන් සභාවට ගෙවිය යුතුව ඇත. ඒ අනුව කල්වේලා ඇතිව එම බලපත්‍ර ලාභීන් වෙත ඉන්වොයිස් පත් සකසා ඉදිරිපත් කර ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත කිරිම කරනු ලැබේ. මේ වන විට හිගව ඇති බලපත්‍ර ගාස්තු පිළිබද තොරතුරු අඩංගු සටහනක් මේ සමග ඇමුණුම් අංක 01 වශයෙන් අමුණා ඉදිරිපත් කරමි.

2016 ජුනි මස 20 දින වන විටත් ලැබි නොතිබුණු බලපත්‍ර ගාස්තුව රු.82, 313,376ක් වේ. මෙම මුදලින් ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතුව පැවති ගාස්තුව රු.81,852,700ක් වේ.මෙම ගාස්තුව කඩිනමින් ලබාගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයද (රේඛීය අමාත්‍යාංශයද) මැදිහත්ව සාකච්ඡාවක් පැවැත්වූ බවත්, එම අවස්ථාවේදී ද ඊට සහභාගි වූ විදුලිබල මණ්ඩලයේ නිළධාරීන් විසින් එම ගාස්තුව කඩිනමින් ගෙවා පියවීමට එකග වූ බවත් දන්වා සිටිනු කැමැත්තෙමි. විදුලි බල මණ්ඩලයෙන් හිගව පවතින මුදල වූ රු.81,852,700 ගෙවීම සඳහා කටයුතු කරන බව 2016 මැයි 30 දිනැති ලිපියෙන්ද තහවුරු කර ඇති බවත් දන්වමි.(එම ලිපියේ ඡායා පිටපතක්ද මේසමග ඇමුණුම් අංක02 වශයෙන් ඉදිරිපත් කරමි.) අනෙකුත් බලපත්‍ර ලාභීන්ගෙන් ලැබියයුතු මුදල රු.460,676ක් වන අතර එම මුදල ලබා ගැනීම සඳහා ඔවුන් වෙත වරින් වර සිහි කැදවීම්ද යවා ඇති බවද එම සිහි කැදවීම් වලටද නිසි ප්‍රතිචාර දක්වනු නොලැබුව හොත් බලපත්‍ර කොන්දේසි කඩකිරිම පිළිබඳව අදාල පියවර ගන්නා බවද දන්වා සිටිනු කැමැත්තෙමි.

2.2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

අ)ලි බඩු සහ සවිකිරිම් රු.169,926 : 2004 වර්ෂයේදි මිළදී ගෙන ඇති 2011 වර්ෂයේදී ඒකකයක් රු.3,855.45 ක ට අගය කරන ලද විධායක පුටු 20ක් 2015 වර්ෂයේදි රු.77,169 කට අගය කර පොත්වලින් ඉවත් කර ඇත.මීට අමතරව 2004 වර්ෂයේදී සවි කරන **Glass partition** 2011 වර්ෂයේදි රු.464,781.24 කට නැවත අගය කර ගිණුම් ගත කර එම සවි කිරීම් වලින් 1/5 ක ප්‍රමාණයක් 2015 වර්ෂයේදි ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය අලුත් වැඩියා කිරිමේදි ඉවත් කර ඇත. එහි පොත් අගය රු.92,956.24ක් වේ. මූල්‍ය ප්‍රකාශණයෙහි දක්වා ඇත්තේ මෙම අයිතම් දෙකෙහි වටිනාකම වූ රු.170,125 ක් වු අගය වේ.එම සංඛ්‍යා දෙකෙහි වෙනස වූ රු.200/= සංශෝධිත ගිණුම් වලදි ගලපා ඇති බවත් කාරුණිකව සලකන්න.

ආ) උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් රු.300.000 ක් ගෙවීම හා ප්‍රසම්පාදන වාර්තාව නොතිබීම.

මෙම උපදේශන සේවාව 2014 වර්ෂයේදි ලබා ගත් එකක් වන අතර නිළධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් අදියරේ වූ ඇගයිම් ක්‍රියාපටිපාටිය ඉටුකිරිම වෙනුවෙන් 2015 වර්ෂයේදි කරන ලද ගෙවීමකි. මෙම සේවාව ලබා ගැනීම ට හා ගෙවීම සම්බන්ධයෙන් කොමිෂන් සභා අනුමැතිය මේ සමග ඇමුණුම් අංක 03 වශයෙන් අමුණා ඉදිරිපත් කරමි.මෙම ගෙවීම සඳහා ප්‍රසම්පාදන වාර්තාවක අවශ්‍යතාවයක් නොතිබූ බැව් කාරුණිකව දන්වමි.

2.2.5. නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනු කුල නොවීම.

අ) මු.රෙ.371(2)(ඇ) 2012 වර්ෂයේ දකුණු ආසියා යටිතල පහසුකම් නියාමන සංසදයේ වැඩ සටහනකට සහභාගිවිමට බංගලා දේශයට යාමට හා ආපසු ඒමට වැය වු ගුවන් ටිකට් පත් ගාස්තුව වූ රු. 55,000 ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලා අදාල ආයතනය වෙත කිහිප වරක්ම දැනුම් දීම් කළද, මෙතෙක් එය පියවා නැති බැව් පිළිගනිමි. මෙම සංසදයේ වැඩසටහනට සහභාගි වි ඇති බව ත් එම වැඩ සටහන කොමිෂන් සභාවේ කටයුතු සඳහා පලදායි වි ඇති බවත් කාරුණිකව දන්වන අතර මෙතෙක් එම ගාස්තුව පියවා නොමැති බැවින් , එම සංසදය වෙත ගෙවිය යුතු වූ සාමාජික මුදලින් හෝ අය කරගැනීමට කටයුතු කරන බවත් එසේත් නොහැකි වුවහොත් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කර එහි නිර්දේශය පරිදි කටයුතු කිරිමට සටහන් කරගත් බවත් දන්වා සිටිමි.

(1) මු. රෙ. 754 ආයතනය විසින් නිළධාරින් 12 දෙනෙකුට සපයා දි තිබූ ජංගම දුරකථන කල් පැනීම සහ අභාවිත වීම නිසා ආපසු ලබා ගැනිමට නොහැකිව පැවති බව පිළි ගනිමි. එහෙත් විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව එම දුරකථන 12 න් 11ක් ආපසු ලබාගෙන ඇති බවත්, ඒවා ඉදිරි කාලය තුළදි අපහරණය කිරිමට කටයුතු කරන බවත් දන්වනු කැමැත්තෙමි. ආපසු ලබාගැනිමට නොහැකි වු ජංගම දුරකථනය ආපසු ලබා ගැනිම සඳහා තවදුරටත් කටයුතු කරන බවත් දන්වනු කැමැත්තෙමි.ආපසු ලැබුණු දුරකථන පිළිබඳ විස්තර ඇමුණුම් අංක 04 හි දැක්වේ.

11) මු.රෙ.760.අස්ථාන ගත වි ඇති රු 15.000ක් වටිනාකම වූ ජංගම දුරකථනය

මෙම දුරකථනය 2012.12.17 දින රු.15,002.10ක ට මිළදි ගත් එකක් වන අතර 2015 ජූලි 28 දින අස්ථානගත වි ඇත. ඒ අනුව පත්කරන ලද පරික්ෂණ නිළධාරිගේ නිර්දේශය මත එහි අගය හීන වූ වටිනාකම රු. 5.000 ක් ලෙසට තක්සේරු කර එම වටිනාකම නිළධාරියාගේ වැටුපෙන් අය කර ගැනීමට හෝ ඒ හා සමාන දුරකථනයක් සැපයීමට ලැබූ නිර්දේශය ට අනුව රු. 5,000ක් වූ මුදල අදාල නිළධාරියාගේ 2016 මැයි මාසයේ වැටුපෙන් අය කරගන්නා ලද බවත් කාරුණිකව දන්වමි.

(ආ) 2013 සැප්තැම්බර් 11 රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 02/2013 හි 3.3 ඡේදය

විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව2015 බදු වර්ෂයේ සිට මෙම මුදල් නිළධාරීන්ගේ පාරිශ්‍රමිකයෙන් අයකර ප්‍රේශණය කර ඇති බවත් දන්වමි.

4. මෙහෙයුම් සමාලෝචනය.

4.1. කාර්ය සාධනය

සඳහන් කර ඇති කරුණු පිළි ගනිමි.

4.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා.

මෙම ව්‍යාපෘති අතුරින් **SAP Accounting Software** ව්‍යාපෘතිය සඳහා ගෙවා ඇත්තේ අත්තිකාරම් මුදලක් නොවන අතර කළවැඩ සඳහා වූ කොටස් ගෙවීමක් බැව් කාරුණිකව දන්වමි. ඒ සඳහා සේවා දායකයින් විසින් කළ වැඩ වාර්තා සහ ටැක්ස් ඉන්වොයිසියක් නිකුත් කර තිබූ බැවින් හා කළ වැඩ පිළිබඳව සෑහිමකට පත්වූ බවට වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගෙවීම සිදු කර ඇති බවත් වැඩිදුරටත් දන්වමි.

4.3. මතභේදයට තුඩු දෙන ගණු දෙනු.

කොමිෂන් සභාවෙන් ඉටුකළහැකි කාර්යයන් නිසි පරිදි ඉටුකර ඇති බවත්, ඉන් ඔබ්බට කටයුතු කිරීමේ හැකියාවක් මෙම කොමිෂන් සභාවට නොමැති බවත් වැඩිදුරටත් දන්වා සිටිනු කැමැත්තෙමි. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මගින් මෙම රෙගුලාසි ගැසට් පත්‍රයේ පළකිරීම ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් ගරු අගමැති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ ආර්ථික කළමණාකරන කමිටුවේ දීද සාකච්ඡා කළ අතර එම කමිටුවේ මැදිහත්වීම මත මෙය අප්‍රමාදව ගැසට් කිරීමට විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට නියෝග කර ඇත.(එම තීරණය දැක්වෙන සටහනේ පිටපතක් ඇමුණුම් අංක 7 වශයෙන් අමුණා ඇත)

4.4.කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2015 වර්ෂයේ පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ තනතුරු දෙකෙන් එක් අධ්‍යක්ෂ තනතුරක් 2016 ජනවාරි සිට පුරවා ඇති බවත් නීති අධ්‍යක්ෂ තනතුරේ කටයුතු දැනට කොමිෂන් සභාවේ ලේකම් විසින් ආවරණය කරන බවත්, කොමිෂන් සභාවේ කාර්යභාරය පුලුල් වීමත් සමග ඉදිරියේදී නීති අධ්‍යක්ෂ තනතුර , සහකාර අධ්‍යක්ෂ තනතුර හා කළමණාකාර සහකාර තනතුරු පිරවීම සඳහා කටයුතු කරන බවත් දන්වමි.

(අ) (I) කොමිෂන් සභා පනතේ 12.(1) වගන්තියේ වූ විධිවිධාන පරිදි කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටුකරගැනිම සඳහා අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය තීරණය කිරීමේ බලය කොමිෂන් සභාවට ඇති හෙයින් කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන ඇති බව කාරුණිකව දන්වමි.

(II)බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදයක් පනතේ දැක්වෙන විධිවිධාන පරිදි කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අතර ඒ අනුව කටයුතු කර ඇති බවත් කාරුණිකව දන්වමි. බඳවා ගැනීම් හා උසස් කිරීම් කොමිෂන් සභා පනතෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉටුකර ඇති බැවින් වෙනත් අනුමැතියක් ලබාගැනිමේ අවශ්‍යතාවයක් නොමැති වූ බවත් කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය පරිදි මෙම කරුණ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත.

(ඈ) නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයට නිළධාරිනියක් බඳවාගත් අතර එම නිළධාරිනිය සේවයට ආධුනික බැවින් ඇයට නිසි ප්‍රවීණත්වය ලැබෙන තෙක් අධීක්ෂණ හා මගපෙන්වීමේ කාර්යයන් ඉටු කිරිමට කොන්ත්‍රාත් පදනම මත සේවයේ නිරතව සිටි නිළධාරියා අධ්‍යක්ෂ මුදල් තනතුරට ඔසවා (UPGRADE) තබන ලදි. මෙය ස්ථිර කාර්ය මණ්ඩලයේ උසස් වීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන බවත් දන්වමි. එවකට මුදල් අංශයේ ප්‍රධානියා වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි නිළධාරියා යටතේ නව නිළධාරිනියගේ අධීක්ෂණ හා පුහුණුකිරීමේ අවශ්‍යතාවය මත ඔහුව ඊට ඉහළ තනතුරට ඔසවා තැබීම පමණක් සිදු කර ඇත.

5.ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

අ) ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන ක්‍රියාකාර කම් වලින් අපේක්ෂිත කාල සීමාව තුළදිම කාර්යන් 07ක් සම්පූර්ණ කිරීමට නොහැකි වූ යේ කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර හේතූන් නිසාවෙන් බවත් එසේ ප්‍රමාද වීමට හේතුවූ කරුණු ඇතුළත් සටහනක්ද මේ සමග ඇමුණුම් අංක 05 වශයෙන් සකසා ඉදිරිපත් කර ඇති බවත් කරුණාවෙන් සලකන්න

(ආ)වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිමේදි පහත දැක්වෙන කරුණු ඇතුළත් කර ඇති බව දන්වමි.

1) සංවිධාන සටහන*ඇතුළත් කර ඇත කරුණාකර ඇමුණුම් අංක 06 බලන්න.
අනුමත කාර්ය මණ්ඩලය* (අංක 6 මානව සම්පත් නමැති මාතෘකාව යටතේ ඇතුලත් කර ඇත)

2) 2015 අයවැය ලේඛණය, 2015 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නැති බව පිළි ගනිමි. 2016 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ අයවැය ලේඛණය ඇතුලත් කර ඇත.

3) ප්‍රමුඛතා අනු පිළිවෙලට ක්‍රියාකාර කම් දැක්වීම) ප්‍රමුඛතා අනු පිළිවෙලට ක්‍රියාකාර කම්ද කාල නිර්ණයන්ද අපේක්ෂිත ඉලක්ක පිරිවැය හා පළදායිතාවයන් ද දක්වා ඇත. (Achievements, time line, output, outcome and expenditure)

4) ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නැති බව පිළිගනිමි. ඉදිරි වර්ෂයේදි සකස් කරනු ලබන ක්‍රියාකාරි සැලැස්මට වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කිරිමට සටහන් කරගත් බවත් කාරුණිකව දන්වා සිටිමි.

5) අභ්‍යන්තර විගණන සැලැස්ම - 2015 වර්ෂයේ ක්‍රියා කාරි සැලැස්මට ඇතුළත් ව නැති බව පිළිගනිමි. එහෙත් විගණන කමිටුවට ඉදිරිපත් කර නිර්දේශයන්ද ලබාගෙන ඒ අනුව සංශෝධනයන්ද සිදුකර කොමිෂන් සභාවටද ඉදිරිපත් කර කොමිෂන් සභාවේ අනුමැතියද ලබාගෙන ඇත. 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඉහත දැක්වෙන කරුණු අඩංගු කිරිමට සටහන් කරගත් බවත් කාරුණිකව දන්වමි.

5.2. අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයේ ඇත්තේ එක් නිළධාරියකු පමණක් වන බවත්, අභ්‍යන්තර විගණනයේදී නිරීක්ෂණ වු කරුණු අඩංගු විමසුම් හෝ වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කරන බවත්, එයට විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් මෙම අංශයේ විගණන කාර්ය භාරය ඉටුකරන විගණන අධිකාරි තුමිය සහභාගි වන බැවින්, ඇයටද මෙම විගණන විමසුම් පිටපත් නිකුත් කෙරෙන බැවින් විශේෂයෙන් පිටපතක් විගණකාධිපති තුමා වෙත නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති ලෙස සලකන ලද බවත් දන්වමි.කෙසේ වෙතත් අභ්‍යන්තර විගණන සැලැස්ම සකසා විගණන කමිටුවේද නිර්දේශ ලබාගෙන ඒ අනුව සංශෝධනයන් සිදුකර කොමිෂන් සභා මුල්‍යපාලන සංග්‍රහයේ 18.5 වගන්තියේ දැක්වෙන පරිදි කොමිෂන් සභාවේ අනුමැතියද ලබාගෙන ඇති බවත් දන්වනු කැමැත්තෙමි.ඉදිරි වර්ෂ සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපති තුමා වෙත ඉදිරිපත් කිරිමට සටහන් කරගත් බවත් දන්වමි.

5.3.අයවැය ලේඛනමය පාලනය

විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතුව තිබූ බලපත්‍ර ගාස්තු නිසි කලට වේලාවට නොලැබීම නිසාවෙන් ඇතැම් කාර්යයන් කලට වේලාවට ඉටුකර ගැනීම සඳහා මුදල් නොමැති වීමත්, කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර වූ හේතුන් නිසාවෙන් මේ ඇතැම් කාර්යයන් ඉටුකිරීම හා ගෙවීම් කිරිම පමා වීම නිසා ප්‍රතිපාදන උපයෝජනය විෂමතාවයන් ඇති වීමට හේතු වූ බවත් සඳහන් කරමි.

6. පද්ධති හා පාලන

කාර්ය මණ්ඩල පාලනය හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමේ පාලන පද්ධති කෙරේ විශේෂ අවධානයක් යොමු කිරිමට සටහන් කර ගත් බවත් කාරුණිකව දන්වමි.



සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

පිටපතඃ ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

විගණන කමිටු වාර්තාව

2015 වර්ෂය සඳහා වූ විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා මග පෙන්වීම නමැති අත්පොතෙහි 7.4.1 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන වලට අනුකූලව ඵලදායී ලෙස විගණන කමිටු පහත දැක්වෙනසේ පවත්වන ලදී.

නම	නිත්‍ය තනතුර	විගණන කමිටු නිළ තත්වය	විගණන කමිටු පැවැත්වූ දිනය	සාකච්ඡා සංක්ෂිප්තය
1. ප්‍රසාද් ගල්හේන මහතා 2. ජානකි විතානගම මහත්මිය 3. එම්.ආර්.වි.ආර්.මීපුර මහතා 4. ආර්.එස්. කටුගම්පල මහත්මිය 5. කේ.ජී.කීර්තිසේන මහතා 6. බි.එස්.ජයපාල මහතා	මහජන උපයෝගිතා කොමිෂන් සභා සාමාජික. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම්. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිනී. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂ.	සභාපති ලේකම් නිරීක්ෂක නිරීක්ෂක කැඳවුම්කරු ආරාධිත	2015.01.22	1.) 2014 ඔක්තෝබර් 23 දින පැවැති කමිටුවේ වාර්තාව සභා සම්මත කරගැනීම 2) 2013 වර්ෂය සඳහා වූ විගණකාධිපති වරයාගේ 13(7) ඒ වාර්තාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිම. 3) අභ්‍යන්තර විගණන නිළධාරියාගේ කාර්ය සාධන වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කිරිමට අනුමත කිරිම. 4) තොරතුරු තාක්ෂණ භාණ්ඩ උපකරණ සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තුව පිළිබඳ සාකච්ඡා කිරිම.
1. ප්‍රසාද් ගල්හේන මහතා 2. සංජය ගමගේ මහතා 3. ජානකී විතානගම මහත්මිය 4.එම්.ආර්.වි ආර්.මීපුර මහතා 5. ආර්.එස් කටුගම් මහත්මිය 6. කේ.ජී.කීර්තිසේන මහතා 7. බී.එස්.ජයපාල මහතා	මහජන උපයෝගිතා කොමිෂන් සභා සාමාජික. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය සභාපති. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම්. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේනතුවේ අධ්‍යක්ෂක. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිනි. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක. මහජන උපයෝගිතා කොමිෂන්සභාවේ මුදල් අධ්‍යක්ෂක.	සභාපති උපසභාපති ලේකම් නිරීක්ෂක නිරීක්ෂක කැඳවුම්කරු ආරාධිත	2015.04.08	1) 2015.01.22 දින පැවති කමිටුවේ වාර්තාව සම්මත කරගැනිම 2) විගණන විමසුම් හා පිළිතුරු සාකච්ඡා කිරිම 3) 2015/16 අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළිබඳ සාකච්ඡා කිරිම 4) 2015 පළමු කාර්තුවේ අභ්‍යන්තර විගණකගේ කාර්ය සාධනය සාකච්ඡා කිරිම.

1) ප්‍රසාද් ගල්හේන මහතා. 2) සංජය ගමගේ මහතා. 3) ජානකී විතානගම මහත්මිය. 4) එම්.ආර්.වී.ආර්.මීපුර මහතා. 5) ආර්.එස්. කටුගම්පල මහත්මිය. 6) කේ.ජී.කීර්තිසේන මහතා 7) බී.එස්.ජයපාල මහතා	මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සමාජික. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය සභාපති. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම්. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක. විගණකාධිපති දෙපාර්තමේනතුවේ විගණන අධිකාරිනී. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය මුදල් අධ්‍යක්ෂ.	සභාපති උප සභාපති ලේකම් නිරීක්ෂක නිරීක්ෂක කැඳවුම්කරු ආරාධිත.	2015.07.09	1) 201504.08 දින පැවැති කමිටුවේ වාර්තාව. 2) අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ. 3) 2015.07.03 දින පැවැති රේඛීය අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරන කමිටුවේදි එළඹ ගත් නියමයන් හා උපදෙස් පිළිබඳව සාකච්ඡා කිරිම. 4) අභ්‍යන්තර විගණකගේ දෙවැනි කාර්තුවේ කාර්යසාධන වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කිරිමට අනුමත කරගැනිම.
1) ප්‍රසාද් ගල්හේන මහතා 2) සංජය ගමගේ මහතා 3) ජානකී විතානගම මහත්මිය 4) ආර්.එස්.කටුගම්පල මහත්මිය 5) එම්.ආර්. වී.ආර්. මීපුර මහතා 6) ඩී.කුමාරසිංහ මහතා 7) කේ.ජී.කීර්තිසේන මහතා 8) බී.එස්. ජයපාල මහතා	මහජන උපයෝගිතා කොමිෂන් සභා සාමාජික . මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය සභාපති. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම්. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරි□. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මුදල් අධ්‍යක්ෂක.	සභාපති උප සභාපති ලේකම් නිරීක්ෂක නිරීක්ෂක ආරාධිත කැඳවුම්කරු ආරාධිත	2015.10.15	1) 2015.04.08 දින පැවැති කමිටුවේ වාර්තාව. 2) අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ. 3) 2014 විගණකාධිපතිගේ අවසාන වාර්තාව.. 4) අභ්‍යන්තර විගණකගේ තුන්වැනි කාර්තුවේ කාර්ය සාධන වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කිරිමට අනුමත කර ගැනිම.
1) ප්‍රසාද් ගල්හේන මහතා 2) සංජය ගමගේ මහතා 3) ජානකී විතානගම මහත්මිය 4) ආර්.එස්. කටුගම්පල මහත්මිය 5) එම්.ආර්.වී.ආර්. මීපුර මහතා 6) ඩී.කුමාරසිංහ මහතා 7) කේ.ජී.කීර්තිසේන මහතා 8) බී.එස්.ජයපාල මහතා .	මහජන උපයෝගිතා කොමිෂන් සභා සාමාජික මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය සභාපති. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම්. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරිනී. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මුදල් අධ්‍යක්ෂක	සභාපති උප සභාපති ලේකම් නිරීක්ෂක නිරීක්ෂක ආරාධිත කැඳවුම්කරු ආරාධිත.	2015.12.17	1) 2015.10.15 දින පැවති කමිටුවේ වාර්තාව. 2) අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ. 3) දැනුවත් කිරිමේ වැඩ සටහන නමින්වූ ටීආර්ජ්/ඩී/පීයූසී/1/15/16 අංක දරන විගණන විමසුම. 4) 2015 නොවැම්බර් දක්වා අභ්‍යන්තර විගණන නිළධාරියාගේ කාර්ය සාධනය.

මූල්‍ය ප්‍රකාශන 2015

මූල්‍ය තත්ව ප්‍රකාශනය
2015 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

	Notes	2015 Rs	2014 Rs
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	1	30,755,494	27,984,521
දැනට කෙරෙමින් පවතින වැඩ	1.1	900,382	-
ආපදා ණය		2,402,453	3,250,783
මුළු ජංගම නොවන වත්කම්		**34,058,329**	**31,235,304**
ජංගම වත්කම්			
ආයෝජන	2	68,586,020	115,229,044
ඉන්වෙන්ටරි භාණ්ඩ	3	60,212	86,635
ලැබිය යුතු ගාස්තු	4	106,916,490	64,366,335
තැන්පතු අත්තිකාරම් සහ පූර්ව ගෙවීම්	5	6,108,048	5,641,567
මුදල් ශේෂය		50,194,831	9,602,867
		231,865,601	**194,926,448**
මුළු වත්කම්		**265,923,930**	**226,161,752**
අරමුදල් සහ බැරකම් අරමුදල්			
සමුච්චිත අරමුදල	6	207,128,049	196,138,821
ප්‍රතිතක්සේරුකරණ සංචිත		3,027,878	3,027,878
ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණික සහන ව්‍යාපෘති		2,227,880	2,227,880
		212,383,807	**201,394,579**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන සැළසීම		9,492,922	7,729,525
		9,492,922	7,729,525
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	7	32,707,201	5,897,648
විගණකාධිපති ගාස්තුව	8	740,000	540,000
ආරක්ෂිත තැන්පතු - CEB		10,600,000	10,600,000
මුළු වගකීම්		**44,047,201**	**17,037,648**
		265,923,930	**226,161,752**

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

සාලිය මැතිව්
සභාපති

විස්තීරන ආදායම් ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා

	Notes	2015 Rs	2014 Rs
ආදායම			
විචල්‍ය ලියාපදිංචි කිරිමේ ගාස්තු	9	43,562,900	38,633,431
වාර්ෂික නියාමන ගාස්තු	10	173,946,525	154,090,150
බලපත්‍ර අයදුම්පත් ගාස්තු	11	280,000	440,000
වෙනත් ආදායම්	12	5,010,359	7,365,483
මුළු ආදායම්		**222,799,784**	**200,529,064**
වියදම්			
පුද්ගල පඩිනඩි	13	81,347,494	75,017,875
විශ්‍රාමික ප්‍රතිලා හ උපදේශන සේවා		41,053,981	16,386,528
මෙහෙයුම් වියදම්	14	96,334,574	84,426,653
මුල්‍ය පිරිවැය	15	14,967	27,298
මුළු වියදම්		**218,751,016**	**175,858,354**
මෙහෙයුම් අතිරික්තය		**4,048,768**	**24,670,710**

2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා

මූල්‍ය ප්‍රතිපත්ති සහ සටහන් පිටු අංක 5 සිට 12 දක්වා, මූල්‍ය ප්‍රකාශනවල එකතුවකි

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා

	2015 Rs	2014 Rs
මෙහෙයුම් කටයුතුවලින් ඇති වූ මුදල්		
වර්ෂය තුළ මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	4,048,768	24,670,710
ගැලපීම්		
ක්ෂය ප්‍රතිපාදන	11,454,707	11,503,469
පාරිතෝෂික ප්‍රතිපාදන	1,763,397	2,211,641
ස්ථාවර වත්කම් අපහරණ ආදායම	(122,075)	
පූර්ව වර්ෂ ගැලපීම	6,940,460	1,669,201
පිළී ආදායම	(4,689,873)	(7,143,435)
මූල්‍ය වියදම්	14,967	27,298
	19,410,351	**32,938,884**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම		
වැඩිවීම් අඩුවීම් තොග	26,423	59,812
වැඩිවීම් අඩුවීම් තැම්පතු	-	6,372,482
වැඩිවීම් අඩුවීම් ලැබියයුතු	(43,068,944)	(45,422,477)
වැඩිවීම් අඩුවීම් ගෙවිය යුතු	26,809,553	3,457,754
වැඩිවීම් අඩුවීම් වෙන්කිරීම්	200,000	(10,792,414)
වැඩිවීම් අඩුවීම් අත්තිකාරම්, ඉදිරියට ගෙවීම් සහ ආපදා ණය	381,848	(2,007,953)
ශුද්ධ -කාරක ප්‍රාග්ධන	**(15,651,120)**	**(48,332,796)**
මෙහෙයුම් කටයුතුවලින්	3,759,231	(15,393,912)
ආයෝජන කටයුතුවලින් ඇතිවූ මුදල් ප්‍රවාහ		
ස්ථාවර වත්කම් අපහරණය කිරීම්, මුදල් ලැබීම්	122,075	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(15,126,061)	(11,803,914)
ලැබූ පොලි	4,851,686	9,614,047
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්	47,000,000	81,000,000
ආයෝජන /ස්ථාවර තැන්පතු		-
ශුද්ධ - කාරක ප්‍රාග්ධන		(63,908,788)
ආයෝජන කටයුතුවලින් (භාවිතයෙන්) ඇතිවූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**36,847,700**	**14,901,346**
මූල්‍ය වියදම්	(14,967)	(27,298)
පාරිතෝශිත ගෙවීම්		(442,500)
ප්‍රාග්ධන මූල්‍ය ප්‍රවාහය - මූල්‍ය කටයුතු	**(14,967)**	**(469,798)**
මුදල් ශේෂය	9,602,867	10,565,232
	50,194,831	**9,602,867**
මුදල් හා මුදල් වලට සමාන දේවල්	**50,194,831**	**9,602,867**
බැංකුවේ ඇති මුදල්	**50,194,831**	**9,602,867**

ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා

	සමුච්චිත අරමුදල Rs.	නැවත තක්සේරු කිරීමේ සංචිත Rs.	ආසියානු සහන Rs.	එකතුව Rs.
2015. 01.01 දිනට ශේෂය පූර්ව වර්ෂ ගැලපුම්	196,138,821	3,027,878	2,227,880	201,394,579
2014 ජනවාරි 01 දිනට ශේෂය	**196,138,821**	**3,027,878**	**2,227,880**	**201,394,579**
ආදායම් ප්‍රකාශයේ අතිරික්තය/(හිගය)	4,048,768	-	-	4,048,768
පූර්ව වර්ෂ ගැලපුම්	6,940,460	-	-	6,940,460
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**207,128,049**	**3,027,878**	**2,227,880**	**212,383,807**

පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

01 පොදු කරුණු

ජාතික ඒකාබද්ධතා ප්‍රතිපත්තියකට අනුකූලව යම් යම් උපයෝගීතා කර්මාන්ත නියාමනය කිරීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) ස්ථාපිත කරන ලදි.
ඉහත ප්‍රතිපත්තිය අනුව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත බලාත්මක වීමත් සමගම, ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පූර්ණ වශයෙන් බලය පැවරිණි.

02 පිළියෙල කිරීමේ පදනම

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ අවශ්‍යතා සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කොට තිබේ.

2.2 මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය අනුවය.

2.3 මූල්‍ය කාල පරිච්ඡේදය
කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂයවේ.

03 වර්ෂය තුළ නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම

කොමිෂන් සභාව විසින් ප්‍රවර්තන මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මකව පවතින පහත දැක්වෙන නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) අනුගමනය කර ඇති අතර අවශ්‍ය අවස්ථාවන්හිදී, මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි සංශෝධන පිළිබිඹු කිරීම පිණිස සංශෝධනය කර තිබේ.
නව සහ සංශෝධිත ප්‍රමිති අනුගමනය කිරීම ඉදිරිපත් කිරීමේ ක්‍රම වෙනස් වීමට හේතු වී ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අමතර හෙළිදරව් කිරීම්ද සිදු කර තිබේ.

කොමිෂන් සභාවට අදාළ වන නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පහතින් දක්වා තිබේ.

LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
LKAS 2 වට්ටෝරු භාණ්ඩ
LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂවල වෙනස්කම්
LKAS 10 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්
LKAS 16 දේපළ, පිරියත සහ උපකරණ
LKAS 24 ආයෝජනය කිරීම් සඳහා ගණනය කිරීම්
LKAS 40 රජයේ ප්‍රදාන සඳහා වන ගිණුම්කරණය කිරීම් සහ රජයේ සහාය හෙළිදරව් කිරීම
LKAS 20 ආදායම
LKAS 24 අදාළ පාර්ශ්ව හෙළිදරව් කිරීම්
LKAS 26 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් අනුව ගිණුම්කරණය සහ වාර්තා කිරීම

04 සංසන්දනාත්මක තොරතුරු

කොමිෂන් සභාව විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, ප්‍රකාශිතව දක්වා නොමැති නම් හැර, පසුගිය වසරේ අනුගමනය කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ. පසුගිය වසරේ සංඛ්‍යාලේඛන සහ වාක්‍යාංශ, අවශ්‍ය අවස්ථාවන්හිදී, ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම පිණිස නැවත සකසා තිබේ.

05 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සියලු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල සිදුකර තිබේ

06 වත්කම් පිළිබඳ තක්සේරු කිරීම සහ ඒවායේ මිණුම්වල පදනම

6.1 දේපළ පිරියත සහ උපකරණ

දේපළ පිරියත සහ උපකරණ වාර්තා කර ඇත්තේ පිරිවැය/ අඩු සමුච්චිත ක්ෂය වීම් පිරිවැය මත සහ පහතින් විස්තර කර ඇති නැවත තක්සේරු කිරීමේ ප්‍රතිලාභ හා පාඩු මත වේ.

දේපළ පිරියත සහ උපකරණවල පිරිවැය යනු අභිමත භාවිතය සඳහා වත්කම් ඒවායේ ක්‍රියාකාරි තත්ත්වයට ගෙන ඒම පිණිස දැරූ යම් යම් වියදම්ද ඇතුළුව මිලට ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය වේ.

6.2 දේපළ පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම

දේපළ පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුවක් පත් කරන ලදි. මෙම ක්‍රියාවලියේදී, සලකා බැලීම පිණිස සාධාරණ වටිනාකම් පිළිබඳ වෙළඳපල වටිනාකම්වල සාක්ෂි නොවීය. වත්කම් නැවත තක්සේරු කිරීම ආරම්භ වනුයේ 2011 දෙසැම්බර් 31 දින සිටය.

වත්කමක් නැවත තක්සේරු කරනු ලබන විට, වටිනාකමේ කිසියම් වැඩිවීමක් වෙතොත් එය නැවත තක්සේරු කිරීමේ සංචිතය වෙත බැර කෙරෙන අතර, වටිනාකමේ කිසියම් අඩු වීමක් එය නැවත තක්සේරු කිරීමේ සංචිතවල අතිරික්තයට කෙළින්ම ගලපනු ලැබේ.

නොමිලේ භාවිතා කෙරෙන වත්කම්

කොමිෂන් සභාව විසින් මුද්දරවලට මුද්‍රාගැසීමේ යන්ත්‍රයක් නොමිලයේ තැපැල් දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගෙන තිබේ. කොමිෂන් සභාව විසින් එහි සේවා ගාස්තු වැය කර ඇති අතර එම මුදලම උපකරණ නඩත්තු ගිණුමට බැර කර තිබේ. තවද මෙම දේපළ තැපැල් දෙපාර්තමේන්තුව සතු දේපළක් ලෙස සලකා තිබේ. එම නිසා එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ දේපළක් ලෙස සැලකිය නොහැකි විය.

6.3 ක්ෂය ප්‍රතිභාගය

ක්ෂය ප්‍රතිභාගය සඳහා වන ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ, 2011 දෙසැම්බර් 31 දින ප්‍රගති තක්සේරු කළ දේපළ පිරියත සහ උපකරණවල පරිවැය නොවන යන්ත්‍ර දේපළ පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ඍජු රේඛීය පදනමක් භාවිතා කිරීමෙනි. වත්කම්වල ක්ෂය ප්‍රතිභාග වටිනාකම් පහත පරිදි වේ:

1. ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
2. පරිගණක සහ කාර්යාලයීය උපකරණ	20%
3. වාහන	20%
4. පරිගණක මෘදුකාංග	33 1/3%

ක්ෂය ප්‍රතිභාග සඳහා වන ගණනය කිරීම් අදාළ වනුයේ ප්‍රවර්තන වර්ෂය තුළ දේපළ යන්ත්‍ර සහ උපකරණ මිලට ගත් දින සිටය.
2011 වර්ෂය තුළ නැවත තක්සේරු කරන ලද වත්කම් තීරණය කර ඇත්තේ, ක්ෂය වීම් ගණනය කිරීමේ පදනම ලෙස පහත දැක්වෙන අනුපාතිකයන් සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂවල ක්ෂය වන ආකාරයටය.

පරිගණක සහ කාර්යාල උපකරණ	100%

ප්‍රයෝජනවත් ජීවිත, ශේෂ වටිනාකම් සහ වත්කම් ක්ෂය කිරීම් ක්‍රම අවශ්‍ය වුවහොත්, එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සිදු කරනු ලැබේ.

07 භාණ්ඩ තොග ලේඛන

තොග භාණ්ඩ තක්සේරු කරනු ලබන්නේ අඩු වටිනාකම් යටතේය. එක් එක් ඉන්වෙන්ටරි භාණ්ඩ කාණ්ඩය තීරණය කරනු ලබන්නේ පහත පදනමිනි.
ලිපිද්‍රව්‍ය - මිලට ගත් මිල.

08 ආයෝජන

කොමිෂන් සභාව වෙත හිමි වන ප්‍රතිලාභ උපරිම කිරීම පිණිස මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව, කොමිෂන් සභාව සිය අතිරික්ත ආදායම ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු, ඒක්ෂන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබේ.

09 ලැබිය යුතු මුදල්

ලැබිය යුතු මුදල් ප්‍රකාශ කර ඇත්තේ ඒවා උපලබ්ධි වීමට නියමිත මුදල් ආකාරයටය. බොල් හෝ අවිනිශ්චිත ණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නැත.

10 අත්තිකාරම් සහ පෙර ගෙවුම්

අත්තිකාරම් ගිණුමෙහි කාර්ය මණ්ඩලය වෙනුවෙන් වන වෛද්‍ය රක්ෂණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවන ලද වාරිකයේ කොටසක් අඩංගු වේ. මෙම ඔප්පුව 2014 සැප්තැම්බර් මස 30 දක්වා බලාත්මක බැවින්, ගෙවන ලද වාරිකය සමානුපාතික පදනමින් සැලකීමට අවශ්‍ය වී තිබේ.

11 මුදල් හා මුදල්වලට සමාන දේ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තිබෙන මුදල් හා මුදල්වලට සමාන දේ තුල බැංකුවේ සහ අතැති මුදල් අන්තර්ගත වේ.

12 විශ්‍රාමික ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

12.1 අංක 42 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන සේවය ආරම්භ කළ දින සිට එක් එක් වසර සඳහා මාස භාගයක වැටුපට සමාන 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' හා අනුකූලව, කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති තීරණයකට අනුව සේවකයෙකු විසින් අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්‍රාමික පාරිතෝෂිකය ලබාදීමට පූර්ණ විධිවිධාන සලසා තිබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම අනුව, සේවකයෙකු සඳහා වන පාරිතෝෂික හා සම්බන්ධ බැඳීම ආරම්භ වනුයේ කොමිෂන් සභාව හා අඛණ්ඩ එක් අවුරුදු කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. එමනිසා, පාරිතෝෂික පනත අනුව පාරිතෝෂික ප්‍රතිපාදන සලසා තිබේ.

ශේෂ පත්‍ර දිනට පසුව වගකීම සඳහා වන ප්‍රතිපාදන බාහිර වශයෙන් ආයෝජනය කෙරේ.

12.2 සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

සුදුසුකම්ලත් සේවකයින් සඳහා අදාළ ව්‍යවස්ථාවන් සහ නියාමයන් අනුව දායක මුදල් ගෙවීම් කොට තිබේ.

2013 ඔක්තෝම්බර් 01 වෙනිදා සිට අර්ථසාධක අරමුදල් දායකත්වය සේවකයා මගින් 8% සිට 10% දක්වාද ආයතනය මගින් 12% සිට 15% දක්වාද ඉහල දමන ලදී.

13 ගෙවිය යුතු මුදල්

ගෙවීම් ප්‍රකාශ කොට ඇත්තේ ඒවායේ පිරිවැය මතය.

14. ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණික සහන ව්‍යාපෘතිය යටතේ පවරන ලද වත්කම

පහත සඳහන් පරිගණක සහ උපකරණ තොගය ආසියානු සංවර්ධන බැංකු තාක්ෂණික සහන ව්‍යාපෘතිය යටතේ මහජන උපයෝගිතා කොමිෂන් සභාවට පවරන ලදී. අදාළ ආසියානු සංවර්ධන බැංකු ආධාර මුදල ඊට අදාල වත්කම් ක්ෂය වන කාල පරිච්ඡේදය තුළ කපා හැරීමට තීරණය කරන ලදී.

	රු.
වෙබ්පාදක බලපත්‍රලාභී තොරතුරු	451,880
සම්පාදන පද්ධතිය	
ලැප්ටොප් පරිගනක - 9	1,418,580
ඩෙස්ක්ටොප් පරිගනක - 4	357,420
අය කළ මුළු අගය	2,227,880

ආදායම් ප්‍රකාශය

15 ආදායම හඳුනාගැනීම

15.1 විචල්‍ය ලියාපදිංචි (බලපත්‍ර) ගාස්තු

ශ්‍රී ලංකා රජය සමඟ ලියා අත්සන් කළ "ලිහිසි තෙල් ගිවිසුමේ" 2 වන වගන්තිය අනුව, රුපියල් මිලියන පහක උපරිමයකට යටත්ව, අදාළ කාල පරිච්ඡේදය සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කළ මුළු විකුණුම්වලින් 0.5% ක් හෝ රුපියල් මිලියන එකකට සමාන ස්ථාවර සහ විචල්‍ය ලියාපදිංචි කිරීමේ (බලපත්‍ර) ගාස්තුවක් (දෙකෙන් වැඩි මුදල) ලිහිසි තෙල් වෙළඳපලේ සහභාගී වන්නන් විසින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. අර්ධ වාර්ෂික කාලය සඳහා වෙළඳපල සහභාගීකරුවන්ගේ ඉන්වොයිස් ඉදිරිපත් කළ මුළු විකුණුම්වල වටිනාකම රුපියල් මිලියන එකකට වඩා වැඩි නම්, අදාළ කාලය අවසන් වී දින 30ක් ඇතුළත අතිරේක මුදල මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය.

15.2 වාර්ෂික ගාස්තුව

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වන වගන්තිය ප්‍රකාරව, වාර්ෂික නියාමන ගාස්තුවක් පැනවීම සඳහා කොමිෂන් සභාව වෙත බලය පැවරෙන අතර එම වසරේ ජූනි මස 30 වන දිනට පෙර සෑම බලපත්‍ර ලාභියෙකු වෙතින්ම එම ගාස්තුව අය කර ගත යුතුය. මෙම පනත 2009 අප්‍රේල් මස 8 වන දින සම්මත කරන ලද අතර එදින පටන් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදි.

15.3 බලපත්‍ර අයදුම්පත් ගාස්තු

පනවා ඇති ගාස්තුවලට අමතරව, ශ්‍රී ලංකා විදුලිබල පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදාහැරීම සඳහා වන බලපත් සඳහා වන බලපත්‍ර අයදුම්පත් සමඟ අයදුම්පත් සැකසීමේ ගාස්තුවක් අය කර ගැනීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරී තිබේ.

15.4 පොලී ආදායම

පොලී ආදායම ගණනය කරන ලද්දේ උපචිත පදනමිණි. ගනුදෙනුව හා අදාළ ආර්ථික ප්‍රතිලාභ කොමිෂන් සභාව වෙත ගලා එනු ඇති බවට විශ්වාසයක් ඇති විට පමණක් ආදායම් හඳුනා ගැනේ. එම නිසා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 133 (1) වන වගන්තිය අනුව 10% රඳවා ගැනීමේ බද්ද මුළු බද්ද ලෙස අඩු කිරීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොලී ආදායම පෙන්නුම් කර තිබේ.

15.5 රජයේ ප්‍රදාන

ඇස්තමේන්තුගත වියදම 2009 ජූනි මස සිට සිය ආදායමින් පියවා ගැනීමට කොමිෂන් සභාව තීරණය කර ඇති හෙයින් සමාලෝචනය කෙරෙන වර්ෂය තුළ කිසිදු රජයේ ප්‍රදානයක් එය වෙත නොලැබුණි.

16 වියදම් හඳුනාගැනීම

කොමිෂන් සභාව විසින් අනුමත කළ අයවැය ප්‍රතිපාදන පිළිබඳ ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනා ගෙන තිබේ.

17 අනෙකුත් තොරතුරු

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7(අ) වගන්තිය අනුව කොමිෂන් සභාව ආදායම් බද්දෙන් නිදහස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලෙස කොමිෂන් සභාව ගරු සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබේ. මේ සම්බන්ධයෙන් තීරණයක් තවමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබී නොමැත. එම නිසා අවිනිශ්චිත බැරකමක් ශේෂ පත්‍ර දිනට පවතී. කොමිෂන් සභාවේ අරමුණු සහ කර්තව්‍යයන්හි ස්වභාවය අනුව බදු නිදහස් වීමක් ලැබීමේ හැකියාව ඉහළ බැවින්, ගෙවීමට නියමිත ආදායම් බදු බැරකම් වෙනුවෙන් ප්‍රතිපාදනයක් සිදු කර නොමැත.

18. හෙළිදරව් කිරීම

නඩු අංක - රිට් 08/2013 යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මගින් ආරක්ෂක තැන්පතුවක් ලෙස රුපියල් මිලියන 10.6 ක් තබා ඇත.

අදාළ පාර්ශ්ව ප්‍රකාශන

නම	තනතුර	වෙනත් තනතුරු	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 අනුව අදාල පාර්ශ්ව සම්බන්ධතා
සී. එන්. එන්. ඩබ්ලිව් මැතිව්	සභාපති	මැතිවරණ සීමා නීර්ණය කොමිසමේ සාමාජික ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාල සභාවේ සමාජික (13/03/2015 දක්වා)	අදාළ නොවේ අදාළ නොවේ
සංජය ගමගේ	නියෝජ්‍ය සභාපති	නිල නොලත් මහේස්ත්‍රාත්, ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය, කොළඹ. විධායක කමිටු සාමාජික, ශ්‍රී ලංකා නීතිඥ සංගමය නිතිඥ	අදාළ නොවේ අදාළ නොවේ අදාළ නොවේ
මහාචාර්ය රාහුල අතලගේ	කොමිෂන් සභාවේ සාමාජික	නියෝජ්‍ය උප කුලපති, මොරටුව විශ්ව විද්‍යාලය. අධ්‍යක්ෂ එන්වයර්න් සස්ටේනබිලිටි ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ් අධ්‍යක්ෂ පොලිපො (ප්‍රයිවට්) ලිමිටඩ්	අදාළ නොවේ අදාළ නොවේ අදාළ නොවේ
ප්‍රසාද් ගල්හේන	කොමිෂන් සභාවේ සාමාජික		

ම. උ. කො. ස.
දේපල පිරියත හා උපකරණ
2015 දෙසැම්බර් 31 දිනට

	ගෘහභාණ්ඩ සහ සවිකිරීම් රු.ශත	පරිගණක සහ කාර්යාලයීය උපකරණ රු.ශත	වාහන රු.ශත	උපකරණ රු.ශත	මෘදුකාංග රු.ශත	එකතුව රු.ශත
වර්ෂය ආරම්භය වන විට	12,529,572.00	22,004,072.00	25,969,060.00	30,305.00	4,549,884.00	65,082,893.00
වර්ෂය තුළ එකතු වීම්	2,465,988.00	4,709,924.00	6,900,000.00	-	149,767.00	14,225,679.00
අපහරණය	(170,125.00)	(895,469.00)				(1,065,594.00)
වර්ෂය අවසානය වන විට	**14,825,435.00**	**25,818,527.00**	**32,869,060.00**	**30,305.00**	**4,699,651.00**	**78,242,978.00**
ක්ෂය ප්‍රතිභාය						
වර්ෂය ආරම්භය වන විට	9,705,366.00	11,173,216.00	13,254,847.00	-	2,964,942.00	37,098,371.00
වර්ෂය තුළ වෙනස් වීම්	1,152,357.00	4,156,809.00	5,089,000.00		1,056,541.00	11,454,707.00
ගැළපුම්	(170,125.00)	(895,469.00)				(1,065,594.00)
වර්ෂය අවසන් වන විට	**10,687,598.00**	**14,434,556.00**	**18,343,847.00**	**-**	**4,021,483.00**	**47,487,484.00**
2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් වටිනාකම	**4,137,837.00**	**11,383,971**	**14,525,213**	**30,305**	**678,168**	**30,755,494.00**

සටහන :1.1 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

ව්‍යාපාති කළමණාකරන ක්‍රියා පිලිවෙල සහ ලිපිගොනු කළමණාකරන පද්ධතිය	399,000
ආරවුල් විසඳීමේ පද්ධතිය	150,400
ගිණුම්කරන පද්ධතිය	350,982
	900,382

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් 2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා	2015 Rs	2014 Rs
02. ආයෝජන		
ස්ථාවර තැන්පතු	60,500,000	107,500,000
පාරිතෝෂිත සඳහා විශේෂ මුදල් ආයෝජන	8,086,020	7,729,044
	68,586,020	**115,229,044**
03. තොග	60,212	86,635
	60,212	**86,635**
04. ලැබීම්		
විචල්‍ය ලියාපදිංචි කිරීමේ ගාස්තු		
ලංකා ඉන්දියන් ඔයිල් කොම්පැණි ලිමිටඩ්	4,000,000	4,000,000
සෙව්රොන් ලුබ්රිකන්ට් ලංකා	4,000,000	4,000,000
මැක්ලරන්ස් ලුබ්රිකන්ට්	2,183,287	1,820,021
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව	4,000,000	7,000,000
ලාෆ්ස් ලුබ්රිකන්ට් ලිමිටඩ්	1,313,494	1,322,039
ඉන්ටර්ඕෂන් සර්විසස් ලිමිටඩ්	580,565	329,519
ඇසෝසියේටඩ් මෝටර්ස්	1,115,759	604,380
TVS ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	1,842,638	1,173,779
යුනයිටඩ් මෝටර්ස්	862,263	537,347
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	2,651,831	1,593,362
එන් එම් ඩිස්ට්‍රිබියුසන් පුද්ගලික සමාගම	1,694,698	1,467,430
	24,244,535	**23,847,877**
වාර්ෂික නියාමන ගාස්තු	82,381,128	39,696,750
ස්ථාවර තැන්පතු පොළී	228,499	747,288
අනෙකුත් ලැබීම්	62,328	74,421
	106,916,490	**64,366,335**
05. අත්තිකාරම් සහ ඉදිරියට ගෙවීම්		
තැන්පතු		
ඩයලොග් ඇක්සියාටා පීඑල්සී	1,500	1,500
බැන්ක් ඔෆ් සිලෝන් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්	826,571	826,571
ගර්ල් ෆ්‍රේන්ඩ්ලි ඇසෝසියේෂන්	8,800	8,800
	836,871	**836,871**
අත්තිකාරම් සහ ඉදිරියට ගෙවීම්		
අත්තිකාරම්	180,030	121,350
තැපැල් තැන්පතු	6,595	30,500
ඉදිරියට ගෙවීම්	3,873,720	3,587,129
	4,060,345	**3,738,979**

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් 2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා	2015 Rs	2014 Rs
ආපදා ණය	1,105,732	985,616
උත්සව අත්තිකාරම්	105,100	80,100
මුළු අත්තිකාරම් සහ ඉදිරියට ගෙවීම්	**6,108,048**	**5,641,567**
06. සමුච්චිත අරමුදල		
2015 ජනවාරි 1 දිනට ඉතිරිය	196,138,821	168,164,175
2015 ජනවාරි 1 දිනට අතිරික්තය/ හිඟය	4,048,768	24,670,710
විශේෂ අරමුදල් ආයෝජන	-	1,500,000
පූර්ව වර්ෂ ගැලපුම්	6,940,460	1,803,936
	207,128,049	**196,138,821**
6.1 හෙලිදරව් කිරීම/ පූර්ව වර්ෂ		
ගැලපුම්	**2014**	**2013**
සන්නිවේදන	(2,152)	-
අලාභ පරිවර්තන	(1,791)	-
මහජන දැනුවත් කිරීම්	(12,000)	-
වාර්ෂික නියාමන ගාස්තු	6,219,000	93,000
විචල්‍ය ලියාපදිංචි ගාස්තු	596,403	-
එකතුව	**6,799,460**	**93,000**
මුළු එකතුව	**6,940,460**	
07. ගෙවිය යුතු ගිණුම්		
පාරිභෝගික ද්‍රව්‍ය	343	12,538
මුද්‍රණ හා ප්‍රචාරණ	4,243,151	154,476
සන්නිවේදන	237,144	245,226
මල් සැරසිලි	8,617	-
පරිවර්තන	7,209	-
අනෙකුත් ගාස්තු	2,279,617	-
පුවත්පත්	13,750	11,810
අතිකාල	134,352	125,613
ලිපිද්‍රව්‍ය	1,500	-
ප්‍රවාහන	10,389	12,354
ගමන් වියදම්	25,375	23,500
සුභ සාදන සහ මහජන සම්බන්දීකරනය	23,520	11,715
කාර්යාල නඩත්තු	-	10,855
වාහන	23,420	-
මෘදුකාංග	-	8,568
පරිගණක හා උපකරණ නඩත්තුව	6,000	-
ජලය	18,087	25,221

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් 2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා	2015 Rs	2014 Rs
විදුලිය	98,594	93,197
මහජන දැනුවත් කිරීම්	6,463,907	163,296
උපදේශන	18,130,378	-
මුද්දර බදු ගෙවීම	3,650	3,525
දේශීය පුහුණුවීම්	907,609	4,995,754
සණීපාරක්ෂක සේවා	849	-
තැපැල්	860	-
පර්යේශන සහ සමීක්ෂණ	68,880	-
	32,707,201	**5,897,648**
08. විගනණ ගාස්තු		
ඉදිරියට ගෙවීම්	540,000	360,000
වර්ෂය සඳහා ප්‍රතිපාදන	200,000	180,000
	740,000	**540,000**
09. විචල්‍ය ලියාපදින්චි ගාස්තු		
ලංකා ඉන්දියන් ඔයිල් කොම්පැණි ලිමිටඩ්	8,000,000	8,000,000
සෙව්රොන් ලුබ්රිකන්ට් ලංකා	8,000,000	8,000,000
මැක්ලරන්ස් ලුබ්රිකන්ට්	3,278,998	5,032,692
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව	7,958,471	7,000,000
ලාෆ්ස් ලුබ්රිකන්ට් ලිමිටඩ්	2,622,232	2,785,151
ඉන්ටර්ඔෂන් සර්විසස් ලිමිටඩ්	1,097,037	347,161
ඇසෝසියේටඩ් මෝටර්ස්	1,892,777	1,306,902
TVS ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	3,392,511	2,075,504
යුනයිටඩ් මෝටර්ස්	1,411,358	537,347
ටොයෝටා ලංකා පුද්ගලික සමාගම	4,780,721	2,874,757
එන් එම් ඩිස්ට්‍රිබියුසන් පුදගලික සමාගම	1,128,795	673,918
	43,562,900	**38,633,432**
10. වාර්ෂික නියාමන ගාස්තු		
උත්පාදන ගස්තු	63,576,525	46,802,150
සම්ප්‍රේශන ගාස්තු	21,370,000	21,800,000
බෙදාහැරීම් ගාස්තු	89,000,000	85,488,000
	173,946,525	**154,090,150**
11. බලපත්‍ර ඉල්ලුම් ගාස්තු	280,000	-
	280,000	**440,000**

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්
2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා

	2015 Rs	2014 Rs
12. වෙනත් ආදායම්		
පොළිය	4,689,873	7,260,652
නිදහස් කිරීමේ ගාස්තු	6,000	6,000
විවිද ආදායම්	192,411	98,830
ස්ථාවර වත්කම් අපහරණය	122,075	-
	5,010,359	**7,365,483**
13. පිරිස් පිරිවැය		
පොළිය		
නිදහස් කිරීමේ ගාස්තු	1,536,000	1,292,000
විවිද ආදා ම්	44,165,785	42,440,802
සත්‍යාපනය කිරීමේ ගාස්තු-ග්‍රීන් එනර්ජි	24,660,340	20,252,708
ස්ථාවර වත්කම් අපහරණය	1,366,988	1,191,124
සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල්	6,545,820	6,358,000
සේවක භාරකාර අරමුදලට දායක මුදල්	1,309,164	1,271,600
Gratuity Expense	1,763,397	2,211,641
එකතුව	**81,347,494**	**75,017,875**
14. මෙහෙයුම් පිරිවැය		
විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන්		
විදේශීය ගමන් වියදම්	3,585,232	7,755,703
ආනුෂංගික/දෛනික	1,148,209	2,708,287
ගමන් වියදම් (දේශීය)	3,721,389	2,864,448
විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන්	1,118,400	1,374,741
	9,573,230	**14,703,179**
පාරිභෝජ්‍ය භාණ්ඩ		
ලිපිද්‍රව්‍ය	664,124	582,748
ආරම්බක ශේෂය 01-01-2014	86,635	146,447
ආවසාන ශේෂය 31-12-2014	-60,212	-86,635
ඉන්ධන හා ගාල් කිරිම	4,019,819	4,667,499
පාරිභෝජ්‍ය භාණ්ඩ	122,072	68,690
විනෝදාස්වාදය	201,324	264,368
	5,033,762	**5,643,118**

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් 2015 දෙසැම්බර් 31 දක්වා වූ වසර සඳහා	2015 Rs	2014 Rs
කොන්ත්‍රාත්තුගත සේවා		
ප්‍රවාහනය සහ වාහන කුළියට ගැනීම	10,131,748	9,961,739
පුවත්පත් සහ තැපැල් ඇතුළුව පණිවුඩ හුවමාරුව	3,138,228	2,862,878
මුද්‍රණ සහ වෙළඳ දැන්වීම්	6,603,263	7,588,337
සමීක්ෂණ	1,951,066	1,832,090
කුළී සහ ගොඩනැගිලි ගාස්තු	10,025,397	10,111,276
විදුලිබලය	1,030,012	1,085,387
වෛද්‍ය	4,333,031	4,217,836
ජලය	308,755	310,300
රක්ෂණය	542,729	779,977
දායකත්වය	737,169	503,554
පවිත්‍ර කිරීමේ සේවා	860,284	863,415
නීති සහ පර්යේෂණ ගාස්තු	517,000	480,720
	40,178,682	**40,597,510**
වෙනත් සේවා		
මහජන දැනුවත් කිරීමේ වියදම	24,965,878	7,358,321
වෙබ් අඩවිය නිර්මාණය කිරීම	200,000	180,000
විගණකාධිපති ගාස්තුව	1,233,099	1,781,293
සුභසාධන සහ මහජන සම්බන්ධතා	129,981	109,294
මල් සැරසිලි	620,000	732,100
පාරිභෝගික උපදේශන කොමිටි වියදම්	115,847	217,514
	27,264,805	**10,378,521**
14 ප්‍රාග්ධන භාණ්ඩ අළුත්වැඩියා සහ නඩත්තු වැයදම්		
වාහන නඩත්තු	1,063,273	700,541
කාර්යාල ගොඩනැගිලි	60,279	30,225
කාර්යාල උපකරණ සහ පරිගණක	1,705,836	870,091
ක්ෂය ගාස්තු	11,454,707	11,503,469
	14,284,095	13,104,325
මුළු මෙහෙයුම් වියදම්	**96,334,574**	**84,426,653**
15. මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	10,605	10,815
විදේශ විනිමය හුවමාරු කිරීමේ පාඩු	4,362	16,483
	14,967	**27,298**

Designed & Product by

CREATIVE4®
The Ultimate Imagination

Tel : 077 3 377495
E-mail : info@creative4.lk Web : www.creative4.lk